# ක්‍රිස්තු ධර්මය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2008 සිට ක්‍රියාත්මකයි)

11 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

නව සහශ්‍රයේදී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ පවතින යම් යම් ගැටළු නිරාකරණය කරගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ හා සමාජීය හා පුද්ගල දුර්වලතා මගහරවා ගැනීමේ අභිලාශයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේදී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේය. නමුදු වර්තමානයේදී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. මෙම පසුබෑමට හේතුව කිසිදු නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක්ම තීරණ ගනිමින් ඒ දේ පමණක්ම නැවත නැවත ඉදිරිපත් කිරීමේ හේතුවෙනි.

මෙම තත්ත්වය මගහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂය මාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ කුසලතා හා නිපුණතා වැඩි වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්යභාරයේ පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතුවේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුනට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු අපගේ පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මගපෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එබ ඔබට ඉගැන්වීමේදී මෙන්ම ශිෂ්‍යයන් ඇගයීමේදී උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙසම එය විදුහල්පතිවරුනට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිත සම්පත් වෙන්කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් ලෙස උපකාරී වනු නොඅනුමානය.

කෙසේ නමුදු අපගේ බලාපොරොත්තුව වන්නේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් තම නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින්ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීමය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුනට, හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගිවූ සියලු දෙනාටම මගේ කෘතඥතාවය පිළිගන්වමි.

**මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ**
*අධ්‍යක්ෂ ජනරාල්*
*ජාතික අධ්‍යාපන ආයතනය*

## සංදේශනය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසැල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතුය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ඔබ විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා අතින් සිදුවිය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බැවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශ භාවිතා කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

මෙහි හමුවන ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පංති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගැනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හී දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මකව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතුය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතුය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි කොට සංවිධානාත්මකව හා අංග සම්පූර්ණව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතුය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයකට ය. එම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මහ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස බොහෝ නව පාඩම් සකස් කරගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

මෙම නව පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැමවිටම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිටම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන අභ්‍යාසවල සිසුන් යොමු කිරීම ගැනද සැලකිලිමත් වන්න.

තවද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තවදුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එය සිසුන් ඇගයීම කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම ගැනද සැලකිලිමත් වන්න.

මෙමගින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම, එයටම ගැළපෙන ගුරු භූමිකාවක් හා පංතිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම අපේක්ෂා කරමි.

**විමල් සියඹලාගොඩ**
*සහකාර අධ්‍යක්ෂ ජනරාල්*
*(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)*
*ජාතික අධ්‍යාපන ආයතනය*

## උපදේශක මණ්ඩලය සහ ලේඛක මණ්ඩලය

උපදේශනය : **මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**විමල් සියඹලාගොඩ මහතා**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

අධ්‍යක්ෂණය : **ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
අධ්‍යක්ෂ - ආගම්

සම්බන්ධීකරණය : **ආචාර්ය ගරු ජයලත් බලගල්ල පියතුමා**

ලේඛක මණ්ඩලය :

- **ශාස්ත්‍රපති ගරු එස්. ඩී. සෙල්වන් දේවගැතිතුමා -** ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය
- **ශාස්ත්‍රවේදී හාසිනී ප්‍රනාන්දු මෙන්ඩිස් මහත්මිය** (විදුහල්පති 1), දින පාසල් සම්බන්ධීකරණ ලේකම් - ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
- **ශාස්ත්‍රපති ඩබ්ලිව්. එන්. මදාරා ප්‍රනාන්දු මෙනෙවිය**, ආචාරිනි මෙතෝදිස්ත විදුහල, කොළඹ 3
- **වානිජවේදී සුමුදිනි ප්‍රනාන්දු මහත්මිය,** ආචාරිනි නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය, මීගමුව

පිටකවරය සහ චිත්‍රය : ඩබ්ලිව්. එන්. මදාරා ප්‍රනාන්දු මෙනෙවිය

## කිතුනු උපදේශක මණ්ඩලය

- ගරු දේවධර්මාචාර්ය ජයසිරි ටී. පීරිස් දේවගැතිතුමා
  (සාමාන්‍ය ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය)

- ගරු ඩබ්ලිව් එබෙනෙසර් ජෝශප් දේවගැතිතුමා
  (මහානායක - ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව)

- ගරු ඒඩ්‍රියන් ඒරන් දේවගැතිතුමා
  කථිකාචාර්ය දේවධර්ම විදුහල, පිළිමතලාව

- ගරු නොයෙල් පී. ප්‍රනාන්දු දේවගැතිතුමා
  හිටපු මහානායක, මෙතෝදිස්ත සභාව

- ගරු දේවධර්මාචාර්ය ඒ. ඩබ්ලිව් ජෙබනේසන්
  විදුහල්පති, දේවධර්ම විදුහල, පිළිමතලාව

# පටුන

පෙරවදන
සංඥාපනය
ලේඛක මණ්ඩලය

## 1 කොටස

**විෂය නිර්දේශය**

11.1.1 හැඳින්වීම
11.1.2 විෂය අරමුණු
11.1.3. විෂය නිර්දේශය

පන්තියට අදාළ නිපුණතා
නිපුණතාව
නිපුණතා මට්ටම
විෂය අන්තර්ගතය
කාලච්ඡේද ගණන

11.1.4 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
11.1.5 පාසැල් ප්‍රතිපත්ති හා වැඩසටහන්
11.1.6 තක්සේරුව හා ඇගයීම

## 2 කොටස

**ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය**

11.2.1 හැඳින්වීම
11.2.2 ගුණාත්මක යෙදවුම්
11.2.3 ආදර්ශ ක්‍රියාකාරකම් සන්නතිය

## 3 කොටස

**තක්සේරුව හා ඇගයීම**

11.3.1 හැඳින්වීම
11.3.2 ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ
11.3.3 මූලාකෘති ප්‍රශ්න

## 1 කොටස

# විෂය නිර්දේශය


11.1.1 හැඳින්වීම

11.1.2 විෂය අරමුණු

11.1.3 විෂය නිර්දේශය

11.1.4 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

11.1.5 පාසැල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

11.1.6 තක්සේරුව හා ඇගයීම

## 11.1.1 විෂය හැඳින්වීම

දහමින් තොරව සදාචාර සම්පන්න සමාජයක් කිසිසේත්ම බලාපොරොත්තු විය නොහැකිය. කුඩා අවධියේ සිටම දරුවන්ට දහම පිළිබඳ නිසි අවබෝධයක් ලබාදීම අත්‍යාවශ්‍ය වන්නේ එබැවිනි. එපමණක් නොව දරුවන්ගේ එදිනෙදා ජීවිත තුළ දහම ජීවත් කරවිය යුතුය.

නිපුණතා පාදක කොට ගත් නව විෂය මාලාවේ පරමාර්ථය වන්නේ ද දහම දැනුමට පමණක් සීමා නොකොට නිවැරදි අවබෝධයෙන් යුතුව ජීවිත තුළ දහම ජීවත් කරවීමට මග පාදාදීමක් කිරීමය. නිපුණතාවයක් යනු නැවත නැවත සිදුකිරීම තුළින් ජීවිතයට ළඟා කරගන්නා යම්කිසි පුරුද්දකි. දැනුම, කුසලතා හා ආකල්ප එකිනෙකාට සම්බන්ධ කර ගැනීමෙන් මෙම ජීවිත පුරුද්ද ඇති කරගත හැකිය. 6 වැනි ශ්‍රේණියේ සිට 11 වැනි ශ්‍රේණිය දක්වා එකම තේමාවක් හෝ තේමා සමූහයක් පාදක කොට ලිහිල්ව ප්‍රකාශ කරන දැ යම්කිසි පරිණතභාවයක් කරා ගෙන එන පරිදි සකසා ඇති විෂය මාලාව තුළින් මෙම නිපුණතා ඇති කරගත හැකිය.

11 වැනි ශ්‍රේණියේ ඉගෙනුම අවසන් කිරීමත් සමඟම බොහෝ විට සිසුන්ගේ ආගමික අධ්‍යාපනය ද අවසන් වෙයි. මේ නිසාම 11 වැනි ශ්‍රේණියෙන් පිටවන ශිෂ්‍යයා සමාජ සංදර්භය තුළ පූර්ණ පෞරුෂත්වයක් ගොඩ නගා ගෙන සමාජය පවා වෙනස් කිරීමට හැකියාවන් ඇති අයකු විය යුතුය. 11 වැනි ශ්‍රේණියේ ක්‍රිස්තු ධර්මය පිළිබඳ විෂය මාලාව සකසා ඇත්තේ ඉහත දැක්වූ බලාපොරොත්තුව ඉටුකරගැනීමේ අභිලාYය පෙරදැරි කරගෙනය.

ගුරුවරුන් වූ ඔබෙන් සිදුවිය යුත්තේත්, අපගේ ඒකායන බලාපොරොත්තුව වන්නේත්, ජීවිතයේ එක් අදියරක් අවසන් කොට තවත් අදියරකට පිය එසවීමට බලා සිටින මේ සිසු දරුවන්ගේ ජීවිත තුළ දහම ජීවත්කරලීමට හැකිවන ආකාරයට ඔබගේ ඉගැන්වීමේ කාර්යය පූර්ණ කැපවීමෙන් හා වගකීමෙන් යුතුව ඉටුකිරීමයි.

## 11.1.2 විෂය අරමුණු

1. මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයා හට තම මැවුම්කරුවාණන් හඳුනා ගැනීමට සැලැස්වීම.

2. ක්‍රිස්තුස්වහන්සේගේ දූත කාර්යය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිණත කිතුනු ජීවිතයක් ගත කිරීමට සැලසීම.

3. දේව වචනය තුළින් පෝෂණය ලබා කිතුනු ජීවිතයට සමාජය තුළ සාක්ෂි දැරීමට සැලසීම.

4. මූලික කිතුනු සදාචාරය ගොඩනංවන බයිබල් ඉගැන්වීම තුළින් ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කරවීම.

5. ඇදහිල්ලෙන් හා යාච්ඤාවේ බලයෙන් ශක්තිමත්වී සමාජයේ ලුණු ලෙස ක්‍රියාකරමින් ලෝකයට ආලෝකයක් පැතිරීමට මහපෙන්වීම.

6. ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ප්‍රේමයෙහි වර්ධනය වී එම ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට සැලසීම.

7. තමා අවට ස්වාභාවික පරිසරය දෙවියන්වහන්සේගෙන් ලද තිලිණයක් සේ සලකා එය සුරැකීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කිරීම.

8. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගන අතර, කිතුනු අනන්‍යතාවය තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහිකරලීමට දායක කරවීම.

9. කිතුනු විශ්වාසය රැකගන්නා අතරම සෑම ආගමක්ම ගරු කිරීමට පුරුදු කරවීම.

10. ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කරවීම.

විෂයට අදාළ නිපුණතා :

1. මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයා තම මැවුම්කරුවාණන් හඳුනාගෙන උන්වහන්සේ කෙරෙහි වූ විශ්වාසය තහවුරු කර ගනියි.

2. ක්‍රිස්තුන්වහන්සේගේ දූත කාර්යය හා උත්ථානයේ අත්දැකීම පිළිගනිමින් පරිණත කිතුනු ජීවිතයක් ආදර්ශනය කරයි.

3. දේව වචනය හා ජනවන්දනාව තුළින් පෝෂණය ලබමින් කිතුනු ජීවිතයට සමාජය තුළ සාක්ෂි දරයි.

4. මූලික කිතුනු සදාචාරය ගොඩනංවන බයිබලයේ ඉගැන්වීම් තුළින් ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කරගනියි.

5. යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී සමාජය ආලෝකවත් කරන ආලෝකයක් සේ ක්‍රියා කරයි.

6. ක්‍රිස්තුන්වහන්සේගේ අසීමිත ප්‍රේමයෙහි වර්ධනය වී එම ප්‍රේමය අප සමාජය තුළ පතුරුවාලීමට සලසයි.

7. තමා අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයක් සේ සලකා එය සුරැකීමටත්, සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කර ගනියි.

8. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගන අතර, කිතුනු අනන්‍යතාවය තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහි කිරීමට දායක වෙයි.

## 11.1.3 විෂය නිර්දේශය

# ක්‍රිස්තු ධර්මය
# 11 වන ශ්‍රේණිය

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 මාංශවත්වූ ධර්මයාණන් පිළිබඳ සංසිද්ධිය තුළින් නව දැක්මකට හුරුවෙයි. | 1.1 මෙසියස් වහන්සේ අනුගමනය කරයි. | විමුක්ති අපේක්ෂාව මෙසියස්ව හන්සේ තුළින් මල්ඵල දැරීම.<br><br>යෙසායා 9:1-7<br>යෙසායා 11:1-9<br>ශු. මතෙව් 1:22-23<br>ශු. මතෙව් 16:13-20<br>ශු. ජොහන් 1:15-36<br>ශු ජොහන් 4:51<br>2 කොරින්ති 1:20 | 4 |
| | 1.2 යහපත් එඬේරා තුළින් පරිපූර්ණ නායකත්ව ලක්ෂණ චරිතායනය කරයි. | 2. යහපත් එඬේරා තුළින් නව නායකත්වයකට<br>එසකියෙල් 34<br>ගීතාවලිය 23<br>ශු. ජොහන් 10:7-19<br>ශු. ජොහන් 21:15-17<br>ක්‍රියා 20:15-23 | 2 |
| | 1.3 දුක්විඳීමට නිර්භීතව මුහුණ පායි. | 3. දුක්විඳීමට මුහුණ පෑම<br>ජෝබ් 1 හා 2 පරිච්ඡේද<br>නික්මයාම 3:7-9<br>ජෝබ් 31<br>ක්‍රියා 4:1-22<br>ජෝබ් 38-41 පරිච්ඡේද<br>ජෙරමියා 38<br>මාර්ක් 14-36<br>ලූක් 4:29-30<br>ශු. ජොහන් 18:23<br>මාර්ක් 8:4<br>එලිදරව් 1:9 | 2 |
| | 1.4 දුක්දරන සේවකයා ආදර්ශයට ගනියි. | 4. දුක්දරන සේවක ආදර්ශය<br>යෙසායා 52:13<br>යෙසායා 53:12 | 2 |
| 2.0 ශු. පාවුල් තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි. | 2.1 ශු පාවුල්තුමාගේ ක්‍රියාකාරී සේවයේ පසුබිම හඳුනාගෙන අනුගමනය කරයි. | 1. ක්‍රියාකාරී සේවයේ පසුබිම<br>ක්‍රියා 22:1-3<br>ක්‍රියා 23:6<br>ක්‍රියා 26:4-6<br>ගලාති 1:15-16<br>ගලාති 29:1-15 | 2 |
| | 2.2 සැබෑ ජීවිත පරිවර්තනයකට යොමුවෙයි | 2. ජීවිත පරිවර්තනය<br>ක්‍රියා 7:58<br>ක්‍රියා 8:1-3<br>ක්‍රියා 9 | 2 |
| | 2.3 ඵලදායි මෙහෙවරක් සඳහා හවුල් නායකත්වයක් අනුගමනය කරයි. | 3. හවුල් සේවය<br>ක්‍රියා 9:26-30<br>ක්‍රියා 13 හා 14 | 3 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්<br>ඡේද ගණන |
|---|---|---|---|
| | 2.4 නොපසුබට වීර්යයෙන් යුතුව අභියෝග වලට මු හුණදෙයි. | 4. දුක්පීඩා මධ්‍යයේ ඉදිරියට<br>ක්‍රියා 16:25-40<br>ක්‍රියා 17:1-15 | 3 |
| | 2.5 නිවැරදි දැක්මක් පදනම් කොටගෙන කිතුනු මෙහෙවරෙ හි යෙදෙයි. | 5. යහපත් කිතුනු සේවයකට හරි දැක්මක්<br>ක්‍රියා 19 | 3 |
| | 2.6 සිරගතවීමේදී පවා කිතුනු මෙහෙවර ඉදිරියට ගෙනයයි. | 6. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් දුක්විඳීම<br>ක්‍රියා 21:1-16, 27-37<br>ක්‍රියා 23:1-10<br>ක්‍රියා 24 හා 25:1-12<br>ක්‍රියා 25:13-27 | 3 |
| | 2.7 සේවයේ අභියෝගයන්ට අවස්ථාවෝචිත ප්‍රතික්‍රියා දක්වයි. | 7. සේවයේ අභියෝගයන්ට අවස්ථාවෝචිත ප්‍රතික්‍රියා<br>ක්‍රියා 27:1-4<br>ක්‍රියා 28:2-37<br>ක්‍රියා 25:9-12 | 2 |
| 3.0 ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සබැඳියාවකින් ජීවත්වෙයි. | 3.1 පෞද්ගලික මට්ටමේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වෙයි. | 1. ක්‍රිස්තුස්වහන්සේ හා පෞද්ගලික සබැඳියාව<br>1 කොරින්ති 13:11<br>1 කොරින්ති 6:12-20<br>කොලොස්සි 2:6-7<br>ගලාති 3:26<br>පිලිප්පි 2:16<br>ශු ජොහන් 3:1-15<br>මතෙව් 10:16 | 3 |
| | 3.2 ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමයේ බැඳීම් මත ස්ථිරසාර පවුල් ජීවිතයක් ගත කරයි. | 2. පවුල තුළ අන්‍යෝන්‍ය බැඳීම<br>උත්පත්ති 1:27-28<br>උත්පත්ති 2:15-24<br>රෝම 12:10-20<br>1 සාමුවෙල් 1,2 පරිච්ඡේද<br>එපීස 5:22<br>ක්‍රියා 15:16<br>කොලොස්සි 3:18 | 3 |
| | 3.3 සමාජ මට්ටමේදී ක්‍රිස්තුස්ව හන්සේ තුළ ජීවත්වෙයි. | 3. සමාජය තුළ කිතුනු පවුල<br>මතෙව් 25 පරිච්ඡේද<br>ක්‍රියා 4:32-35 | 2 |
| | 3.4 ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ ජීවිත රටාව තුළින් දේව රාජ්‍යත්වයේ වටිනාකම් බෙදාගනියි. | 4. විවිධ පරිසරයන්හී කිතුනු සාක්ෂිය<br>ක්‍රියා 14:8-18<br>මතෙව් 8:5-13<br>ක්‍රියා 17:16-34<br>ක්‍රියා 28:1-10<br>ක්‍රියා 12:20-26<br>ජොහන් 1:1-15 | 2 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 3.5 ක්‍රිස්තුස් වහන්සේ තුළ දිළිඳු කමට ප්‍රතිචාර දක්වයි. | 5. දරිද්‍රතාවය හමුවේ.<br>රෝම 15:26<br>ලූක් 12:13-21<br>ලූක් 16:14-31<br>ලූක් 18:18-36<br>ලූක් 19:1-10<br>2 කොරින්ති 8-1-2<br>ලූක් 6:20<br>ගලාති 2:10<br>මතෙව් 5:3<br>මතෙව් 22:1-14<br>මතෙව් 6:11 | 2 |
| | 3.6 ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වභාවික ව්‍යසනයන්ට මුහුණ දෙයි. | 6. ව්‍යසන මැදදී<br>ක්‍රියා 11:27-30 | 2 |
| | 3.7 ක්‍රිස්තුස්වහන්සේ තුළ හිංසනයට හා පීඩනයට මුහුණ දෙයි | 7. හිංසා පීඩා මැද<br>නික්මයාම 1,3, පරිච්ඡේද | 2 |
| 4.0 බහුවිධ සමාජයක එකමුතුව ජීවත්වීම | 4.1 ජුදෙව් සමාජයේ වටිනාකම් උකහාගෙන ජීවිතයට අනුගත කරගනී | 1. ජුදෙව් සමාජය තුළින් උකහා ගන්නා අගයයන් හා වටිනාකම්<br>උත්පත්ති 13:14<br>උත්පත්ති 12:03<br>උත්පත්ති 18<br>යෙසායා 49:23<br>ගීතාවලිය 117<br>1 රාජාවලිය 21<br>යෙරමියා 29:5-7<br>යෙසායා 19:23-25<br>යෙසායා 44:28<br>යෙසායා 45:1-4<br>ද්වීතිය කථාව 7:6-8 | 2 |
| | 4.2 මුල් කිතුනු සභාවේ වටිනාකම් උකහා ගෙන ජීවිතයට අනුගත කරයි | 2. මුල් සභාව තුළින් කිතුනු වටිනාකම්<br>ශු. ජොහන් 20:17<br>ක්‍රියා 2:42-47<br>ක්‍රියා 4:32-37<br>ක්‍රියා 4:12<br>ක්‍රියා 10:34-35<br>ක්‍රියා 14:12-17<br>ක්‍රියා 17:22-30<br>ක්‍රියා 5:1-11<br>රෝම 2:14-15<br>කොරින්ති 12:12-31<br>එලිදරව් 24:1 | |
| | 4.3 සාමකාමී සහජීවනය වැනි ය හපත් වටිනාකම් මත ජීවත් වෙයි. | 3. නූතන ලොව තුළ කිතුනුවා<br>ක්‍රියා 8:4-40, 10:1-23<br>රෝම 8:14-17, 20-22<br>මාර්ක් 15:38<br>ගලාති 3:28<br>රෝම 7:6,<br>රෝම 18:25<br>1 කොරින්ති 12:13<br>ගලාති 5:1-10<br>කොලොස්සි 3:11<br>කොලොස්සි 1:13 | |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච් ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 කිතුනු චරිතාකම් අනුව ජීවත්වෙයි. | 5.1 ක්‍රියාත්මක ප්‍රේමය මත ජීවත්වෙයි. | යාකොබ් 1:13<br>පිලිප්පි 2:1<br>එපීස 3:17-19<br>මාර්ක් 12:32-34<br>ලූක් 10:25-37<br>මතෙව් 19:16-25<br>ජොහන් 13:35<br>ජොහන් 4:6,<br>ජොහාන් 3:11-24<br>මතෙව් 25:31-41<br>මතෙව් 22:37-40 | 2 |
| | 5.2 යුක්තිය පදනම් කරගත් සාමයෙන් ජීවත්වෙයි | 2. සාමය<br>මතෙව් 5:9<br>2 සාමුවෙල් 18:29<br>1 රාජාවලිය 5:12<br>මිකා 4:1-5<br>යෙසායා 1:1-4<br>සෙකරියා 9:9-10 | 2 |
| | 5.3 විවිධත්වය තුළ ඒකීයත්ව ජීවිත ගත කරයි. | 3. විවිධත්වය තුළින් ඒකීයත්වය<br>ශු. ජොහන් 17:20-23<br>ක්‍රියා 4:32-35<br>1 කොරින්ති 12:27-30<br>එපීස 2:15-16<br>ගලාති 3:29<br>රෝම 12:1-8<br>කොරින්ති 12:12-31<br>එපීස 4:1-40<br>ජොහන් 17:20-23 | 2 |
| | 5.4 කමාවේ ජීවිත ගත කරයි. | 4. කමාවේ උදාරත්වය<br>ශු. මතෙව් 18:21-35<br>මාක් 3:29<br>මතෙව් 6:12, 18:23-25<br>ලූක් 15:11-31, 6:37<br>ලූක් 6:36-50<br>ලූක් 17:4<br>ජොහන් 8:1-11 | 2 |
| | 5.5 බලාපොරොත්තුවේ ජීවිතයක් ගත කරයි. | 5. නව බලාපොරොත්තුවක් කරා<br>1 පේදුරු 1:1-3<br>ගීතාවලිය 23:4<br>මාර්ක් 1:15<br>ලූක් 17:6<br>ජොහන් 11:17-26<br>1 තෙසලෝනික 4:13<br>රෝම 5:1-2<br>2 තෙසලෝනික 2:16<br>1 තිමෝති 1:3<br>1 තිමෝති 4:10 | 2 |

## 11.1.4 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපායන්

දහම පිළිබඳ දැනුම දහම ජීවත්වීම සඳහා අවශ්‍ය වුවද, දැනුමින් පමණක් දහම ජීවිතයට ඒකාබද්ධවීමක් සිදු නොවෙයි. ඒ සඳහා දහම ජීවිත අත්දැකීමක් බවට පත්කර ගත යුතු වෙයි. එහෙත් එය කළ හැකි වන්නේ පන්ති කාමරයේදී භාවිත වන ක්‍රමෝපායන්ට අමතරව, පන්ති කාමරයෙන් එහි විහිදෙන ක්‍රමෝපායන් ද භාවිතා කිරීමෙනී. එය සිදුකරන්නේ කෙසේද? නිදසුන් ලෙස ක්‍රමෝපායන් කීපයක් මෙසේ ඉදිරිපත් කළ හැකිය. මෙම ක්‍රමෝපායන් භාවිතයේදී පන්ති කාමරයේදී ඉගෙන ගන්නා දේ හා ක්‍රමෝපාය, සමාන්තර හා සමගාමීවීම ඉගෙන ගන්නා දේ ජීවිත අත්දැකීමක් මෙන්ම දැනුමෙහි වර්ධනය වීමට හේතුවනු ඇත.

- යාච්ඤා මෙහෙයක් සංවිධානය කොට එයට ක්‍රියාකාරී ලෙස සහභාගිවීම.
- මහ බ්‍රහස්පතින්දා, මහ සිකුරාදා, පාස්කු ඉරිදා, නත්තල වැනි ආගමික උත්සව වලට සහභාගිවීම
- සභාවේ දයා සේවාවන්ට සහභාගිවීම
- සමිති සමාගම්වලට බැඳී කටයුතු කිරීම
- වන්දනා ස්ථානවලට ගොස් ඒවාහි මෙහෙයනට සහභාගිවීම
- යාච්ඤා හා භාවනා මෙහෙයනට සහභාගිවීම
- නිවසේ කෙරෙන යාච්ඤා මෙහෙයනට සහභාගිවීම
- වැඩිහිටි නිවාස, ළමා නිවාස හා මහළු නිවාසවල ස්වේච්ඡාවෙන් සේවය කිරීම

- මෙවැනි ක්‍රමෝපායන් මගින් පන්ති කාමරයේදී ලබන දැනුම අත්දැකීමක් බවට පත්කොට ගෙන දහම හා ජීවිතය අතර මනා සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව ලැබෙනු ඇත. ඉහත නිදසුන් ලෙස යෝජිත ක්‍රමෝපායනට අමතරව වෙනත් විවිධ ක්‍රමෝපායන් වෙත ශිෂ්‍යයන් අවස්ථානුකූලව යොමු කරවීමට මෙම නව විෂය නිර්දේශය මගින් ගුරුවරයාට ඉඩ සලසා ඇත.

## 11.1.5 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

1. පාසල් වාරය තුළදී අවම වශයෙන් එක් වතාවක්වත් දේව නමස්කාර මෙහෙයකට පන්තියක් වශයෙන් සිසුන් සහභාගිකරවීම.

2. සිසුන්ගේ අධ්‍යාත්මික වර්ධනය සඳහා ගරු දේවගැතිතුමන්ලාගේ මගපෙන්වීම හැකි සැමවිටම ලබාගැනීම.

3. ඒ ඒ කාලවලට අදාල ජනවන්දනා පිළිවෙත් වලට ළමුන් හුරුකරවීම.

4. සාමූහික බව, සාධාරණත්වය, අන්මත ඉවසීම ඇතුළු ආගමික සංකල්ප වර්ධනය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාසල තුළ සංවිධානය කිරීම.

5. කිතුනු ශිෂ්‍ය හා ළමා සමිති සමාගම් ආරම්භ කොට පිරිපුන් කිතුනු දිවියක් ගතකිරීමට සිසුන් පුරුදු පුහුණු කිරීම.

6. සභාවේ සේවා සමිති සමාගම්වලට සිසුන් සහභාගි කිරීම සඳහා දෙමාපියන් දැනුවත් කිරීම.

## 11.1.6 තක්සේරුව හා අගැයීම

- සෑම පාඩමක් අවසානයේදීම ලිඛිත අභ්‍යාස සහ පැවරුම් මගින්
- වාර අවසානයේදී සහ වසර අවසානයේදී සිදුකරන විධිමත් පරීක්ෂණ මගින්
- කෙටිකාලීන ව්‍යාපෘති මගින්
- කියවීම, ලිවීම, සවන්දීම ඇසුරින් ආගමික දැනුම වාචිකව ඇගයීම
- ආගමික ක්‍රියාකාරකම්වල සහ පොදු යහපත සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන්වල යෙදෙන අන්දම නිරීක්ෂණය කිරීම මගින්
- සභාවේ සේවා සමිතිවලට බැඳී කරන සේවා මගින්
- පාසල තුළ පිහිටුවා ඇති ආගමික සමිති සමාගම්වලට බැඳී කරන සේවාව මගින්
- පන්තියේ නායකත්වය ගෙන වගකීම් භාරගැනීමේ රටාව නිරීක්ෂණය කිරීම මගින්
- 10, 11 ශ්‍රේණිවල පාඨමාලාව අවසානයේදී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන සාධන පරීක්ෂණ මගින්
- පාසල් පාදක ඇගයීම් ක්‍රමය මගින්

**2 කොටස**

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

11.2.1 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

11.2.2 ගුණාත්මක යෙදවුම්

11.2.3 ක්‍රියාකාරකම් සන්තතිය

1.1 මෙසියස්වහන්සේ අනුගමනය කරයි.
1.2 යහපත් එඬේරා තුළින් පරිපූර්ණ නායකත්ව ලක්ෂණ චරිතායනය කරයි.
1.3 දුක්විඳීමට නිර්භීතව මුහුණ පායි.
1.4 දුක්දරන සේවකයා ආදර්ශයට ගනියි.
1.5 ශු. පාවුල්තුමාගේ ක්‍රියාකාරී සේවයේ පසුබිම හඳුනාගෙන අනුගමනය කරයි.

2.1 ශු පාවුල්තුමාගේ ක්‍රියාකාරී සේවයේ පසුබිම හඳුනාගෙන අනුගමනය කරයි.
2.2 සැබෑ ජීවිත පරිවර්තනයට යොමුවෙයි.
2.3 ඵලදායි මෙහෙවරක් සඳහා හවුල් නායකත්වයක් අනුගමනය කරයි.
2.4 නොපසුබට වීර්යයෙන් යුතුව අභියෝග වලට මුහුණ දෙයි.
2.5 නිවැරදි දැක්මක් පදනම් කොටගෙන කිතුනු මෙහෙවරෙහි යෙදෙයි.
2.6 සිරගත වීමේදී පවා කිතුනු මෙහෙවර ඉදිරියට ගෙනයයි.
2.7 සේවයේ අභියෝගයන්ට අවස්ථාවෝචිත ප්‍රතික්‍රියා දක්වයි.

3.1 පෞද්ගලික මට්ටමේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වෙයි.
3.2 ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමයේ බැඳීම් මත ස්ථිරසාර පවුල් ජීවිතයක් ගතකරයි.
3.3 සමාජ මට්ටමේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වෙයි.
3.4 ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ ජීවිත රටාව තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් බෙදා ගනියි.
3.5 ක්‍රිස්තුස්වහන්සේ තුළ දිළිඳුකමට ප්‍රතිචාර දක්වයි.
3.6 ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වභාවික ව්‍යසනයන්ට මුහුණ දෙයි.
3.7 ක්‍රිස්තුස්වහන්සේ තුළ හිංසනයට හා පීඩනයට මුහුණ දෙයි.

4.1 ජුදෙව් සමාජයේ වටිනාකම් උකහාගෙන ජීවිතයට අනුගත කරගනියි.
4.2 මුල් කිතුනු සභාවේ වටිනාකම් උකහාගෙන ජීවිතයට අනුගත කරයි.
4.3 සාමකාමී සහජීවනය වැනි යහපත් වටිනාකම් මත ජීවත්වෙයි.

5.1 ක්‍රියාත්මක ප්‍රේමය මත ජීවත්වෙයි.
5.2 යුක්තිය පදනම් කරගත් සාමයෙන් ජීවත් වෙයි.
5.3 විවිධත්වය තුළ ඒකීයත්ව ජීවිත ගත කරයි.
5.4 කමාවේ ජීවිත ගත කරයි.
5.5 බලාපොරොත්තුවේ ජීවිතයක් ගත කරයි.

## 7.2.1 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේදී ගවේෂණය පදනම් කරගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකිවන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුලව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (Transmission Role) හා පසුකාලීනව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (Transaction Role) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. අධ්‍යාපනය හදාරා සමාජයට පිවිසෙන දරු දැරියන්ගේ චින්තන කුසලතා හා සමාජ කුසලතාවල ගුණාත්මක වර්ධනය සඳහා ක්‍රමවේද සංවර්ධනය විය යුතු බව පිළිගත යුතු කරුණකි.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සළකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කරගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස් වලට අමතරව සිසු -සිසු අන්තර් ක්‍රියාද පසුව ඇතිවීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා සෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේදී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකුම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (Resource Person) තත්ත්වයට ගුරුවරයා පත්වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටුවිය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොටගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (Transformation Role) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම් වල පළමුවන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (Engagement Step) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම් වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබාගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම/පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (Flash Card) වැනි උත්තේජක යොදා ගැනීම/ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය/දෙබස, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (Demonstrations) ඍජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කරගැනීම මුල් කොට ක්‍රියාකාරකම් වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (Exploration) සඳහා සිසුනට අවස්ථාව ලබාදීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කරගෙනය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකිවන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදුවේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතුව කණ්ඩායම සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම් වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබාගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමටද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතුය. සැඟවුණු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමිවේ.

ක්‍රියාකාරකම් 3වන පියවරේදී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහිදී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (Explantation) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේදී සොයා ගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (Elaboration) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබාදීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත් සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

## 11.2.2 ගුණාත්මක යෙදවුම්

- ශුද්ධවූ බයිබලය/නව ගිවිසුම
- 11 වැනි ශ්‍රේණියේ පෙළ පොත
- සිතියම්
  පාවුල්ගේ ධර්මදූත ගමන 1
  පාවුල්ගේ ධර්මදූත ගමන 2
  පාවුල්ගේ ධර්මදූත ගමන 3
  පාවුල් රෝමයට ගිය ගමන
- ඡායාරූප
  සුනාමි ව්‍යසන පින්තූර
  දිළිඳුන් පෙන්වන පින්තූර
  එඬේරෙකුගේ/යේසුතුමා එඬේරෙකු සේ ඇති පින්තූරය
  පාවුල්ගේ පින්තූරයක්
- දිනපතා පුවත්පත්
  හිංසනය පිළිබඳ දිනපතා පුවත්පත් ලිපි
  යුද්ධය සම්බන්ධ පුවත්පත් ලිපි
- ගීත
  නන්දා මාලිනීගේ ගීත - නිලම්බරේ සුදු පරෙවි රෑන් යන...............
  පෙම්ලොව දී දුටු ඔහුමද මේ ..........
  සනත් නන්දසිරිගේ ගීත - කැරකෙන රෝදේ පුංචි කරත්තේ ...............
- VCD පට
- පාවුල් තුමාගේ ධර්මදූත ගමන් හා සිරකරුවකු ලෙස රෝමයට යෑම (බයිබල් සමාගම- කොළඹ 3 ලබාගත හැක.)
- ශුද්ධ ලියවිලි පාඨ සහිත කාඩ්පත්
- සැණපත් - බයිබල් පාඨ ලියවුණු
- පරිගණක ආශ්‍රයෙන් නිර්මාණශීලී ඉදිරිපත් කිරීම (Computer Presentation)
- දුක් විඳින සේවකයා පිළිබඳ බයිබල් පාඨ
- මානව අයිතිවාසිකම් ප්‍රඥප්තිය
- මාකර් පෑන්, බ්‍රිස්ටල් බෝඩ්, A4 කොළ

## 11.2.3 ක්‍රියාකාරකම් සංතතිය

නිපුණතාව 1.0 : මාංශවත්වූ ධර්මයාණන් පිළිබඳ සංසිද්ධිය තුළින් නව දැක්මකට හුරුවෙයි.

නිපුණතා මට්ටම 1.1 : මෙසියස්වහන්සේ අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 1.1 : “බලාපොරොත්තුව තුළින් මෙසියස්වහන්සේ තුළ ක්‍රියාකාරී වෙමු .”

කාලය : මිනිත්තු 160

ගුණාත්මක යෙදවුම් : ශු බයිබලයේ යෙසායා 9:1-7, 11:1-9,
ශු මතෙව් 1:22-23, 16:13-20
ශු ජොහන් 1:15-36, 4:51
2 කොරින්ති 1:20

ඩිමයි කඩදාසි, මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1.1.1 :

- විමුක්තිය පිළිබඳව සිසුන්ගේ අදහස් ලබාගන්න.
- විමුක්තිය ලැබීම හෝ ලබාදීම පිළිබඳව ඔවුන් අසා ඇති කථා ඉදිරිපත් කිරීමට සලස්වන්න. විමුක්ති ගමන යනු වහල් බවින් මිදීම බව මතුකරමින් විවෘත සාකච්ඡාවක යෙදෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - වහල්කමේ සිට විමුක්තිය කරා ගමනක යෙදෙන බව (නොයෙකුත් ආකාරයේ වහල්කම් සමාජය තුළ දක්නට ලැබෙන බව. උදා: ලිංගික අපයෝජනය, ළමා මෙහෙවර).
> - මෙසියස් වහන්සේ තුළින් අන්ධකාරයේ සිටි සෙනඟ ආලෝකය අත්දුටු බව හා ආලෝකයට ගමන් ගත් බව. යෙසායා 9:1-7
> - යුක්තිය හා ධර්මිෂ්ටකම තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් ඉස්මතු වන බව. යෙසායා 11:1-9
> - දෙවියන්වහන්සේ අප සමඟ බව. (එම්මානුවෙල් - මතෙව් 1:22-23)
> - පේදුරුතුමා හා ජොහන්තුමා, ජේසුස්වහන්සේ -මෙසියස් වහන්සේ බවට අත්දුටු බව. මතෙව් 16:13-20
> - දෙවියන්වහන්සේගේ බැටළුපෝතකයාණෝ. ජොහන් 1:15-36.

පියවර 1.1.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් 5කට වෙන් කරන්න.
- කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ශු ලියවිලි පාඨ, ඩිමයි කඩදාසි සහ මාකර් පෑන් බෙදා දෙන්න.
- කාර්ය පවරා කණ්ඩායම් ගවේෂණයේ යෙදෙන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 1.1.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න. (නාට්‍ය, ගීත, චිත්‍ර මගින්)
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - ඉශ්‍රායෙල් ඉතිහාසයේ මෙසියානික බලාපොරොත්තුව වූ බව.
> - මෙසියස්වහන්සේ පූර්ණත්වය ලබාදෙමින් පාපයේ ව හල් කමින් මිදීම ලබාදුන් බව.
> - මෙසියානික බලාපොරොත්තු ක්‍රිස්තුස්වහන්සේ හා සමඟ එක්ව යන බව.
> - ජේසුස්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ව මෙසියානික අදහස් වලින් ඔබ්බට ගෙන ගිය බව. උදා: පාද සේදීම. ඒ තුළින් සේවයේ ආත්මය ප්‍රකාශ කළ බව.
> - මෙසියානු බලාපොරොත්තුව තුළ මෙසියස්ව හන්සේගේ ක්‍රියා හා සිතුවිලි සම්පූර්ණ නිදහස හා යුක්තිය මුළු මිනිස් වර්ගය හා බෙදාගැනීමට අපට ආරාධනා කරන බව.
> - අපගේ ජීවිත වල හා සමාජයේ ඇති වහල් භාවයෙන් නිදහස් විය යුතු බව.
> - යුක්තිය හා ධර්මිෂ්ටකම තුළින් සාම රාජ්‍යය උදාවන බව.
> - වහල් භාවයෙන් නිදහස්වීම සඳහා දේව කරුණාව අවශ්‍ය බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ඉශ්‍රායෙල්වරුන් තුළ මෙසියානික බලාපොරොත්තු පැවති බව පැහැදිලි කරයි.
- මෙසියස්වහන්සේ වන ජේසුස් වහන්සේ තුළින් සම්පූර්ණ නිදහස ලැබිය හැකි බව පැහැදිලි කරයි.
- ජේසුස් වහන්සේ පසුපස යන විට විමුක්ති අරගලය තුළ ලැබෙන අභියෝග 5ක් නම් කරයි.
- වර්තමාන සමාජය තුළ නිදහස යන්න අර්ථ නිරූපණය කරයි.
- සමාජයේ දක්නට ලැබෙන වහල්කම් නම් කරයි.
- පාපයේ වහල්කමින් මිදිය යුතු බව තීරණය කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

- මිනිස් ජීවිතවල දක්නට ලැබෙන වහල්කම් හඳුනාගන්න.
- වහල්කමින් නිදහස් වීමට කළ යුතු දේ සටහන් කරන්න.
- ජේසුස් වහන්සේ තුළින් වහල්කමින් මිදීමේ අවස්ථාවක් රංගන ගත කරන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 2 පිළිබඳව සියලු දෙනාම සැළකිලිමත් වන්න.
- සාකච්ඡා පිළිබඳ සැළකිලිමත් වන්න.
- ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න.

- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 2 පිළිබඳව සියලු දෙනාම සැළකිලිමත් වන්න.
- සාකච්ඡා පිළිබඳ සැළකිලිමත් වන්න.
- ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න.


ඇමුණුම 1.1.1

- ඉශ්‍රායෙල් වරුන්ට මෙසියානික බලාපොරොත්තු වැදගත් විය.
- තමන්ව වහල්කමින් නිදහස් කරගැනීමට හා මුලු ලොව පාලනය කිරීමට පැමිණෙන මෙසියස්වහන්සේ ඔව්හු විශ්වාස කළහ.
- මේ අනුව දිවැසිවරුන්, රජුන්, පූජකවරුන් මෙසියස් ලෙස සැලකූ බව පැහැදිලිය.
- මෙසියානික සංකල්පය ජේසු හා සමඟ රැඳී පවතී.
- ජේසුස්වහන්සේ ඊට වඩා වෙනස්වූ බව ක්‍රියාවෙන් හා සිතුවිලි වලින් පැහැදිලි වේ.
- සෙලට් වරු, පරිසිවරු වැනි අය ජේසුස් වහන්සේට විරුද්ධවූයේ එබැවිනි.
- මේ නිසා ජේසුස්වහන්සේගේ මෙසියානික ක්‍රියා හා සිතුවිලි නිවැරදි වන අතර අද සමාජයට අදාළවේ.
- මෙසියානික සිතුවිලි වලට අනුව ජීවත්වන විට පූර්ණ විමුක්තිය ලැබේ.
- මෙසියානික සිතුවිලි මනුෂ්‍යාත්වය ගොඩනැගීමට, මානව සාරධර්ම පෝෂණය කිරීමට, දේව රාජ්‍ය ලබාගැනීමට, උදව් වේ.

ඇමුණුම 1.1.2

- මෙසියානික සාරධර්ම පැහැදිලි කරන්න.
- අද සමාජයේ වහල්කම් හඳුනාගෙන ඉන් මිදීමට ගත යුතු පියවර ලියන්න.
- ජේසුස්වහන්සේ බලාපොරොත්තු වූ මෙසියස් වහන්සේට වඩා වෙනස් කෙනෙකු ලෙස ජීවත් වූයේ කෙසේද?
- ඉශ්‍රායෙල්වරුන්ගේ මෙසියානික සංකල්පය අපේ මෙසියස් සංකල්පයෙන් වෙනස් වන්නේ කෙසේද?

නිපුණතාව 1.0 : මාංශවත්වූ ධර්මයාණන් පිළිබඳ සංසිද්ධිය තුළින් නව දැක්මකට හුරුවෙයි.

නිපුණතා මට්ටම 1.2 : යහපත් එඬේරා තුළින් පරිපූර්ණ නායකත්ව ලක්ෂණ චරිතායනය කරයි.

ක්‍රියාකාරකම 1.2 : "ජේසුස් වහන්සේ නම් එඬේරාගේ නායකත්ව ලක්ෂණ තුළින් නව නායකත්වයකට එළඹෙමු".

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ශු බයිබලයේ එසකියෙල් 34
- ගීතාවලිය 23
- ශු ජොහන් 10:7,19, 21:15-17,
- ක්‍රියා 20:15-23

ඇමුණුම 1.2.1 හා ඇමුණුම 1.2.2

- කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පිටපත් 5ක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1.2.1 :

- ලෝක ඉතිහාසයේ යහපත් නායකයින් ලෙස ක්‍රියා කළ අයගේ ඡායාරූප පෙන්වමින් සාකච්ඡාව අරඹන්න. (උදා: ශ්‍රී නේරු, මහත්මා ගාන්ධි, මාර්ටින් ලූතර්, ඉව්ලින් කානි, මියුරියල් හඩ්සන්, තෙරේසා මව්තුමිය, ඔස්කා රොමේරෝ රදගුරු)
- යහපත් එඬේරා පිළිබඳ ඔබට සිතෙන දේ ඉදිරිපත් කර පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

- ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ එඬේරුන් සිටි බව. (යහපත් සහ අයහපත්) එසකියෙල් 34:11-19, 1-10
- දෙවිඳුන් එඬේරා බව. - ගීතාවලිය 23
- ජේසුස්වහන්සේ එඬේරා බව. - ජොහන් 10:7-19
- යහපත් එඬේරා මෙන් ක්‍රියාකිරීමේ සැබෑ ගෝලත්වය තිබිය යුතු බව.
- ශු පාවුල් තුමා තුළ සැබෑ ගෝලත්වය වූ බව. - ක්‍රියා 20:15-23
- යහපත් එඬේර ගුණාංග අප පූර්ණ විමුක්තියට ළඟා කරන බැවින් යහපත් එඬේරුන් ලෙස ජීවත්විය යුතු බව.

පියවර 1.2.2 :

- පන්තිය කණ්ඩායම් 4කට බෙදන්න.
- ඇමුණුම බෙදා දෙන්න.
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්යය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම්

පියවර 1.2.3 :

- යහපත් නායකත්ව ලක්ෂණ ලියා දක්වන්න.
- යහපත් එඬේරා පිළිබඳ බයිබලීය අදහස් බෙදා ගන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - ඉශ්‍රායෙල් ඉතිහාසයේ අය යහපත් එඬේරුන් මෙන් ක්‍රියාකළ බව.
> - දෙවිඳුන්, ජේසුස්වහන්සේ හා ගෝලයින් තුළින් නායකත්වයේ යහපත් ගුණාංග ඉගෙන ගත හැකි බව.
> - විවිධ අභියෝගයන්ට මුහුණ පාමින්, යහපත් නායකත්ව ලක්ෂණ වලින් යුතු අය අප අතර සිටින බව.
> - සැබෑ නායකත්ව ගුණාංග මත යහපත් එඬේරුන් මෙන් ජීවත්වන විට මහත් අභියෝගවලට මුහුණ පෑ යුතු බව.
> - අප ජීවත්වන ලෝකය යහපත් ලෝකයක් ලෙස වෙනස්කිරීම සඳහා සැබෑ ගෝලත්වය තුළින් පෞද්ගලිකව හා සාමූහිකව දෙවිඳුන් අප කැඳවන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- යහපත් එඬේරාගේ නායකත්වය පිළිබඳ අදහස් ලියා දක්වයි.
- යහපත් එඬේරා වන ජේසුස්වහන්සේගේ නායකත්වය පිළිබඳ අදහස් ලියා දක්වයි.
- අප ජීවත්වන සමාජ සංදර්භය තුළ පූර්ණ විමුක්තිය සඳහා අදාළ වන නායකත්ව ලක්ෂණ පැහැදිලි කරයි.
- වර්තමාන සමාජයේ සිටින යහපත් නායකයින් හඳුනාගෙන විස්තර කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඇමුණුම 2 පිළිබඳව යොමුවන්න.
- කණ්ඩායම් සාකච්ඡාවල යෙදී ක්‍රියාකාරී වන්න.
- ඔබේ වාර්තාව පංතියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.2.1

- ඉශ්‍රායෙල් ඉතිහාසයේ යහපත් එඬේරුන් යහපත් නායකත්වයක් දුන් නිසා සමාජය යහපත් වූ බවත් අයහපත් එඬේරුන් නිසා අයහපත් වූ බවත් කිව හැකිය.
- බොහෝ අය දෙවිඳුන් යහපත් එඬේරා ලෙස දුටුවෝය. ඉශ්‍රායෙල්වරුන් ගෙන් වැඩි දෙනෙකු එඬේරුන් වූ අතර, ඒ නිසා ඒ අත්දැකීම් ඇසුරින් දෙවිඳුන් ඔවුන් රැකබලාගත් ආකාරය ඔව්හු අත්දුටහ.
- දෙවිඳුන් යහපත් එඬේරා වශයෙන් ඉශ්‍රායෙල්වරුන් පමණක් නොව අන් සියලුදෙනා පිළිගනිති.
- අද කිතුනුවෝ ජේසුස්වහන්සේ යහපත් එඬේරා වශයෙන් සළකන අතර උන්වහන්සේ අද ජීවිතය පවා පුදන බව විශ්වාස කරති. එසේම ජේසු ගෝලයෝ ද යහපත් එඬේරුන් ලෙස ජීවත් වූහ.
- එඬේරුන් බැටළුවන්ගේ වර්ධනයද ආරක්ෂාවද සලසන අය වශයෙන් ක්‍රියා කරන අතර යහපත් නායකයෝද ජනතාවගේ පැවැත්ම, වර්ධනය හා අනාගතය සරු කිරීම සඳහා වෙහෙසෙති. යහපත් එඬේරා අනුගමනය කිරීමෙන් පමණක් යහපත් ක්‍රියාවල යෙදිය හැකිය.

ඇමුණුම 1.2.2

1. පින්තූර, කථා, ඓතිහාසික වාර්තා රැස්කරන්න.
2. යහපත් නායකයින්ගේ වටිනාකම් ලැයිස්තු ගත කරන්න.
3. යහපත් නායකයෙකු මුහුණපාන අභියෝග 5ක් ලියා දක්වන්න.

නිපුණතාව 1.0 : මාංගවත්වූ ධර්මයාණන් පිළිබඳ සංසිද්ධිය තුළින් නව දැක්මකට හුරුවෙයි.

නිපුණතා මට්ටම 1.3 : දුක් විඳීමට නිර්භීතව මුහුණ පායි.

ක්‍රියාකාරකම 1.3 : "සැබෑ ගෝලයින් මෙන් ජීවත් වෙමින් දුක් විඳීමට නිර්භීතව මුහුණ දෙමු. "

කාලය : මිනිත්තු 80යි

ගුණාත්මක යෙදවුම් :

- ශු. බයිබලයේ ජෝබ් 1, 2 පරිච්ඡේද
  ජෝබ් 31 පරිච්ඡේදය
  ජෝබ් 38-41 දක්වා පරිච්ඡේද
  නික්මයාම 3:7-9
  ජෙරමියා 20:7-18
  ජෙරමියා 38
  මාර්ක් 14:36
  ලූක් 4:29-30
  ශු. ජොහන් 18:23
  ක්‍රියා 4:1-22
  එළිදරව් 1:9
  ශු. මාර්ක් 8:4

- ඇමුණුම 1.3.1ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පිටපත්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1.3.1 :

- දුක් විඳීම පිළිබඳ තමන් සිතන ආකාරය කෙබඳුදැයි සිසුන්ගෙන් විමසන්න.
- මිනිසෙකු වශයෙන් දුක් විඳීමේදී ඇතිවන ස්වභාවයන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

- ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ ජනතාව දුකට වේදනාවට මුහුණ පෑ බව. (නික්මයාම 3:7-9, ජෝබ් 1,2, ජෝබ් 42:7-16, ජෝබ් 31, ජෙරමියා 20:7-18)
- ජේසුස් වහන්සේ දුක් වින්ද බව. (ශු. ලූක් 4:29-30, ශු.ජොහන් 18:23, ශු මාර්ක් 8:34)
- ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් දුක් වින්ද බව. (ක්‍රියා 4:1-22, එළිදරව් 1:9)
- මෑත ඉතිහාසයේ කිතුනුවන් දුක් වින්ද බව. - මාටින් ලූතර් කිං, මයිකල් රුද්රිගු, තෙරේසා මව් තුමිය.
- වර්තමාන සමාජයේ අප දුක් විඳින බව.

පියවර 1.3.2 :

- පන්තිය කණ්ඩායම් වලට බෙදන්න.
- කණ්ඩායම් වලට ගවේෂණ පත්‍රිකා ලබාදෙන්න.
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වයන් පරීක්ෂා කොට සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 1.3.3 :

- දුක් විඳීමේ විවිධ අවස්ථා විවිධ කෝණයන්ගෙන් ඉදිරිපත් කරන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- දුක් විඳීමේ විවිධ අවස්ථා ඇති බව .
  1. පෞද්ගලික දුක්විඳීම්
  2. සාමූහික දුක්විඳීම්
  3. ස්වාභාවික ආපදා නිසා දුක්විඳීම්
  4. අහිංසකයන්ට නිරපරාදේ විඳින්ට වන දුක් විඳීම්
  5. ස්වේච්ඡාවෙන් දුක් විඳීම්
- දුක් විඳීම අභිරහසක් බව. (ජෝබ් 38:41)
- දෙවියන්වහන්සේගේ රාජ්‍යත්වය ප්‍රකාශ කිරීම හා ඒ තුළ ක්‍රියාකිරීම නිසා දිවැසිවරුන් දුක් වින්ද බව. (ජෙරමියා 38, ශු මාර්ක් 6:14-29)
- දෙවියන්වහන්සේගේ රාජ්‍යත්වය සඳහා කටයුතු කිරීමේදී දුක් විඳීම මිස වෙනත් විකල්පයක් නොමැතිනම් දුක් විඳීමට සිදුවන බව - ශු. මාර්ක් 14:36

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පෞද්ගලික දුක් විඳීම හා සාමූහික දුක් විඳීම සංසන්දනය කරයි.
- වර්තමාන සන්දර්භය තුළ අහිංසකයන්ට දුක් විඳීමට සිදුවන අවස්ථා හඳුනාගෙන ලියා දක්වයි.
- ආපදාවන්ට මුහුණ පෑ අයට කණ්ඩායම් වශයෙන් උදව් කරයි.
- දුක් විඳීම මුළිනුපුටා දැක්වීම පිළිබඳ භූමිකා රංගනයක යෙදෙයි. (කණ්ඩායම් වශයෙන්)

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඇමුණුම 2 පිළිබඳව යොමුවන්න.
- කණ්ඩායම් සාකච්ඡාවල යෙදී ක්‍රියාකාරී වන්න.
- ඔබේ වාර්තාව පංතියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.3.1

- දුක් විඳීමට මුහුණ පෑම මිනිස් ජීවිතයේ වැදගත් දෙයක් බවට පත්වී ඇති අතර දුක් විඳීමේ විවිධ ස්වරූපයන් ඇත. දුක්විඳීම තුළින් පූර්ණ විමුක්තිය කරා ගමන් කිරීමට හැකිවේ.
- දෙවියන්වහන්සේගේ රාජ්‍යත්වය සඳහා යන ගමනේදී විවිධ බාධක නිසා දුක් විඳීමෙන් බැහැර විය නොහැකිය. ඉශ්‍රායෙල් ඉතිහාසය තුළින්, ජේසුස්වහන්සේගේ ජීවිතය තුළින් හා උන්වහන්සේගේ ගෝලයින්ගේ ජීවිත තුළින්ද මෙය දකින්ට ලැබේ. වර්තමාන සන්දර්භය තුළ සැබෑ ගෝලත්වයක් දැරීමේදී විවිධ අභියෝගයන්ට මුහුණ පෑමට හා දුක් විඳීමට සිදුවේ.
- දුක් විඳීම අභිරහසකි. එබැවින් එය සම්පූර්ණයෙන් අවබෝධ කර ගත නොහැකිය. දෙවියන්වහන්සේගේ රාජ්‍යත්වය සඳහා කටයුතු කිරීමේදී එය කළ යුතු වන්නේ මාංශවත්වූ ජේසුස් ක්‍රිස්තුස්වහන්ගේ ජීවිතය තුළිනි. එබැවින් අප පෞද්ගලිකව හා සාමූහිකව දුක් විඳින විට, දුක් විඳින අයට සැලකිය යුතු වන්නේ බලාපොරොත්තුවක් ඔවුන් තුළ ජනිත වන අයුරිනි.

නිදසුන් : දරු ප්‍රසූතියකින් පසු දරුවා ලැබීමේ බලාපොරොත්තුව

ඇමුණුම 1.3.2

- සැබෑ ගෝලත්වය දැරූ අය දුක් වේදනාවන්ට මුහුණ පෑ අන්දම ලියා දක්වන්න.
- අපගේ ජීවිත වල මුහුණ පෑමට සිදුවන දුක් වේදනාවන්ගෙන් පලා නොගොස් ජීවිතයට මුහුණ දිය යුතු බව තීරණය කරමින් එවැනි අවස්ථාවකදී ඔබ ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරන්න. (ජීවිත විනාශ කර නොගෙන)
- දුක් විඳීම මුලිනුපුටා දැක්වීමට කළ යුත්තේ කුමක්දැයි සැකෙවින් දක්වන්න.
- සමාජය දුක් වේදනාවන්ගෙන් ගළවා ගෙන යහපත් ජීවිත ගොඩනැගීමට කටයුතු කළ අය හඳුනා ගන්න. (උදා: ඩෙස්මන් ටුටු)

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | මාංශවත්වූ ධර්මයාණන් තුළින් නව දැක්මකට හුරු වෙයි. |
| නිපුණතා මට්ටම 1.4 | : | "දුක් දරන සේවකයා ආදර්ශයට ගනියි". |
| ක්‍රියාකාරකම 1.4 | : | "දුක් දරන සේවක ආදර්ශය අනුගමනයට පෙළඹෙමු." (ජේසුස්වහන්සේ) |
| කාලය | : | විනාඩි 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ඩිමයි කොළ<br>• මාකර් පෑන්<br>• කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකා<br>• ඇමුණුම 1:4:1 හා 1:4:2 |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය | : | බයිබල් පද. යෙසායා 42:1-4, 52:13- 53:12, මාර්ක් 10:45, මතෙව් 13:53-58 |

ක්‍රියාවලිය 1.4.1 :

- බයිබලයේ දැක්වෙන දුක් විඳින සේවකයා පිළිබඳ අදහස් බෙදා ගැනීමට සිසුන් යොමු කරවන්න. (යෙසායා 41:8-13)
- දුක් විඳින සේවකයා තුළ ඇති පූජා වීමට ඇති කැමැත්ත පැහැදිළි කිරීමට අවස්ථාවක් දෙන්න.
- ඇමුණුම 1:4:1 කියවන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - දුක් විඳින සේවකයා තුළින් යහපත් ගුණාංග දැකිය හැකි බව. උදා යෙසායා 49:1-7. යෙසායා 42:1-9, 52:13-53:12, 50:4-9 (මෙම ගුණාංග හමුවන්නේ යෙසායා දිවැසිවරයාගේ පොතෙනී).
> - දුක් විඳින සේවකයා අනුගමනය කරන විට අපටද විවිධාකාර අභියෝග වලට මුහුණ දීමට සිදුවන බව. උදා ජේසුස්වහන්සේ, ස්නාවක ජොහන්, පාවුල්, පේදුරු, ස්තේපන්
> - වර්තමාන සමාජය තුළ පවා විවිධ දුක් විඳින සේවකයන් දැකිය හැකි බව.
> - පෞද්ගලිකව හා සාමූහිකව, දුක් විඳින සේවකයාගේ භූමිකාව අපටද රඟ දැක්විය හැකි බව.

පියවර 1.4.2 :

- සුදුසු පරිදි පංතිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 1:4:2 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්, ශුද්ධ බයිබලයේ පාඨ හා ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 1.4.3 :

- වර්තමාන නායකයන්ගේ ගුණාංග හා අතීතයේදී බයිබලයේ දුක් විඳි සේවකයන්ගේ ගුණාංග සංසන්දනය කර ඩිමයි කඩදාසියේ ලියා එය සමස්ත පංතියට ඉදිරිපත් කරන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - දුක් විඳින සේවකයාගේ ගුණාංග ඉශ්‍රායෙල්හී ඉතිරි වූවන් (remnent) තුළින් සෙසු අයට යහපත් ජීවිතයක් ගෙන දීමට උදව් වූ බව. (යෙසායා 11:1)
> - දුක් විඳින සේවකයාගේ ගුණාංග සියල්ල ජේසුස්ව හන්සේගේ ජීවිතය තුළ දැකිය හැකි බව. (මාර්ක් 10:45)
> - දුක් විඳින සේවකයා වන ජේසුස්වහන්සේ දෙවියන්ව හන්සේගේ රාජ්‍ය සඳහා ආත්මාර්ථයෙන් තොරව තම ජීවිතය පවා පිදීමට සූදානමින් සිටි බව. (මාර්ක් 8:31-38)
> - පෞද්ගලිකව හා සමූහයක් ලෙස ජීවත්ව සිටියදී, තම ඥාතීන්ගෙන් පවා ප්‍රතික්ෂේපයට ලක්වීමට පවා සූදානම් විය යුතු බව. උදා: මතෙව් 13:53-58
> - වර්තමාන සංදර්භය තුළ ජේසුස්වහන්සේ මෙන් දුක් විඳින සේවකයෙකු ලෙස ජීවත්වීමට දේව කැඳවීම අපටද ඇති බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- බයිබලය තුළ සඳහන් දුක් විඳින සේවකයාගේ හොඳම ආකෘතිය ජේසුස්වහන්සේ බව පෙන්වීමට චිත්‍රයක්, නිසදැසක් හෝ කවියක් සකස් කරයි.
- වර්තමාන සමාජයේ දුක් විඳින සේවකයා පිළිබඳ නාට්‍ය පිටපතක් සකස් කරයි.
- අද පටන් අන් අය හා සාමූහිකව දුක් විඳින සේවකයකු ලෙස ක්‍රියා කිරීමට තීරණය කරයි.
- අද සමාජයේ ජීවත්වන දුක් විඳින සේවකයන් පිළිබඳ තොරතුරු, එක්රැස් කර පොත් පිංචක් සකස් කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

- ඇමුණුම 1.4.1 හා 1.4.2 පිළිබඳව යොමු වන්න.
- කණ්ඩායම් සාකච්ඡාවල ඉදිරිපත් වූ කරුණු ගොණු කරන්න.
- සාකච්ඡා කළ කරුණු සටහන් කර ගන්න.
- ඉහත සූදානම් කළ කරුණු පංති කාමරයේ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරන්න.

ඇමුණුම 1.4.1 :

- දුක් විඳින සේවකයා ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ විශේෂයෙන් යෙසායාගේ කාලය තුළ වැදගත් විය. දුක් විඳින සේවකයන් ඉශ්‍රායෙල් සෙනඟගේ ඉතුරු වන සුළු පිරිසක් විය (යෙසායා 11:1). මේ පිරිසගේ භූමිකාව වූයේ බලාපොරොත්තුව හා සැනසීම ලබාදීමය.

- ජේසුස්වහන්සේ දුක් විඳින සේවකයකු ලෙස ක්‍රියා කළ සේක. එතුමාණන්ගේ ගුණාංග හා සාරධර්ම සියල්ල දුක් විඳින සේවකයාගේ ආකෘතිය අනුව විය. එතුමා ඉගැන්වීම් වලින් පමණක් නොව ක්‍රියාවන් හා ජීවන රටාවන් තුළින්ද දුක් විඳින සේවකයා ලෙස ක්‍රියා කළසේක.

- ජේසුතුමාගේ ගෝලයෝද දුක් විඳින සේවකයන් ලෙස ක්‍රියා කළහ. වර්තමාන සංදර්භය තුළ පවා දුක් විඳින සේවකයන් දැකිය හැක. පූර්ණ විමුක්තිය සඳහා කටයුතු කරන්නෝ ක්‍රියා කරන්නේ මාංශවත්වූ ජේසුස්වහන්සේ අනුගමනය කරමින් හා සැබෑ ගෝලයන් වන දුක් විඳින සේවකයන් අනුගමනය කරමිනි. වර්තමාන සමාජය තුළ දුෂ්ට වූ ජනතාව මේ පිරිසෙහි ක්‍රියාකාරිත්වයට හා ඔවුන්ගේ පැවැත්මට හිංසා පීඩා කරති. මේ නිසා මේ සමාජයේ ඔවුනට දුක් විඳීම සිදුවීම වැළැක්විය නොහැක. මේ ආකාරයට දුක් විඳින සේවකයන් විවිධ අභියෝග වලට මුහුණ දෙනු ලබන නමුත් ඔවුනට දේව කරුණාව හා මග පෙන්වීම ලැබේ. මේ දුක් විඳින සේවකයන් කැඳවන්නේ සෙසු අය මෙන් අවි ගැනීමට නොව අවි පසෙක තබා දේව රාජ්‍යය අනුගමනය කිරීමටය.

ඇමුණුම 1.4.2

- දුක් විඳින සේවකයාගේ ගුණාංග සඳහන් කරන්න.
- බයිබලයේ දුක් විඳින සේවකයන් ලැයිස්තු ගත කරන්න.
- දුක් විඳින සේවකයාට මුහුණ දීමට සිදුවන අභියෝග 5ක් දක්වන්න.
- "ජේසුස්වහන්සේ වෙනුවෙන් දුක් විඳීමට ඉතිරි වූ පිරිස දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෝය."

මෙය මාංශවත්වූ ක්‍රිස්තුස් ස්වාමින්වහන්සේගේ චින්තනය අනුව විස්තර කරන්න.

නිපුණතාව 2.0 : ශු පාවුල් තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි.

නිපුණතා මට්ටම 2.1 : ශු පාවුල් තුමාගේ ක්‍රියාකාරී සේවයේ පසුබිම හඳුනාගෙන අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 2.1 : "ශු පාවුල් තුමාගේ ක්‍රියාකාරී සේවය අනුගමනය කරමු".

කාලය : කාලය විනාඩි 80යි.

ගුණාත්මක යෙදවුම් : බයිබල් පද ලියන ලද කාඩ්පත් ශු පාවුල් තුමාගේ පින්තූරයක්, ඩිමයි කඩදාසි, මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.1.1 :

- ඇමුණුම 1 සිසුන්ට අවබෝධ වන ලෙස කියවන්න.
- ශු පාවුල් තුමා ගැන දැනගැනීමට එතුමාගේ පසුබිම හඳුනාගත යුතු බව සිසුන්ට පැහැදිලි කරන්න.
- පාවුල් තුමාගේ පසුබිම පිළිබඳ කරුණු බෙදා ගැනීමට සලස්වන්න.
- ක්‍රියාකාරී සේවය යන්න අර්ථකථනය කරන්න. නැතහොත් ක්‍රියාකාරී සේවය හා බැඳෙන පෝස්ටරයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- ශු පාවුල් තුමාගේ පසුබිමට වැදගත් කමක් දෙමින් පහත සඳහන් කරුණු ආශ්‍රිතව සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ක්‍රියාකාරී සේවය සඳහා කැඳවීම ශු පාවුල් තුමාට ලැබුනේ එතුමා මව්කුසේ සිටියදී බව. (ගලාති 1:15)
> - ශු පාවුල් තුමා හෙබ්‍රෙව් භාෂාව දැනසිටි බව. (ක්‍රියා 22:1-2)
> - ශු පාවුල් තුමා ජුදෙව් ජනවර්ගයෙන් පැවත ආ බව. (ක්‍රියා 22:3)
> - එතුමා ගමාලියෙල් ගෙන් අධ්‍යාපනය ලැබූ නිසා ටෝරාව මැනවින් දත් බව. (ක්‍රියා 22:3)
> - එතුමා පරිසි සම්ප්‍රදාය තුළ උපත ලැබූ බව. (ක්‍රියා 23:6)
> - තරුණ වියේ පටන් එතුමා පරිසියෙකු ලෙස ජීවත්වූ බව ජෙරුසලමේ අය දන්නා බව. (ක්‍රියා 26:46)
> - එතුමාට රෝම පුරවැසි භාවය තිබුන බව. (ක්‍රියා 22:25)
> - කූඩාරම් සෑදීම දැන සිටි බව. (ක්‍රියා18:3)
> - ශු පාවුල් තුමා ක්‍රියාකාරී සේවයේ යෙදුනේ එතුමාගේ මෙම පසුබිම නිසා බව.

පියවර 2.1.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් 3කට වෙන්කරන්න.
- ඇමුණුම 2:1:2 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් ඩිමයි, කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ශුද්ධ පාවුල්තුමාගේ පරිසරයට සම්බන්ධවන පද ශුද්ධවූ බයිබලයෙන් සොයාගෙන ලිවීමට සලස්වන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට සූදානම් කිරීමට ඉදිරිපත් කරවන්න.

පියවර 2.1.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ශු පාවුල් තුමාගේ ජීවන පසුබිම ක්‍රියාකාරී සේවයට උපකාරී වූ බව.
- ශු පාවුල් තුමාගේ පසුබිමේ වූ අදහස් ඔහු ක්‍රියාවට නැගූ බව. උදා: සද්දුසි, පරිසි ගැටුම් (ක්‍රියා 23:5-11)
- අන්‍යජාතීන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ඔහුගේ පසුබිම ඉවහල් වූ බව. (රෝම පුරවැසි භාවය, ග්‍රීක් භාෂාව දැන සිටීම, ග්‍රීක් සංස්කෘතීන් දැන සිටීම)
- ජුදෙව්වන් සමඟ මෙන්ම අන්‍ය ජාතීන් සමඟද කටයුතු කිරීමේ කුසලතාවය ඔහු සතුවූ බව.
- වර්තමාන සන්දර්භය තුළ ශු පාවුල් තුමා මෙන් අපගේ පසුබිම දෙවිඳුන්ගේ රාජ්‍යත්වය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ශු. පාවුල් තුමාගේ පසුබිම විස්තර කරයි.
- ශු පාවුල් තුමාගේ ජීවිත පසුබිම ක්‍රියාකාරී සේවයක නියැලීමට හේතුවූ බව පැහැදිලි කරයි.
- ශු පාවුල් තුමා මෙන් දේව සේවය සඳහා අපගේ පසුබිම යොදාගත යුතු බව තීරණය කරයි.
- සද්දුසි පරිසි ගැටුම තම වාසියට යොදා ගත්තාක් මෙන් අද අප ක්‍රියා කිරීම නිවැරදිද? යන්න සිතා බලයි.

**කණ්ඩායම් ගවේෂණය**

ඇමුණුම 2.1.1

- ශු පාවුල් තුමා මවිකුසයේ පටන් දෙවිඳුන් කැඳවූ බව දත යුතුය. ඔහු හෙබ්‍රෙව් හා ග්‍රීක් භාෂාවන් චතුර ලෙස දැන සිටියේය. ටෝරාව ද හොඳින් දැන සිටියේය. ඔහු ජුදෙව් වර්ගයෙන් පැවත එන පරිදි ජුදෙව් සම්ප්‍රදාය තුළ වැඩුනේය. ඒ බව ජෙරුසලමේ සිටි අය දැන සිටියහ. රෝම පුරවැසිභාවය ද ඔහුට විය. කූඩාරම් තැනීමේ කර්මාන්තයේ හසළ දැනීමක් ඔහු සතු විය.
- පාවුල්ගේ පසුබිම ක්‍රියාකාරී සේවය සඳහා ඉවහල් විය. එතුමාගේ පසුබිමේ බලපෑම ඉතා වැදගත් වූයේ තම චින්තනය ගැඹුරු කරගැනීමට හා තම සීමාවන් තුළ සිටීමට එය හේතුවූ නිසාය.

ඇමුණුම 2.1.2

- පළමුවැනි කණ්ඩායම හා දෙවැනි කණ්ඩායම විවාදයක යෙදෙන්න. මාතෘකාව ශු පාවුල් තුමාගේ පසුබිම ඔහුගේ මෙහෙයට උපකාර විය/නොවීය.
- 3 වැනි හා 4 වැනි කණ්ඩායම්. මාතෘකාව ශු පාවුල් තුමා සංදර්භවාදියකු විය/නොවිය. (ක්‍රියා 23:5-11) (තමාගේ වාසිය තකා අවස්ථානුකූලව ක්‍රියාකරන්නෙකු)

| | | |
|---|---|---|
| නිපුණතාව | : | ශු. පාවුල්තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් කිතුනුවකු ලෙස සේවය කරයි. |
| නිපුණතා මට්ටම 2.2 | : | සැබෑ ජීවිත පරිවර්තනයකට යොමු වෙයි. |
| ක්‍රියාකාරකම 2.2 | : | "වෙනස්වීමේ ක්‍රියාවලිය තුළින් පූර්ණ ජීවිතයක් ගත කරමු." |
| කාලය | : | විනාඩි 80 |
| ගුණාත්මක යෙදවුම් | : | • ශුද්ධ බයිබල් පාඨ ලියූ පිටපත් හා පැවරුම් පත්<br>• බයිබල් පාඨ - ක්‍රියා 7:58, 8:1-3, 9 පරිච්ඡේදය<br>• ඩිමයි කඩදාසි හා මාකර් පෑන්<br>• ඇමුණුම් 2.2.1<br>• ඇමුණුම් 2.2.2<br>• ඇමුණුම් 2.2.3 |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.2.1 :

- 2.2.1 ඇමුණුම බලන්න.
  දමස්කයට යන මග පිංතූරය පන්තියට ඉදිරිපත් කරන්න.
- එහි සිටින පුද්ගලයා හඳුනාගෙන නම් කිරීමට ඉඩ සලසන්න.
- ඒ තුළින් පාවුල්ගේ හැරීමේ කථාව ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- පිංතූරය ආශ්‍රයෙන් පහත කරුණු මතුකර සාකච්ඡාව මෙහෙයවන්න.

> - ඔහු ජුදෙව් ටෝරාව පිළිබඳ විශ්වාසයෙන් හා බැඳීමෙන් කටයුතු කළ බව.
> - ශු ස්තේපන් තුමා විනාශ කිරීමට පාවුල්තුමා කටයුතු කළ බව. (ක්‍රියා 7:58)
> - එතෙකින් නොනැවතී කිතුනුවන් විනාශ කරමින් ජ්වලිතව කටයුතු කළ බව. ක්‍රියා 8:1-3
> - පාවුල්ගේ හැරීම සිදුවූ පසු ඔහු ජේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව ප්‍රකාශ කළ බව. (ක්‍රියා 9)
> - පාවුල්තුමා ඇදහිල්ලෙන් ගැලවීම ලබා ගත් බව.

පියවර 2.2.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට බෙදන්න.
- ගවේෂණ පත්‍රිකා, ලිපිද්‍රව්‍ය සෑම කණ්ඩායමකටම ලබාදෙන්න.
- ඇමුණුම 2.2.2 හි ඇතුළත් ඔබ කියවූ ප්‍රශ්න වලට පිළිතුරු සාකච්ඡා කිරීමට සලස්වන්න.
- කුඩා කණ්ඩායම් ප්‍රශ්න හා පිළිතුරු හුවමාරු ක්‍රමයට පංතියට ඉදිරිපත් කරවන්න.

පියවර 2.2.3 :

- කණ්ඩායම් බෙදා අදාළ බයිබල් කොටස කියවා පාවුල්ගේ හැරීම ඩිමයි කොළ වල දක්වා එය පංතිය ඉදිරිපිට කොටසින් කොටස ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ප්‍රථම කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සියලුම කණ්ඩායම් වලට සිය වාර්තා ඉදිරිපත් කිරීමටත් වර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු වනසේ සමාලෝචනයක යෙදෙන්න.

> - පූර්ණ ජීවිතයක් සඳහා වන පාවුල්ගේ හැරීම ක්ෂණික සිදුවූවක් නොව කාලාන්තරයක සිට විවිධ සිද්ධීන් තුළ විකාශනය වූවක් බව.
> - හැරීමේ ක්‍රියාවලිය යහපත මත රඳා පවතින්නේ නම් එය පූර්ණ සංවර්ධනයකට බලපාන බව.
> - ශු පාවුල්තුමාගේ හැරීමේ ක්‍රියාවලියට බලපෑ මුල්ම සිදුවීම විය හැක්කේ ශු ස්තේපන් තුමා ගල් ගැසීමෙන් මරණයට පත්කිරීමේදී එතුමාගේ වදන් බව. (ක්‍රියා 7:58-59)
> - පාවුල් කිතුනුවන්ට කළ පීඩා මධ්‍යයේ වුවද බොහෝ දෙනෙකු කිතුනුවන්ට එක් වූ බව.
> - පාවුල්ගේ හැරීමට දමස්කයේ ගමන වැදගත් ස්ථානයක් ගත් බව. ක්‍රියා 9:12-18, 22:6-16, ගලාති 1:11-24
> - දමස්කයේ අත්දැකීමෙන් පසු පාවුල්ගේ චින්තනයේ අඛණ්ඩ වෙනසක් වූ බව.
> - සියලු දෙනාගේ ජීවිත තුළ අඛණ්ඩ වෙනස්වීම් ක්‍රියාවලීන් සිදුවිය යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පාවුල්ගේ හැරීමට පෙර ඔහුගේ චරිත ලක්ෂණද ඇතුළත් වනසේ ක්‍රියා කලාපය ලියා දක්වයි.
- පාවුල්තුමාගේ සිදුවූ වෙනස්වීම දක්වමින් කවි පංතියක් හෝ නිසඳැසක් හෝ චිත්‍රයක් නිර්මාණය කරයි.
- වර්තමාන සමාජය තුළ අපට එසේ වෙනස් විය හැකි ආකාරයන් දැක්වෙන ලෙස නාට්‍යයක් ඉදිරිපත් කරයි.

කණ්ඩායම් ගවේෂණයට උපදෙස් :

- සෑම කණ්ඩායමකටම කාර්ය පත්‍රිකාවක් ලබා දෙන්න.
  ප්‍රශ්න වලට ලබාදී ඇති පිළිතුරු මනාව සාකච්ඡා කරන්න.
  ඒවා සටහන් කරගන්න.
  පංතියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම 2.2.1

- ඕනෑම මිනිසකුට ඕනෑම මොහොතක වෙනස් විය හැක. මේ නිසා ඔවුන් තුළ යහපත් මෙන්ම අයහපත් වෙනස්කම් ද ඇතිවිය හැක. පූර්ණ ජීවිතයක් කරා යාමට මිනිසාට බලපාන්නේ ධනාත්මක වෙනස්වීම්ය. ඍනාත්මක වෙනස්කම් මිනිසාව ඇද හෙළන්නේ නොගැළපෙන ජීවිතයකටය.

- ශු පාවුල් තුමා ජුදෙව් ටෝරාව බෙහෙවින් ප්‍රියකළ කෙනෙක් විය. ඔහු එයට වඩා වෙනස් දෙයක් නොපිළිගත්තේය. ස්තේපන් තුමාගේ මරණය පාවුල් තුමාට බලපෑමක් කරන්නට ඇත. ක්‍රියා 7:58, ශු පාවුල් තුමා කිතුනුවන් විනාශ කළේය. ක්‍රියා 8:1-3 එහෙත් බොහෝ දෙනෙක් කිතුනු මාර්ගයට අවතීර්ණ වූහ. ක්‍රියා 8:4-40 මෙයද පාවුල් වෙත බලපෑවේය.

- ශු පාවුල්තුමා වරක් ක්‍රිස්තියානීන්ට පීඩා කළත් දමස්කයට යන මාර්ගයේදී වැදගත් වෙනස්වීම් ක්‍රියාවලියක් අත්දුටුවේය. ක්‍රියා 9 ඊට පසුවද ශු පාවුල්තුමා වෙනස්වීමේ ක්‍රියාවලීන්ට මුහුණ පෑවේය. ඒ නිසා ශු පාවුල්තුමාගේ හසුන්පත් වලින් පෙනී යන්නේ ඔහුගේ චින්තනය අඛණ්ඩව වර්ධනය වූ බවයි.

- බොහෝ දෙනෙකුගේ ජීවිත ගමන තුළ පූර්ණ ජීවිතයක් සඳහා වෙනස් වීම් ඇතිවේ. යහපත් වෙනස්වීම් දේව රාජ්‍යත්වය පිළිගැනීමට ඉවහල්වේ.

ඇමුණුම 2.2.2

- පූර්ණ ජීවිතය හඳුනාගෙන තම ජීවිතය වෙනස්කර ගත් අය ශු බයිබලයෙන් හඳුනාගෙන සටහන් කරන්න.

- වෙනස්වීම එක් මොහොතක ක්ෂණික සිදුවීමක් නොව අඛණ්ඩ ක්‍රියාවලියක් සහිත ධනාත්මක සිදුවීමක් බව පැහැදිලි කරන්න.

- වෙනස්වීම් වලට භාජනය වූ අයගේ ජීවිත පැවැත්ම ඔවුන්ගේ මුල් ජීවිත පැවැත්මට වඩා වෙනස් වූ බව පැහැදිලි කරන්න. උදා. සාකෙවුස්

- අයහපත් වෙනස්වීම් නිසා මුළු මහත් මිනිස් සංහතියම විනාශ වන බව පැහැදිලි කරන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ශු. පාවුල් තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි. |
| නිපුණතා මට්ටම 2.3 | : | ඵලදායි මෙහෙවරක් සඳහා හවුල් නායකත්වයක් අනුගමනය කරයි. |
| ක්‍රියාකාරකම 2.3 | : | "හවුල් සේවයේ යෙදෙමු". |
| කාලය | : | මිනිත්තු 80 |
| ගුණාත්මක යෙදවුම් | : | ශු බයිබලයේ ක්‍රියා 9:26-30<br>ක්‍රියා 13, 14, පරිච්ඡේද<br>හවුල් සේවයේ යෙදෙන නායකයින් පිළිබඳ පින්තූර හා විස්තර,<br>ඩිමයි කඩදාසි හා මාකර් පෑන් |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය | : | |
| පියවර 2.3.1 | : | • හවුල් සේවයේ යෙදෙන නායකයින් පිළිබඳ පුවත් පත්වලින් ලබාගත් ලිපි හා පින්තූර පෙන්වමින් සිසුන්ගෙන් ඒ පිළිබඳ අදහස් විමසන්න.<br>• පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න. |

- හවුල් නායකත්වයේ සිටි ගෝලයන් පාවුල් ග්‍රීක් කථාකරන ජනයාගෙන් ආරක්ෂා කරගත් බව. (ක්‍රියා 9:26-30)
- හවුල් නායකත්වයේ සිටි ගෝලයන් පාවුල් හා බාර්ණබස් ඵලදායි මෙහෙවරක් සඳහා පිටත් කොට යැවූ බව.
- ධර්මදූත චාරිකාව සඳහා අන්තියෝකියේ සභාව යාච්ඤා කළ බව.
- පාවුල් බාර්ණබස්ව හා ජොහන් මාර්ක්ව සේවයට හවුල් කර ගත් බව. (ක්‍රියා 13, 14)
- ජෙරුසලමේ පළමු මන්ත්‍රණ සභාව සාමූහිකත්වය සඳහා සාමූහික තීරණ ගත් බව. (ක්‍රියා 15:1-22)

පහත සඳහන් ස්ථාන ධර්මදූත චාරිකාව තුළ වැදගත් වූ බව.

| ස්ථානය | සිද්ධිය |
|---|---|
| 1. සලමිය | ධර්මශාලාවේ දේව වචනය ප්‍රකාශ කළහ. |
| 2. පාපස් | බාර් ජේසුස් නම් ජුදෙව් ජාතික බොරු දිවැසිවර විජ්ජාකාරයෙක් සර්ගියස් පාවුලස් ඇදහිල්ලට හැරීම වලක්වාලන අදහසින් ක්‍රියා කළ නිසා ඔහු අන්ධ කරවන ලදී. පසුව සර්ගියස් පාවුලස් දෙවියන්වහන්සේ පිළිගන්නා ලදී. |
| 3. පිසිදියේ අන්තියෝකිය | ධර්මශාලාවේ පාවුල්ගේ කථාව (ක්‍රියා 13:15-41)<br>සබත් දිනයේදී ධර්මශාලාවේ දේශනයට ආරාධනා කළ විට ජුදෙව්වරු, අනෙක් අය පොළඹවා පාවුල් හා බාර්නබස්ට විරුද්ධව පීඩනයක් ඇතිකර, තමන්ගේ පෙදෙස් වලින් ඔවුන් නෙරපා දැමීය.<br>මෙවැනි අභියෝග හමුවේ හවුල් නායකත්වයෙන් යුතුව පාවුල් හා බාර්නබස් ක්‍රියා කළහ. |
| 4. ඉකෝනිය | ජුදෙව් ධර්මශාලාවේ සේවය ජුදෙව් හා ග්‍රීක මහත් පිරිසක් එය පිළිගත්හ. නමුත් අදහා නොගත් ජුදෙව්වරු විජාතින් කළඹා සහෝදරයන්ට විරුද්ධව ඔවුන් පෙළඹූහ. මෙහිදී පවා මොවුන් ධෛර්යයෙන් යුතුව මුහුණ දුන්හ. |
| 5. ලුස්ත්‍රාව | මව්කුස පටන් කොර වූ පාද දුර්වල වූ කිසි කලෙකත් ඇවිදගත නොහැකි මිනිසෙක් සුව කළ නිසා ජනතාව දෙවිවරු මිනිස් වෙසින් පැමිණ සිටිතැයි පාවුල් හා බාර්ණබස් ගැන සිතූහ. නමුත් පාවුල් හා බාර්නබස් සිය වස්ත්‍ර ඉරා ගනිමින් තරයේ ප්‍රතික්ෂේප කරමින් දෙවියන්වහන්සේ ගැන ප්‍රකාශ කළහ.<br>නමුත් ඉකෝනිය හා අන්තියෝකියෙන් පැමිණි ජුදෙව්වරු අවුත් සමූහයා පොළඹවා පාවුල් ගල් ගසා මරා දැමීමට තැත් කළහ. |
| 6. සිරියාවේ අන්තියෝකිය | ශුභාරංචිය ප්‍රකාශ කර බොහෝ දෙනෙක් හරවා ගත්හ. එසේම, ලුස්ත්‍රාව, ඉකෝනියටද අන්තියෝකියටද හැරී අවුත් ඔවුන් ශක්තිමත් කළහ. |
| 7. පර්ගය | දේව වචනය ප්‍රකාශ කළහ. |
| 8. අන්තියෝකිය | සේවය කළ සියල්ලෝ සභාවක් ලෙස එකතු වී අන්‍යජාතීන් වෙත ඇදහිල්ල ගෙන යාමේ යහපත් ක්‍රියාවලිය පිළිබඳව සාක්ෂි දැරූහ.<br>හවුල් නායකත්වය තුළින් එකමුතුව ජෙරුසලම් මන්ත්‍රණ සභා තීරණ ගත්හ. ක්‍රියා 15 |

පියවර 2.3.2 :

- පන්තිය කණ්ඩායම් වලට බෙදන්න.
- ඇමුණුම 2:3.1 කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ද බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.3.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- බෙදීම් වලින් යුතු වෙන්වුණු සේවයට වඩා හවුල් නායකත්වය වඩා ඵලදායි බව.
- මුලින් කිතුනුවන්ට පීඩා කළ පාවුල් පසුව ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාම බව ප්‍රකාශ කළ අතර බාර්ණබස් හා එකමුතුව හවුල් නායකත්වයෙන් යුතුව ක්‍රියා කළ බව.
- පළමුවැනි ධර්මදූත චාරිකාව හවුල් සේවය මත ය හපත් සේවයකට උදාහරණයක් බව.
- වර්තමාන සංදර්භය තුළ හවුල් නායකත්වයන් තුළ ින් පමණක් යහපත් සමාජයක් ගොඩ නැගෙන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- තනිවම ක්‍රියාකිරීමට වඩා හවුල් නායකත්වය වැදගත් බව සාමාන්‍ය ජීවිතය ඇසුරින් පැහැදිලි කරයි.
- පළමු ධර්මදූත චාරිකාවේදී අභියෝග වලට මුහුණ දීමට හවුල් නායකත්වය ඉවහල් වූ අයුරුත් එහි ඵලදායිතාවයත් ප්‍රකාශ කරයි.
- අප රටේ සාරධර්ම වර්ධනය සඳහා හවුල් නායකත්වය යොදා ගත හැකි අයුරු විමසයි.
- වර්තමාන සංදර්භයට අනුව හවුල් නායකත්වය යොදා ගැනීමට තීරණය කරයි.

කණ්ඩායම් ගවෙෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.3.1 :

- හවුල් නායකත්වය මිනිසාට යහපත ළඟා කරලීමට උදව් වේ. 1වැනි ධර්මදූත චාරිකාව මගින් ඵලදායි මෙහෙවරක් සිදුවූයේ එබැවිනි.
- පාවුල් සහ බාර්ණබස් ධර්ම ශාලාවල දේව වචනය බෙදා ගත්හ. පාපස් වලදී පාවුල් එලිමස් නම් බොරු දිවැසිවර විජ්ජාකාරයාව හෙළා දුටුවේය. පාවුල් හා බාර්ණබස් තමන් මෙහෙවරේදී තමන් සාමාන්‍ය පුද්ගලයින් බව පිළිගත් අතර, නොඅදහන ජුදෙව්වරුන් හා ඊර්ෂ්‍යාවෙන් පෙළෙන ජුදෙව්වන් ගෙන් පැමිණි ප්‍රශ්න වලට හා දුක් වේදනාවන්ට නිර්භීතව මුහුණ දුන්හ. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේදී ද හවුල් නායකත්වය බලපෑවේය.
- වර්තමාන සංදර්භය තුළ, අභියෝග වලට අර්ථාන්විතව මුහුණ දෙමින්, හවුල් නායකත්වයක් තුළ දේව රාජ්‍යත්වය සඳහා කටයුතු කළ හැකිය.

ඇමුණුම 2.3.2 :

- හවුල් නායකත්වය යටතේ වූ පළමු ධර්මදූත චාරිකාවේ යහපත් දෑ ලැයිස්තු ගත කරන්න.
- "හවුල් නායකත්වය යහපත් ප්‍රවේශයකි". මේ අනුව ක්‍රියාකිරීමට යන ආකාරය පැහැදිලි කරන්න.
- වර්තමාන සංදර්භය තුළ හවුල් නායකත්වය තුළින් දිනපතා කටයුතු කළ දෙදෙනෙකු තෝරාගෙන ඔවුන්ගේ ක්‍රියා පිළිවෙත් විමසන්න.
- A හා B කණ්ඩායම් අතර ක්ෂණික විවාදයක් පවත්වන්න - මාතෘකාව - හවුල් නායකත්වය සුදුසුද? තේවල නායකත්වය සුදුසුද?

නිපුණතාව 2.0 : ශු පාවුල්තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකය ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි.

නිපුණතා මට්ටම 2.4 : නොපසුබට වීර්යයෙන් යුතුව අභියෝග වලට මහුණ දෙයි.

ක්‍රියාකාරකම 2.4 : "දුක් පීඩා මධ්‍යයේ ඉදිරියට පැමිණෙන අභියෝග වලට මුහුණ දී ධෛර්යයෙන් සේවය කරමු."

කාලය : විනාඩි 80යි

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 2.4.1 ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් තුනක්
- ඇමුණුම 2.4.2 බයිබල් පාඨ සහිත ලිපියක්
- ඩිමයි කඩදාසි, මාකර් පෑන්
- බයිබලය - ක්‍රියා 16:25-40, 17:1-9/10-15

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :
පියවර 2.4.1

- ධර්මදූත චාරිකාව පිළිබඳ සිතියම පන්තියේ එල්ලන්න.
- ශිෂ්‍යයන් වෙන වෙනම පන්තිය ඉදිරියට පැමිණ චාරිකාවේ ස්ථාන නම් කිරීමට සලස්වන්න.
- ඇමුණුම 2:4:1 ලබා දෙන්න.
- පාවුල් හා සීලස් අභියෝග වලට මුහුණ දුන් ආකාරය පිළිබඳ සාකච්ඡාවකට යොමු කරවන්න.

- බෙදීම් පිළිබඳ අභියෝග වලට මුහුණ පෑමට සිදු වූ බව. (ක්‍රියා 15:36-41)
- ලුස්ත්‍රාවේදී පාවුල්ට ජුදෙව්වන් නිසා තිමෝතියස් චර්මච්ඡේදනය කිරීමෙහි අභියෝගයට මුහුණ පෑමට සිදුවූ බව. (ක්‍රියා 16:1-5)
- දෙවියන්වහන්සේ මසිදෝනියාවේ සේවය කිරීමේ අභියෝගය ඔහුට ඉදිරිපත් කළ බව.
- ශු පාවුල් තුමා පිලිප්පියේදී ලිදියාගේ නිවසේ නවාතැන් ගත් බව. (ඇය බව්තීස්මය ලැබූ පසුව)
- වහල් දැරියක් සුවපත් කිරීම නිසා ශු පාවුල්තුමාට හා සීලස්තුමාට පිලිප්පියේදී සිරගත වීමේ අභියෝගයට මුහුණ දීමට සිදුවූ බව. (ක්‍රියා 16:16-25)
- සිරගෙයි මුලාදෑනියා සිරගෙයි වූ සිදුවීම මගින් ජීවිතය වෙනස් කිරීමේ අභියෝගයට මුහුණ පා පාවුල්ගෙන් බව්තීස්මය ලැබූ බව.
- රෝම පුරවැසිභාවය මුල් කරගෙන පාවුල් තුමා විනිශ්චයකින් තොරව තමන් සිරගත කිරීමේ වරද මත නඩුකාරයන්ට අභියෝග කළ බව. (ක්‍රියා 16:25-40)
- පාවුල් හා සීලස් කරදර ඇතිකරගන්නන් වශයෙන් සැලකූ ජුදෙව්වරුන් ඇතිකළ කලබලයට මුහුණ පෑමේ අභියෝගයට පාවුල් හා සීලස්ට මුහුණ දීමට සිදුවූ බව. (ක්‍රියා 17:1-9/10-15)

- ඇතන්ස් හී පාවුල් තුමා ජුදෙව්වන්, එපිකූරිය හා ස්තෝයික දාර්ශනිකයින් සමඟ වාද කිරීමේ අභියෝගයට මුහුණ පෑ අතරම ඇතන්ස් වැසියන්ට නාඳුනන දෙවියන් හඳුන්වා දෙමින් අභියෝගයක් ඉදිරිපත් කළ බව.
- පාවුල් හා සීලස් මෙන් වර්තමාන සංදර්භය තුළ ජීවත්වීමට අප සූදානම් විය යුතු බව.

පියවර 2.4.2 :

- පන්තිය කුඩා කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- බයිබල් කොටස් හා ඇමුණුම 2.4.2 ලබාදෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයකට ඉඩ සලස්වන්න.
- විවාදයක් පැවැත්වීම තුළ අදහස් ඉදිරිපත් කිරීමට සලස්වන්න.

පියවර 2.4.3 :

- විස්තර අනුව විවාදය පවත්වා කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියටම ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ඉදිරිපත් කළ නොහැකි නම් හේතු දක්වන්න.
- සෙසු කණ්ඩායම් වල සංවර්ධන යෝජනා විමසන්න.

- පාවුල් හා සීලස් සමඟ තිමෝතියස් ධර්මදූත ගමනේදී දේව වචනය බෙදා හැරීමේ විවිධාකාර අභියෝගයන්ට මුහුණ පාමින් දුක් වින්ද බව.
- ශු පාවුල් තුමා පිලිප්පියේදී වහල් දැරියක් සුවපත් කළා පමණක් නොව ඇය මගින් මුදල් උපයාගත් ස්වාමිවරුන්ට අභියෝග කළ බව.
- පාවුල් තුමා පැවසූ වදන් අනුව වර්තමානයේදී පවා නඩු විභාගයකින් තොරව කිසිවකු සිරගත කිරීම වරදක් බැවින් ඒ පිළිබඳව වර්තමානයේදී පවා අභියෝගයක් එල්ල කරන බව.
- සරණාගතයන්ට විරුද්ධවීම තුළින් ආරවුල් ඇති කරන්නන් බවට පත්වන අතර ආත්මාර්ථයෙන් තොරව ඊට අභියෝග කරමින් ජීවත් විය යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පාවුල් හා සීලස් දෙවැනි ධර්මදූත චාරිකාවේදී මුහුණ දුන් අභියෝග ලැයිස්තු ගත කරයි.
- දේව රාජ්‍යත්වයේ වටිනාකම් වලට අනුව ජීවත් වීමේදී මිනිසාට මුහුණ දීමට සිදුවන අභියෝග හඳුනාගෙන පැහැදිලි කරයි.
- වර්තමාන සමාජය තුළ දේව රාජ්‍යත්වයේ වටිනාකම අනුව සමාජයට අභියෝග කළ පුද්ගලයින් දෙදෙනෙකු ගැන තොරතුරු රැස්කර ඔවුන්ට ගරු කරයි.

- පවුල, පාසල, සභාව හා සමාජය තුළ මුහුණ පාන්නට සිදුවන අභියෝග ජය ගන්නා ආකාරය පැහැදිලි කරයි.

ඇමුණුම 2.4.1

- ශු පාවුල් හා සීලස් දෙවෙනි ධර්මදූත චාරිකාවේදී විවිධ අභියෝගයන්ට මුහුණ දුන්හ. දේව කරුණාව හා හවුල් නායකත්වය තුළින් ඔව්හු නිර්භීතව එයට මුහුණ දුන්හ.

- චර්මච්ඡේදනය කිරීම සඳහා තිමෝතියස්ට මග පෙන්වූ පාවුල්ට මසිදෝනියට යෑමේ දේව මග පෙන්වීම ලැබුණි. ඔහු ලිදියාගේ නිවසේ නවාතැන් ගත් අතර වහල් දැරිය සුවපත් කොට සිරගෙදරට පත් වූ නමුත් මෙහිදී සිදුවූ සිදුවීමක් නිසා හිරගෙදර මුලාදෑණියා බව්තීස්මය ලබා කිතුනුවකු වූ අතර තමන් සිරභාරයට පත් කළ අයට විරුද්ධව ශු පාවුල් තුමා කථා කළේය. එසේම ඇතැමෙක් පාවුල් හා සීලස් කැරලිකරුවන් ලෙස සැලකූහ. මෙම සියලුම සිදුවීම් තුන්වැනි ධර්මදූත චාරිකාව තුළ වැදගත් විය.

- ඇතැම් සිදුවීම් පාවුල්ට හා සීලස්ට අභියෝගාත්මක විය. නිදසුනක් ලෙස තිමෝති චර්මඡේදනය කිරීම සැලකිය හැකිය. එසේම ඇතැම් සිදුවීම් මගින් පාවුල් හා සීලස් අනනියස්ට අභියෝග කළහ. (නිදසුනක් ලෙස වහල් දැරිය) මේ සියලු අභියෝගයන්ට පාවුල් හා සීලස් නිර්භීතව මුහුණ දුන්හ. අපටද ජීවිත අභියෝගයන්ට නිර්භීතව මුහුණ දීමට පාවුල් හා සීලස්ගේ ආදර්ශය අනුගමනය කළ හැකිය.

ඇමුණුම 2.4.2

- 1 වැනි හා 2 වැනි කණ්ඩායම් අතර විවාදයක් සංවිධානය කරන්න.
  මාතෘකාව : තිමෝති චර්මච්ඡේදනය කිරීම සුදුසුද? නුසුදුසුද?

- 3 කණ්ඩායම හා 4වන කණ්ඩායම - පාවුල් තුමා 2 වැනි ධර්මදූත චාරිකාවේදී ජෝන් මාර්ක් අත්හැර දැමීම අනුමත කළ හැකිද? නොහැකිද?

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ශු පාවුල් තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි. |
| නිපුණතා මට්ටම 2.5 | : | නිවැරදි දැක්මක් පදනම් කොට ගෙන ක්‍රිස්තියානි මෙහෙවරෙහි යෙදෙයි. |
| ක්‍රියාකාරකම 2.5 | : | "නිවැරදි දැක්මක් තුළින් කිතුනු මෙහෙවරෙහි යෙදෙමු. " |
| කාලය | : | මිනිත්තු 120 යි |

ගුණාත්මක යෙදවුම් :

- ශු බයිබලයේ ක්‍රියා 19 වැනි පරිච්ඡේදය
- ශු පාවුල් තුමාගේ ධර්මදූත චාරිකා පිළිබඳ සිතියමක්
- ඇමුණුම 2.5.1ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස් පිටපත් 4ක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.5.1 :

- ඇමුණුම 2.5.1 සිසුන් අතර බෙදා කියවීමට සලස්වන්න.
- 3වැනි ධර්මදූත ගමනේදී එපීසය වැදගත් වූ ආකාරය පැහැදිලි කිරීමට අවස්ථාවක් දෙන්න.
- ඵලදායි සේවයක් සඳහා තම මෙහෙවරේ ශු පාවුල් තුමා යෙදුණු බව සිත්හී තබා ගෙන පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.

> - ජොහන් තුමාගේ බව්තීස්මය ලැබූ අය ශු පාවුල් තුමා ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්ම කළ බව. (ක්‍රියා 19:1-10)
> - ශු පාවුල් තුමා දෙවිඳුන්ගේ රාජ්‍යත්වය පිළිබඳව ධර්මශාලාවේදී සාකච්ඡා කළ බව. (ක්‍රියා 19:1-10)
> - ශු පාවුල් තුමා දිනපතා තුරානස්ගේ ශිල්ප ශාලාවෙ හිඳී තර්ක කළ බව. (ක්‍රියා 19)
> - දෙවියන්වහන්සේ පාවුල් තුමා තුළින් ලකුණු දැක්වූ බව. ක්‍රියා 19:11-20
> - ශු පාවුල් තුමාගේ සේවය තුළ එපීසයේ කෝලාහලය වැනි අභියෝගාත්මක අවස්ථාවන්ට පවා මුහුණ දීමට සිදුවූ බව. ක්‍රියා 19:21-40
> - තත්කාලීන වාතාවරණය අනුව ශු පාවුල් තුමා තම මෙහෙවරේ යෙදුණු බව. (එපීසයේ)

පියවර 2.5.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් 4කට වෙන් කරන්න.
- ඇමුණුම 2.5.2 සිසුන්ට බෙදා දෙන්න. ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ද බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.5.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • ශු පාවුල් තුමාගේ 3වැනි ධර්මදූත ගමන තුළ එපීසයේ සේවය වැදගත් වූ බව.<br>• ස්නාවක ජොහන්ගේ බව්තීස්මය ලැබූ ගෝලයන් ජේසුස් ක්‍රිස්තුස්වහන්ගේ නාමයෙන් බව්තීස්මය ලත් විට දිවැසි වැකි පැවසීම්, අන්‍ය භාෂාවලින් කථා කිරීම හා ශුද්ධාත්මය ලැබීම තුළ ඔවුන් ක්‍රිස්තියානීන් ලෙස අන්‍යයන් සැලකූ බව. (ක්‍රියා 19:6)<br>• ධර්ම ශාලාවේදී ශු පාවුල් තුමා දෙවිඳුන්ගේ රාජ්‍යත්වය ගැන කථා කිරීම ඉතා වැදගත් බව.<br>• තමාගේ මෙහෙවර ප්‍රතික්ෂේපයට ලක්වූ විට ශු පාවුල් තුමා වෙනත් ස්ථාන වලට ගිය බව.<br>• හාස්කම් සිදුකරන විට දෙවිඳුන්ගේ රාජ්‍යත්වය මතු කරලීමට විනා පෞද්ගලික සංසිද්ධීන් සඳහා නොකළ යුතු බව. (ස්කේවා පූජකයාගේ පුතුන්)<br>• අත් වලින් සෑදූ පිළිම සැබෑ දෙවිඳුන් නොවන බව.<br>• ශු පාවුල් තුමාගේ මෙහෙවර තත්කාලීන සමාජයට අදාළ වූ බව.<br>• වර්තමාන සංදර්භය තුළ කිතුනු මෙහෙවර නිවැරදි දැක්මකින් හා සුදුසු ක්‍රම වේදයකින් විය යුතු බව. |

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ශු පාවුල් තුමා එපීසයේ සිදුකළ මෙහෙවර සාරාංශ ගත කරයි.
- එපීස මෙහෙවරේ එක් සිදුවීමක් තෝරා එය වර්තමාන සමාජ අභියෝග ජය ගැනීමට විකල්පයක් ලෙස යොදා ගත හැකිදැයි පැහැදිලි කරයි.
- හාස්කම් දේව රාජ්‍යත්වය උදෙසා විනා පෞද්ගලිකත්වය මත සිදු නොවන බව පැහැදිලි කරයි.
- එපීසයේ ශු පාවුල් තුමාගේ මෙහෙවරින් අපට උගත හැකි පාඩම් ගොණු කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.5.1

- එපීසය වැදගත් නගරයක් වූවා මෙන්ම එහි වූ සිදුවීම් ද වැදගත් විය. එපීස මෙහෙවරෙහි ප්‍රතිඵල ලෙස දේව රාජ්‍යත්වය පිළිබඳ ඉගැන්වීම්, හාස්කම්, බව්තීස්මය ලබාදීම හා විවාද වලට මුහුණ පෑමද විය.
- වර්තමානයේ අර්ථාන්විත, පරිසරයට ගැළපෙන මෙහෙවරක යෙදිය යුතු අතර, ඉහත සඳහන් සියල්ල දේව රාජ්‍යත්වය සඳහා කාලයට හා සන්දර්භයට ගැලපෙන ලෙස අර්ථාන්විතව සිදුවිය යුතුය.

ඇමුණුම 2.5.2

- 1 හා 2 කණ්ඩායම් අතර විවාදයක් පැවැත්විය යුතුය. "එපීසයේ මෙහෙවර සුදුසුය/නොසුදුසුය."
- 3,4 කණ්ඩායම් "අපව ප්‍රතික්ෂේප කරන විට අප එම ප්‍රදේශ අත්හැර යා යුතුය/නොයායුතුය."

නිපුණතාව 2.0 : ශු පාවුල් තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි.

නිපුණතා මට්ටම 2.6 : සිරගත වීමේදී පවා කිතුනු මෙහෙවර ඉදිරියට ගෙන යයි.

ක්‍රියාකාරකම 2.6 : "කුමන ආකාරයේ වේදනාවකට මුහුණ පෑවත් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙමු."

කාලය : මිනිත්තු 120 යි

ගුණාත්මක යෙදවුම් :

- ශු බයිබලයේ ක්‍රියා 21:1-16, 27:37, 23:1-10, ක්‍රියා 24, 25 පරිච්ඡේද
- ඇමුණුම 2.6.1 ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.6.1 :

- ශු පාවුල් තුමා කිතුනු මෙහෙවර සඳහා දුක් වේදනා වින්ද ආකාරය පිළිබඳව සිසුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් දෙන්න.
- ඔහු අත් අඩංගුවට ගත් විට පවා නිර්භීතව කිතුනු මෙහෙවරේ යෙදීම වර්තමාන සමාජයට අදාළ කරමින් එවැනි අවස්ථාවන්හීදී තමන් ක්‍රියා කරන අන්දම සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් මෙහෙවරේ යෙදුනු අතර උන්වහන්සේ වෙනුවෙන් ඕනෑම දෙයක් අත්හැරීමට පාවුල් සූදානම් වූ බව - ක්‍රියා 21:1-16<br>• ජෙරුසලම් දේවමාළිගාවේදී ඔහු අත් අඩංගුවට ගත් බව - ක්‍රියා 21:27-37<br>• ෆීලික්ස් ආණ්ඩුකාරයා ඉදිරියේත්, අග්‍රිපා හා බර්නිස් ඉදිරියේත් ඔහු විනිශ්චයට භාජනය වූ බව - ක්‍රියා 24:1-27, 25:13-27<br>• සීසර්ගේ විනිශ්චය ඉල්වූ බව ක්‍රියා 25:1-12<br>• සිරකරුවෙකු ලෙස සිටියදී පවා කිතුනු මෙහෙවර වෙනුවෙන් දුක් වින්ද බව.<br>• වර්තමාන සංදර්භය තුළ පාවුල් මෙන් අභියෝග වලට මුහුණ දෙමින් කිතුනු මෙහෙවරේ නොකඩවා යෙදිය යුතු බව. |

පියවර 2.6.2 :

- පන්තිය කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.6.1 හි ඇතුළත් උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.6.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • පාවුල් තුමාට විවිධ චෝදනාවන්ට මුහුණ පෑමට වූ බව.<br>• අවශ්‍ය නම් මරණයට පවා මුහුණ පෑමට සූදානමින් තමාට විරුද්ධව පැවති නඩු විභාගයන් ක්‍රිස්තුස්ව හන්සේ පිළිබඳව සාක්ෂි දැරීමට පාවුල් තුමා යොදා ගත් බව.<br>• එකම සභාව කොටස් වලට බෙදීම දේව රාජ්‍යත්වය තුළ වැරදි බව.<br>• ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියේ කළ කථාවේදී පරිසි සද්දුසි බෙදීමක් ඇති කොට ඒ මත පරිසිවරුන්ගේ ස හාය ලැබූ බව.<br>• ශ්‍රී ලාංකිකයන් වශයෙන් දුක් වේදනා මැද අප ජීවත් වුවත් වැදගත් වන්නේ දුක් විඳීම නොව පාවුල් මෙන් ජීවත්වීම බව.<br>• අවශ්‍යතාවයන් පැණ නැගුන විට දුක් විඳීමට මුහුණ දී වේදසාක්ෂිකයකු ලෙස ජීවත්වීමට දෙවිඳුන් අප කැඳවන බව. |

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සිරකරු වූ පාවුල් පිළිබඳ තොරතුරු සාරාංශ ගත කරයි.
- වේදසාක්ෂිකයෙකු ලෙස ජීවත් වීමට තීරණය කොට එම තීරණය ඉදිරිපත් කරයි.
- වර්තමාන ශ්‍රී ලාංකේය සංදර්භය තුළ අහිංසක නමුත්, සිරගෙදර යාමට සිදුවූ අය පිළිබඳව අප සිතන ආකාරය පැහැදිලි කරයි.
- ඔවුන්ගේ මානසික තත්ත්වයන් යහපත් කිරීමට ගත යුතු පියවර ලැයිස්තු ගත කරයි.
- පාවුල් මෙන් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ඕනෑම දෙයක් විඳ දරා ගැනීමට එකඟ විය හැකි අවස්ථා ලැයිස්තු ගත කරයි.

ඇමුණුම 2.6.1

- තමාට මුහුණ පෑමට වූ සියල්ල පාවුල් තුමා යොදාගන්නේ ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමටය. දේව කරුණාව නිසා ඉච්ඡාභංගත්වය (Frustration) අභිභවා යමින් ඔහු නොනවත්වාම සිය මෙහෙවරෙහි යෙදුනේය.

ඇමුණුම 2.6.2

- වේදසාක්ෂිකයා යනු ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවිතය පූජා කරන්නෙකි. දුක් විඳීම තේජස්භාවයට පත් කිරීම හෝ දෙවිඳුන් වෙනුවෙන් අප සියල්ලන්ට මරණයට මුහුණ පෑමට සිදුවන බව ප්‍රකාශ කිරීම සුදුසු නැත. දේව කැමැත්ත අනුව ජීවත්වෙමින්, සියල්ල නිර්භීතව කළ යුතුය. දේව කැමැත්තට අනුව හා දේව රාජ්‍යත්වයේ වටිනාකම් අනුව ජීවත්වෙමින්, අභියෝගයන්ට නිර්භීතව මුහුණ දෙන්නා ජීවත්වන වේදසාක්ෂිකයා ලෙස හැඳින්විය හැකිය.

ඇමුණුම 2.6.3

| | | |
|---|---|---|
| 1 වැනි කණ්ඩායම | - | පාවුල් තුමා ක්‍රිස්තියානි ජීවිතය හා මෙහෙවර කුමන බාධකයන් මැද වුවද ඉදිරියට ගෙනා බව ප්‍රකාශ කරන්න. |
| 2වැනි කණ්ඩායම | - | "සිරකරුවකුව සිටියදී පවා පාවුල් තම ජීවිතය ක්‍රිස්තියානි මෙහෙවර සඳහා යෙදවීය." ඔහු මුහුණ පෑ නඩු විභාගයන් අදාළ කර ගනිමින් මෙය පැහැදිලි කරන්න. |
| 3 වැනි කණ්ඩායම | - | වර්තමාන සංදර්භය තුළ පාවුල් ජීවත් වන්නේ නම් ඔහුට කෙබඳු ජීවිතයක් ගත කළ හැකිද? මේ පිළිබඳ අදහස් බෙදාගන්න. |
| 4 වැනි කණ්ඩායම | - | පාවුල් තුමාගේ සිරකාරත්වයේ අත්දැකීම් පදනම් කොට ගෙන, යුක්තිය වෙනුවෙන් හඬක් නැඟීම නිසා සිරභාරයට පත්වීමට සිදුවූ අහිංසකයෙකුට ලිපියක් ලියන්න. |

නිපුණතාව 2.0 : ශු පාවුල් තුමාගේ ජීවිතයෙන් හා සේවයෙන් ආලෝකයක් ලබමින් ක්‍රියාකාරී කිතුනුවකු ලෙස සේවය කරයි.

නිපුණතා මට්ටම 2.7 : සේවයේ අභියෝගයන්ට අවස්ථාවෝචිත ප්‍රතික්‍රියා දක්වයි.

ක්‍රියාකාරකම 2.7 : අප ජීවත්වන සමාජ සංදර්භයට අනුව කිතුනු මෙහෙවරේදී මුහුණ පෑමට වන අභියෝගයන්ට මුහුණ දෙමු.

කාලය : මිනිත්තු 80යි

ගුණාත්මක යෙදවුම් :

- ශු බයිබලයේ ක්‍රියා 27:1-4
  ක්‍රියා 28:2-10
  ක්‍රියා 28:11-37
- ඇමුණුම 2.7.1ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.7.1 :

- පාවුල් තුමා අභියෝගයන්ට මුහුණ පෑ අවස්ථාවන් බෙදා ගැනීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - පාවුල් තුමා සීසර්ගේ විනිශ්චය ඉල්ලූ බව - ක්‍රියා 25:9-12
> - ජූලියස් නම් ශතාධිපතියා උදාර මනුෂ්‍යත්වයෙන් පාවුල්ට සැලකූ බව - ක්‍රියා 27:1-4
> - මෝල්ටාවේදී පබ්ලියස්ගේ පියා ඇතුළු රෝගීන් සුවපත් කළ පාවුල්ට එහි මිනිසුන් කරුණාව දැක්වූ බව. (ක්‍රියා 28:1-10)
> - පාවුල් තුමා රෝමයේදී ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ යෙදී සිටි බව. ක්‍රියා 28:23-31
> - අප ද පාවුල් තුමා මෙන් කිතුනු මෙහෙවරේ යෙදිය යුතු බව.

පියවර 2.7.2 :

- පන්තිය කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2:7:1 හා 2.7.2 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.7.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - රෝමයට යන ගමනේදී අනායයන් සමඟ සුහදව සිටිමින් බලාපොරොත්තු රහිත වූවන්ට බලාපොරොත්තු දුන් බව. ක්‍රියා 27:35
> - රෝමයට ගිය වහාම පාවුල් දෙවිඳුන්ට ස්තුති කළ බව.
> - මෝල්ටාවේදී වූ විවිධ සිදුවීම් මගින් දේව රාජ්‍යත්වය ප්‍රකාශ වූ බව.
> - අවුරුදු 2ක් රෝමයේ නිවාස අඩස්සියේ සිටින විට පවා පාවුල් දෙවිඳුන් ගැන හා දේව රාජ්‍යත්වය ගැන සාක්ෂි දුන් බව. ක්‍රියා 28:23
> - හසුන් පත් රචනා කළේ රෝමයේදී බව .
> - පාවුල් තුමා රෝමයේදී වේදසාක්ෂිකයෙකු ලෙස මරණයට පත්වූ බව.
> - වර්තමානයේදී ද අවස්ථාවෝචිත ප්‍රතික්‍රියා දැක්විය යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- දේව රාජ්‍යත්වය සඳහා පාවුල් තුමා අවස්ථාවෝචිතව ක්‍රියා කළ බව සාකච්ඡා කරයි
- දුකේදී හා වේදනාවේදී පවා අනායයන්ට බලාපොරොත්තු උපදවන්නේ කෙසේද යන්න ගැන අදහස් දක්වයි.
- අවස්ථාවෝචිතව ජීවත්විය යුතු වුවත්, දේව සබඳතාවයෙන් දේව රාජ්‍යයේ වටිනාකම් සලකමින් එය කළ යුතු බව අවධාරණය කරයි.
- පාසලේ සංදර්භය තුළ ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරමින් ජීවත්වන්නේ කෙසේදැයි අනායයන්ගෙන් ලබන තොරතුරු ලැයිස්තු ගත කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.7.1 :

- පාවුල් තුමා අවස්ථාවෝචිතව ක්‍රියා කළ බව ප්‍රායෝගිකව ඔප්පු කළේය. ඔහුගේ මෙහෙවර තුළ රෝගීන්ට සුවය ද භීතියෙන් සිටි අයට බලාපොරොත්තුවද ලැබිණි.
- අප මුහුණ පාන අවස්ථාවන්ට අනුව කටයුතු කිරීමට අප සූදානම් විය යුතුය.

ඇමුණුම 2.7.2 :

- පාවුල් තුමා අවස්ථාවෝචිතව ක්‍රියා කළ බව ඔප්පු කිරීමට අදාළ බයිබල් පද ලියා දක්වන්න.
- අවස්ථාවෝචිතව පාවුල් සිය අදහස් ප්‍රකාශ කළේ ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස වෙනස් කරමින් බව සාකච්ඡා කරමින් ඔප්පු කරන්න. (උදා: රෝම 16:1-2, 1 තිමෝති 1-12)
- අපගේ අදහස් අවස්ථාවෝචිතව වෙනස් කරන විට මතුවන යහපත් හා අයහපත් ප්‍රතිඵල කවරේද?
- අප අවස්ථාවෝචිතව වෙනස් වන විට ජේසුස්වහන්සේ අප දකින්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

නිපුණතාව 3.0 : ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සැබඳියාවකින් ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.1 : පෞද්ගලික මට්ටමේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 3.1 : "ක්‍රිස්තුස්වහන්සේ හා පෞද්ගලික මට්ටමේ ජීවත් වෙමු."

කාලය : මිනිත්තු 120යි

ගුණාත්මක යෙදවුම් :

- ශු. බයිබලයේ ශු ජොහන් 3:1-15
  1 කොරින්ති 6:12-20
  ගලාති 3:26
  පිලිප්පි 2:16
- ඇමුණුම 3.1.1ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.1.1 :

- භූමිකා රංගනයක් මගින් ක්‍රිස්තුස්වහන්සේ හා පෞද්ගලික සබැඳියාවට පත්විය හැකි ආකාරය පෙන්වීමට සලස්වන්න. නැතහොත් තමන් ක්‍රිස්තුස්වහන්සේ තුළ පෞද්ගලික මට්ටමේ ජීවත්වන ආකාරය පිළිබඳ තම අත්දැකීම් හෙළි කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහිදී මතුවන කරුණු පිළිබඳව සැලකිල්ලක් දක්වන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන අය උන්වහන්සේව අනුගමනය කරන බව. උදා: නිකදේමුස්, සමාරියේ ස්ත්‍රිය.
> - ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වූ අය මුල් සභා ඉතිහාසයේ සිටි බව. උදා: බාර්ණබස්, තිමෝති
> - ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන අය මෑත කාලවලද සිටි බව. උදා: ඉව්ලින් කානි මයිකල් රුද්‍රිගු
> - පරාර්ථකාමීත්වයෙන් යුතුව අප ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වෙමින් උන්වහන්සේ අනුගමනය කළ යුතු බව.

පියවර 3.1.2 :

- සුදුසු පරිදි පංතිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 3:1:1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් ද, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ද කංඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.1.3 :

- කුඩා කංඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - ජේසුස්වහන්සේ තුළ පෞද්ගලික මට්ටමේ ජීවත් වන අය වෘකයින් මැද බැටළුවන් මෙන් ජීවත් විය යුතු බව. (ශු මතෙව් 10:16)
> - අපගේ ශරීර පිරිසිඳු විය යුතු බව.
> - පෞද්ගලික මට්ටමින් ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වන විට ජීවිත රටාව යහපත් වන බව (1 කොරින්ති 13:11, කොලොස්සි 2:6-7)
> - ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වීමේදී තමා ශක්තිමත් වෙමින් අන්‍යයන්ද ශක්තිමත් කරන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පෞද්ගලික මට්ටමින් ජේසුස්වහන්සේ තුළ ජීවත්වන අය ජීවත් විය යුතු ආකාරය විස්තර කරයි.
- පෞද්ගලික මට්ටමින් ජේසුස්වහන්සේ තුළ ජීවත් වන විට ජීවිත රටාව යහපත් වන බව පිළිගනියි.
- මෑත කාලයේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වූ අය පිළිබඳ තොරතුරු රැස්කොට සාකච්ඡා කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 3.1.1 :

- ක්‍රිස්තුස්වහන්සේ තුළ (In Christ) පෞද්ගලික මට්ටමින් ජීවත් වීම ඉතා වැදගත්ය. එවිට නව ජීවිතයක් ගත කළ හැකිය. එහිදී අපගේ ශරීර හා සිත් පිරිසිඳුව තබා ගත යුතුය. ඒ මගින් අපගේ ජීවන රටාව යහපත් වන අතර, නිවැරදි ආකල්ප (සමානාත්මතාවය වැනි) ඇති කරගැනීමට පෙළඹේ.
- අප ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙමින් උන්වහන්සේව අනුගමනය කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. අන්‍යයන් වෙනුවෙන්ද ජීවත්වීම අපේක්ෂිතය. ඔවුන්ගේ බර දරාගත යුතුය. (ගලාති 6:2) මෙසේ ජීවත් වන විට මිනිස් ස්වභාවයන් දියුණු කොට වර්ධනය කළ හැකිය. (කොලොස්සි 3:1-17)

- යහපත් සාරධර්ම සහිතව පවුල් ජීවිතය ගත කළ යුතුය. (කොලොස්සි 3:18-25) පෞද්ගලික ජීවිතයද එසේම ගත කළ යුතුය. පාවුල් තිමෝති සැලකුවේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වූවෙකු වශයෙනි. (1 කොරින්ති 4:17-18) අප ජීවත් වූවත් මැරුණත් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා විය යුතුය. (2 කොරින්ති 5:9) ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වීම යනු උන්වහන්සේගේ කැමැත්ත අනුව දේව රාජයත්වයේ වටිනාකම් මත ජීවත් වීමය.

ඇමුණුම 3.1.2 :

- ක්‍රිස්තුස්වහන්සේ තුළ පෞද්ගලික ජීවිතයේ අප ලබන අත්දැකීම් වැදගත්ය. මෙම අත්දැකීම් සිතුවිලි වලට පමණක් සීමා නොවිය යුතුය. අපගේ ජීවන රටාව ක්‍රිස්තුස්වහන්සේ තුළ වන ජීවිතය සඳහා සාක්ෂියක් විය යුතුය. නපුර කරන්නන්ට අභියෝග කිරීමට, ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන්නන්ට හැකියාවක් ඇත. (ලූක් 10:16)
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන්නන් ජීවත්වන්නේ ශරීරයෙන් පමණක් නොව සිත්වලින් ද පිරිසිඳුවය. ඔවුහු බාහිර හා අභ්‍යන්තර ජීවිත රටා තුළින් ජේසුස්වහන්සේ හා සමාන බවට පත්වෙති.

ඇමුණුම 3.1.3

- බයිබලීය පදනම අනුව, ක්‍රිස්තුස්වහන්සේ තුළ පෞද්ගලික මට්ටමින් ජීවත් වූ අය සතුවූ ගුණාංග ලැයිස්තු ගත කරන්න.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ක්‍රිස්තුස්වහන්සේ මෙන් ජීවත්වූ අයගේ අදහස් හා ක්‍රියාකාරීත්වයන් සාකච්ඡා කොට පැහැදිලි කරයි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වන පුද්ගලයෙකු පීඩාවට පත්කරනු ලැබූ කෙනෙකු තුළ බලාපොරොත්තුව ඇති කරන අන්දම පැහැදිලි කරන්න.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන පුද්ගලයෙකු මුහුණ පාන අභියෝගයන් කවරේද?

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | ක්‍රිස්තුස් වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සබැඳියාවකින් ජීවත්වෙයි. |
| නිපුණතා මට්ටම 3.2 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමයේ බැඳීම මත ස්ථිරසාර පවුල් ජීවිතයක් ගත කරයි. |
| ක්‍රියාකාරකම 3.2 | : | "ක්‍රිස්තුස්වහන්සේ තුළ පවුල් ජීවිතයේ අනෝන්‍ය බැඳීම ඇතිකරගනිමු." |
| කාලය | : | විනාඩි 120 |
| ගුණාත්මක යෙදවුම් | : | ශුද්ධවූ බයිබලය<br>1 සාමුවෙල් 1,2 පරිච්ඡේද, උප්පත්ති 1:27-28, උප්පත්ති 2:24, රෝම 12:20<br>ශුද්ධවූ පවුලේ පින්තූරයක්<br>ප්‍රීතිය හා සතුටු සිතින් සිටින පවුල්වල පින්තූර කිහිපයක් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.2.1 :

- සිසුන්ට ශුද්ධවූ පවුලේ සාමාජිකයන් සිටින චිත්‍රයක් පෙන්වා අදහස් විමසන්න.
- එම චිත්‍රයේ ඇති පුද්ගල චරිත වල දකින ආකල්ප ගැන සිසුන් සමඟ සාකච්ඡාව මෙහෙයවන්න.

> - සියලු පවුල් දෙවිඳුන් මවනු ලැබූ බව හා දෙවියන්ව හන්සේ තුළ එම පවුල් වලට ජීවත්වීමට අණ දුන් බව.
> - බයිබලයේ දේව කැමැත්තට අනුව ජීවත්වූ පවුල් සිටිය බව. (එල්කානා, හන්නා, සාමුවෙල් තුළින් සැදුනු පවුල) 1 සාමුවෙල් 12
> - වර්තමාන සමාජය තුළ ද ක්‍රිස්තුස්වහන්සේ තුළ ය හපත් පවුල් සිටින බව.
> - වර්තමාන සමාජයේ අභියෝග මධ්‍යයේ යහපත් පවුල් ජීවිතයක් ගත කළ යුතු බව.

පියවර 3.2.2 :

- ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන පවුල් ජීවිත පිළිබඳ අදහස් දක්වයි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ හා යහපත් වටිනාකම් තුළ ජීවත්වන පවුල හා පවුල්, අභියෝගයන්ට මුහුණ දෙන බව සාකච්ඡා කරයි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන ආදර්ශමත් පවුල් වල අදාළ පුද්ගලයන් ගැන සංවාදාත්මකව සාකච්ඡා කරයි.

පියවර 3.2.3 :

- පන්තියේ සිසුන්ව කණ්ඩායම් ගවේෂනයක් සඳහා සූදානම් කරන්න.
- ඊට අදාළ උපදෙස්, පවුල් ජීවිත හා දේවරාජ්‍ය තුළ වර්ධනය කරගන්නා ආකාරය විමසන්න.
- කණ්ඩායම් 4කට සිසුන් බෙදන්න.

- එක් එක් කණ්ඩායම් වලට මාතෘකා 4ක් දී කණ්ඩායමේ අදහස් ලියා දැක්වීමට සලස්වන්න.

<table><tr><td>

- දේව සමානත්වයෙන් මනුෂ්‍යත්වය තුළ අපව මවා තිබීම කරණකොටගෙන යහපත් පවුලක් ලෙස ජීවත්විය යුතු බව
- පවුල් ජීවිතය තුළ එකිනෙකා කෙරෙහි, පිළිගැනීම, ආදරය, ගරුත්වය තිබිය යුතු ලක්ෂණයක් බව (මව්පියන්, දරුවන්) එපීස 5:25-33
- දේව රාජ්‍යයේ වටිනාකම් අගයමින් පවුලක් තුළත්, වැඩිහිටියන් හා අන්‍යයන් අතරත් ගැටළු ඇතිනොවන සේ මුදල් මත එය නොකළ යුතු බව
- විවිධ අභියෝග බාධක මැද ආදර්ශමත් පවුලක් ලෙස ජීවත්වීම යුතු බව. (ශු පාවුල් මෙන්)

</td></tr></table>

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වන (කිතුනු) පවුල් හා ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් නොවන පවුල් අතර ඇති වෙනස්කම් ලැයිස්තු ගත කරයි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ පවුල් ජීවිත ගත කරන විට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න හා ඒවාට මුහුණ දෙන අන්දම පැහැදිලි කරයි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වන පවුල් කෙරෙන් ප්‍රදර්ශනය වන යහපත් දැ ලියා දක්වයි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වන පවුල් පිළිබඳ තොරතුරු ලබාගෙන ඒ පිළිබඳ කරුණු එක්රැස් කරයි.

කණ්ඩායම් ගවේෂණයට උපදෙස් :

ඇමුණුම 3.2.1 :

- මනුෂ්‍යත්වයේ පැවැත්ම රඳා පවතින්නේ පවුල් ජීවිතය තුළය. සමාජයේ මූලික පුරුක වන්නේ පවුලය. විශේෂයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන පවුල් මෙන් වඩා යහපත් ලෝකයක් තැනීමේ වගකීම හිමිවේ.
- දෙවියන්වහන්සේ මැවූ පුරුෂයා හා ස්ත්‍රීය දේව සමානත්වයෙන් හා දේව ස්වරූපයෙන් මැව්වේ ලෝකය රැකබලාගනිමින් ලොව සශ්‍රික කරනු සඳහාය.
  උත්පත්ති 1:26,27
  උත්පත්ති 2:15
- පවුල් සම්බන්ධතාවය ඉතා වැදගත්ය.
  උත්පත්ති 2:23-25
- ස්වාමිපුරුෂයා හා භාර්යාවගේ ආදරයේ තිළිණයක් ලෙස දරුවා සැලකිය හැකිය.
  අපගේ දරුවන් වර්තමානයේ ජේසුස්වහන්සේගේ ස්වරූපයෙන් ඇතිදැඩි කළ යුතුය. අපද ශුද්ධ පවුල ලෙස ජීවත්විය යුතුය.
  රෝම 12:10
  ලූක් 1,2 පරිච්ඡේද

- පවුලේ සාමාජිකයන් අතර ගැටුම් ඇතිවන විට දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ඒවා සමථයකට පත් කරගත යුතුය.
- සාමාජිකයන්ට ගරු නොකිරීම, ප්‍රචණ්ඩත්වය, උදාර මනුෂ්‍යත්වය ප්‍රතික්ෂේප කිරීම, මානව අයිතිවාසිකම් උල්ලංඝනය නැවැත්විය යුතුය. පවුලේ වර්ධනය උදෙසා මත්ද්‍රව්‍ය, අල්ලස, දෑවැද්ද, කුලභේදය, පුරුෂාධිපත්‍යය අනුමත කළ නොහැක. වර්තමාන අවශ්‍යතාවය වන්නේ සියලුම පවුල් ශුද්ධ පවුල මෙන් යහපත් ලෙස ජීවත් වීමය.
  කොලොස්සි 3:18
  එපීස 5:22
  පේදුරු 2:18, 3:7

ඇමුණුම 3.2.2

- ගැටළු වලට මුහුණ දුන් පවුල් ගැනද, ඔවුන් (බයිබලයේ ඇති කතන්දර) යේසුස් වහන්සේ තුළ ජීවත්වූ අන්දම ගැනද අදහස් දක්වයි. උදා: ක්‍රියා 15:16, ලිදියා

නිපුණතාව 3.0 : ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සබැඳියාවකින් ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.3 : සමාජ මට්ටමේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වෙයි.

ක්‍රියාකාරකම 3.3 : "සමාජයක් ලෙස ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වෙමු."

කාලය : විනාඩි 80 යි

ගුණාත්මක යෙදවුම් : ශුද්ධවූ බයිබලය, ක්‍රියා 4:32:35
මාකර් පෑන්, ඩිමයි කඩදාසි
සකස් කළ සැණපත්, මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, පුවත් පත් ලිපි

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.3.1 :

- ජේසුස්වහන්සේ තුළ විවිධ සමාජ මට්ටමේ ජීවත් වූ අය ගැනද අපගේ ජීවිත පිළිබඳ ද විමසන්න.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ සමාජයක් ලෙස ජීවත්වීම මුල් කරගෙන පහත දැක්වෙන කරුණු ආශ්‍රයෙන් සාකච්ඡාව මෙහෙයවන්න.

- ක්‍රිස්තුස් වහන්සේ තුළ සමාජය හැමවිටම යුක්ති ගරුක සමාජයක් බව. ක්‍රියා 34, 35, මතෙව් 25
- අප සමාජ මෙහෙවරයෙහි යෙදී සිටිය යුතු බව
- සමාජ මෙහෙවර ගැන දැනුවත් කරමින් පරිවර්තනය විය යුතු බව.
- පරාර්ථකාමිත්වයෙන් යුතුව අප ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත් වෙමින් උන්වහන්සේව අනුගමනය කළ යුතු බව.
- අභියෝග වලට මුහුණ දෙමින් සමාජ පරිවර්තනය කළ යුතු බව.
  උදා: මහත්මා ගාන්ධි, .................

පියවර 3.3.2 :

- සියලු සිසුන්ට පෙනෙන ආකාරයට සැණපත් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සැණපත් වල සඳහන් කර ඇති මාතෘකා සාකච්ඡා කරන්න.
- සිසුන් ගෙනෙන ලද පුවත්පත් වල ඇති පහත සඳහන් මාතෘකා වෙන්කරන්න උපදෙස් දෙන්න.
- මාකර් පෑන්, බ්‍රිස්ටල් බෝඩ්, ගම්, සිසුන්ට ලබාදෙන්න.
- කාර්යය පවරා බිත්ති පුවත්පත නිර්මාණය කිරීමට සූදානම් කරන්න.
- කාර්යයේදී එක් එක් සිසුවාව නිරීක්ෂණය කරන්න.

පියවර 3.3.3 :

- සමාජයක් වූ කලී විවිධ ආකල්ප හා හැසිරීම් වලින් යුක්ත වූවක් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- ඇමුණුම් සාකච්ඡාවට භාජනය කරමින් ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් දැක්වීමට සලස්වන්න.
- සැණපත් මගින් සමාජ අගයන් පන්තියට නිරූපණය කරන්න. (ඉදිරිපත් කරන්න)
- අප අනුමත නොකරණ කරුණු ඉදිරිපත් කරන්න.

> - වර්තමාන සමාජය ආකල්පමය වශයෙන් ක්‍රමයෙන් පරිහානිය කරා ලඟා වන බව.
> - ඊර්ෂ්‍යාව, අල්ලස, ආත්මාර්ථකාමීබව, ක්‍රිස්තුස්ව හන්සේ තුළ අපට අනුමත කළ නොහැකි බව.
> - යහපත් සමාජයක් සඳහා සමාජය පරිවර්තනය විය යුතු බව.
> - සාධාරණ හා යුක්තිගරුක සමාජයක ලක්ෂණ විය යුත්තේ සමානාත්මතාවය, ප්‍රේමය හා විමුක්තිය බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන සමාජයක තිබිය යුතු ගුණාංග පැහැදිලි කරයි.
- කිතුනු පවුලක තිබිය යුතු අනන්‍යතාවය පැහැදිලි කරයි.
- වර්තමාන ශ්‍රී ලංකාව තුළ ඔබ යෙදෙන සමාජ මෙහෙවර පිළිබඳ අදහස් ලියා දක්වයි.
- සමාජ මෙහෙවරදී ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග සාකච්ඡා කරයි.
- අභියෝග වලට මුහුණ දීමට කිතුනු පවුලක අනන්‍යතාවය ශක්තිමත් වීම ඉවහල් වන අයුරු පැහැදිලි කරයි.

ඇමුණුම 3.3.1 :

- ක්‍රිස්තුස්වහන්සේ තුළ සමාජයක් ලෙස ජීවත්වීමේදී "ගැලවීම අපට පමණක්ය" යන පරිසිවරුන්ගේ ආකල්පයෙන් බැහැරව වර්තමාන සමාජ සංදර්භය තුළ ජීවත්විය යුතුය. සමාජ ජීවිතයේදී අපගේ භූමිකාව පෞද්ගලිකවද, පවුලක් ලෙසද රඟ දැක්විය යුතුය. ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන සමාජය, මිනිස් අයිතිවාසිකම් ගරු කිරීම හා උතුම් මනුෂ්‍යත්වය ගරු කිරීම දක්නට ලැබෙන යහපත් සමාජයක් බිහිකරලීම සඳහා කටයුතු කරයි. සමාජ සේවයේ යෙදීම සමාජයේ දුක් විඳින අයට උපකාර කළ හැකි ක්‍රමයකි. දුක් විඳින අය තුළින් ක්‍රිස්තුස්වහන්සේ හමුවීම අත්‍යවශ්‍යය. මතෙව් 25:31-46 එහෙත් සමාජ සේවයට පමණක් සීමා නොවී සමාජ පරිවර්තනය සඳහා ක්‍රියා කිරීමෙන් පමණක් යුක්තිගරුක සමාජයක් බිහිකරලීමට හැකියාව ලැබේ.

- සමාජ පරිවර්තනය සිදුකිරීමට අඛණ්ඩව ක්‍රියාකාරී විය යුතුය. මුල් සභාවෙහි ජීවන රටාව පදනම් වූයේ සමානාත්මතාවය හා යුක්තිගරුක සමාජය යන කරුණු මතය. එහෙත්, ක්‍රිස්තුස්වහන්සේගේ, ක්ෂණික දෙවන ආගමනය බලාපොරොත්තුව සිටීම හා යාච්ඤාවට පමණක් සීමාවී ක්‍රියාත්මකව කටයුතු නොකිරීම නිසා මෙම යුක්තිගරුක සමාජය අඛණ්ඩව නොපැවතුණි. ඒ නිසාම වර්තමානයේදීද ක්‍රිස්තියානි සභාව/සමාජය ආයතන ගත වී ඇත. මේ තත්ත්වය තුළ සමාජ පරිවර්තන ක්‍රියාවලියෙහි නොකඩවා යෙදීම යුගයේ ක්ෂණික අවශ්‍යතාවයයි.
- දේව රාජ්‍යත්වයේ වටිනාකම් සියලුදෙනාම අවබෝධ කරගත යුතුය. එසේම වර්තමාන සමාජ තත්ත්වයද සියලු දෙනාම අවබෝධ කරගත යුතුවේ. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්විය යුතුය.
- සමාජය යුක්තිගරුක කිරීම සඳහා වෙහෙසිය යුතුය. මේ සඳහා දේව කරුණාව තුළ ධෛර්‍යය හා ශක්තිය ලැබේ.

ඇමුණුම 3.3.2

විවාදයක් පවත්වන්න

1 හා 2 කණ්ඩායම් - මාතෘකාව
ක්‍රිස්තුස්වහන්සේ ජීවත්වන සමාජයේ මෙහෙවර විය යුත්තේ සමාජ සේවයයි/සමාජ පරිවර්තනයයි.
3 හා 4 කණ්ඩායම්
සමාජ පරිවර්තනය සඳහා වන විමුක්ති අරගලයේ යෙදීමට දැනුවත්භාවය අවශ්‍යවේ/නොවේ.

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු දෙනා සමඟ යහපත් සබැඳියාවකින් ජීවත් වේ. |
| නිපුණතා මට්ටම 3.4 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ ජීවිත රටාව තුළින් දේව රාජ්‍යත්වයෙහි වටිනාකම් බෙදා ගනියි. |
| ක්‍රියාකාරකම 3.4 | : | "ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ ජීවිත රටාව තුළින් දේව රාජ්‍යත්වය බෙදා ගනිමු". |
| කාලය | : | විනාඩි 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 3.4.1 ඇතුළත් දේව රාජ්‍යයේ වටිනාකම් අඩංගු සැණපත්<br>• ඇමුණුම 3.4.2 ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාවේ පිටපත් හතරක්<br>• ඩිමයි කඩදාසි හා මාකර් පෑන්<br>• බයිබලය - ජොහන් 17:16-34, 28:1-10, 12:20-26, මතෙව් 8:5-13 |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ලබාදෙන්න. | : | • දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ පවසන සැණපත්<br>• ඔබ විසින් පිළියෙළ කරගත් සැණපත් එකින් එක පන්තියට ඉදිරිපත් කර ඒවායේ සඳහන් ප්‍රකාශන පිළිබඳ සිසු අදහස් විමසන්න.<br><br>• ක්‍රිස්තුස්වහන්සේ තුළ දේව රාජ්‍යයේ වටිනාකම් බෙදාගැනීම අපගේ යුතුකමක් බව.<br>• දේව රාජ්‍යත්වය තුළ බයිබලයට අනුව අපගේ ජීවිත ගත කළ යුතුය බව (ස්නාවක ජොහන්/ජේසුස්ව හන්සේ/පේදුරු)<br>• මෑත ඉතිහාසයේ දේව රාජ්‍යයේ වටිනාකම බෙදාගත් නායකයින් සිටි බව. (උදා: ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, ඩොනල්ඩ් කනගරත්නම් පියතුමා, දේවා සූරියසේන)<br>• ක්‍රිස්තුස්වහන්සේ අද අප රටට පැමිණියහොත් අදාළ අයුරින් දේව රාජ්‍ය වටිනාකම් බෙදා ගන්නා බව. |
| පියවර 3.4.2 | : | • පන්තිය කුඩා කණ්ඩායම් හතරකට වෙන් කරන්න.<br>• කණ්ඩායම් ගවේෂණ උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කුඩා කණ්ඩායම් වලට ලබා දෙන්න.<br>• 2.4.1 හා 2.4.2 ඇමුණුම ලබා දෙන්න.<br>• කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදන්න.<br>• කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න. |
| පියවර 3.4.3 | : | • කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න. |

- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම් වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- මාංශවත් වීමේ ආදර්ශය තුළින් අපගේ ජීවිතයේදී දේව රාජ්‍යයෙහි වටිනාකම් අන්‍යයන් සමඟ බෙදා ගත යුතු බව
- විවිධ සංදර්භයන් තුළ අදාළ වන ආකාරයෙන් දේව රාජ්‍යත්වයෙහි වටිනාකම් බෙදාගත යුතු බව.
  ජේසුස්වහන්සේ - ග්‍රීක් - ජොහන් 12:20-26
  ශතාධිපතියා - මතෙව් 8:5-13, පාවුල් - ක්‍රියා 17:16-34 මෝල්ටා - 28:1-10
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ශ්‍රී ලාංකික සංදර්භය අනුව දේව රාජ්‍ය වටිනාකම් බෙදා ගත යුතු බව.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ දේව රාජ්‍යයෙහි වටිනාකම් අදාළ වන ආකාරයෙන් බෙදා ගැනීමේදී ශ්‍රී ලාංකීය ක්‍රිස්තුස්වහන්සේ තුළ එය පූර්ණත්වයට පත් කළ හැකි බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- "දේව රාජ්‍යයේ වටිනාකම් බෙදා ගැනීම අපගේ යුතුකමකි." යන්න පැහැදිලි කරයි.
- දේව රාජ්‍ය වටිනාකම් බෙදා ගත හැකි විවිධ ආකාර සාකච්ඡා කොට එකතු කරයි.
- විවිධ අභියෝග මධ්‍යයේ දේව රාජ්‍ය වටිනාකම් සමඟ ජීවත්වීමට තීරණය කොට එය අන් අය සමඟ බෙදා ගනියි.
- ඔබගේ පාසල් සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කරුණු ලැයිස්තු ගත කරයි.

කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස් :

- ඔබට ලැබෙන සැණපත් කෙරේ අවධානය යොමු කරන්න.
- ඉන් කියවෙන වැදගත් පාඨ ඉස්මතු කර ගන්න.
- ඇමුණුම 3.4.1 හා ඇමුණුම 3.4.2 භාවිතා කොට කරුණු සාකච්ඡා කොට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 3.4.1

- ප්‍රේමය, යුක්තිය, කරුණාව, විමුක්තිය යන දේව රාජ්‍යයේ වටිනාකම් අන් අය සමඟ බෙදා ගැනීමට කාලය අභියෝග කරනු ලැබූ සේක. වර්තමාන සංදර්භයට අනුව අප එය බෙදා ගත යුතුය. ජේසුස්වහන්සේ හා ජේසුස්වහන්සේගේ ගෝලයන් තමන්ගේ ජීවිත තුළින් එය ඉදිරිපත් කරන්නේ මාංශවත් වීමේ ආකෘතිය ලෙසිනි.

- ජේසුස්වහන්සේ මිනිසත් බව රැගෙන ලෝකයේ අප සමඟ වාසය කළ සේක. නපුරට විරුද්ධව යුක්ති සහගත දේ සඳහා කටයුතු කරන ලදී. මෙසේ ජේසුස්වහන්සේගේ ක්‍රියාකාරිත්වයන්, ඉගැන්වීම, ජීවන රටාව සාමාන්‍ය ජනතාවට ගැලපිණි. ජේසුස්වහන්සේ මේ තුළින්ද පෙන්නුම් කරන්නේ මාංශවත් වීමේ ආකෘතියයි.

- වර්තමාන සංදර්භය තුළ දේව රාජ්‍යයේ වටිනාකම් බෙදා ගැනීම හොඳින් දැන සිටීම වැදගත්ය. විවිධ ජන වර්ග (සිංහල, දෙමල, මුස්ලිම්) විවිධ භාෂා (සිංහල-දෙමල-ඉංග්‍රීසි) විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම තුළින් දේව රාජ්‍යත්වයේ වටිනාකම් බෙදා ගත යුතුය. සංවර්ධිත තාක්ෂණික ක්‍රම උදා: රේඩියෝ, චිත්‍රපට, පෝස්ටර්, වීදි නාට්‍ය මගින් මෙය ප්‍රකාශ කළ හැකිය. මෙසේ දේව රාජ්‍යත්වයේ වටිනාකම් බෙදා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වන්නේ ශ්‍රී ලාංකික ක්‍රිස්තුස්වහන්සේ අප අනාවරණය කරගත් පසුවය.

- ජේසුස්වහන්සේ පලස්තීනයේ උපත ලැබ එහි ජීවත් වූ සේක. උන්වහන්සේගේ ඉගැන්වීම් හා ක්‍රියාවලිය ඉතා සුදුසු වූයේ එතුමන් ජීවත්වූ කාලයට හා ජීවත් වූ ප්‍රදේශයටය. එතුමා අද අප ශ්‍රී ලාංකික සමාජයට පැමිණියහොත් කුමක් පවසාවිදැයි? අපි දනිමු. මේ පදනම මත අපට ශ්‍රී ලාංකික ක්‍රිස්තුස්වහන්සේ හඳුනා ගත හැකිය. ඉතිහාසය තුළ අපි පලස්තීනයේ ජේසුස්වහන්සේ දුටුවා මෙන්ම ශ්‍රී ලාංකික ජේසුස්වහන්සේද අපගේ සාමාන්‍ය ජීවිත තුළ හමුවීම වැදගත් වේ. අපි සැවොම ශ්‍රී ලාංකික ක්‍රිස්තුස්වහන්සේ හඳුනා ගත් විට දේව රාජ්‍යයේ ගුණාංග බෙදාගැනීම පරිපූර්ණ වේ.

ඇමුණුම 3.4.2

පහත කරුණු ගැන සාකච්ඡා කොට ඉදිරිපත් කරන්න.

1. දේව රාජ්‍යයේ වටිනාකම් බෙදා ගැනීම පිළිබඳව බයිබල් චින්තනය අනුව සොයා බලන්න.
2. අපට දේව රාජ්‍ය වටිනාකම් බෙදා ගැනීම කළ හැක්කේ කෙසේද යන්න සාකච්ඡා කොට ලැයිස්තු ගත කරන්න.
3. දැනටමත් දේව රාජ්‍ය වටිනාකම් බෙදා ගැනීම කළ පුද්ගලයින් හමුවී සාකච්ඡා කොට ඔවුන්ගෙන් කරුණු එකතු කරන්න.
4. දේව රාජ්‍ය වටිනාකම් අද අප රට තුළ බෙදා ගැනීම සඳහා දැනට සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කොට තීරණය කරමින් අන් අයට පවසන්න.
   උදා: අප ගායනා කළ යුතු ගීත, අප ඇඳුම් පැලඳුම්, පල්ලිය සකස් කරන ආකාර, අප භාවිතා කළ යුතු හා නොකළ යුතු දෑ.

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සබැඳියාවකින් ජීවත් වෙයි. |
| නිපුණතා මට්ටම 3.5 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ දිළිඳුකමට ප්‍රතිචාර දක්වයි. |
| ක්‍රියාකාරකම 3.5 | : | "ක්‍රිස්තුස්වහන්සේ තුළ දිළිඳුකම මුලිනුපුටා දැමීමේ ක්‍රියාවලියට සම්බන්ධ වෙමු". |
| කාලය | : | මිනිත්තු 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | ශු බයිබලය<br>ඩිමයි කඩදාසි<br>මාකර් පෑන් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.5.1 :

- දිළිඳුකමට හේතු හා ප්‍රතිවිපාක සිසුන් දකිනාකාරයෙන් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න.
- ඒ පිළිබඳව සිසුන්ගේ අදහස් ලබාගන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - අප රටේ බහුතරය දිළිඳුකම හේතුවෙන් දුක් කරදර වලට මුහුණ දෙන බව.
> - දිළිඳුන්ට උපකාර කිරීම අත්‍යාවශ්‍ය බව.
> - ඇතැම් ආයතන හා පුද්ගලයින් දිළිඳුන්ට උපකාර කළ ත් දිළිඳුකම පහත දැමිය නොහැකි බව.
> - දිළිඳුන්ට උපකාර කිරීම මගින් ඔවුන්ට ජීවත්වීමට උදව් කළ හැකි බව.

පියවර 3.5.2 :

- සුදුසු පරිදි පංතිය කුඩා කණ්ඩායම් වලට බෙදන්න.
- ඇමුණුම 3.5.1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.5.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ

- සියලුදෙනාම සමානත්වයෙන් යුතුව දෙවිඳුන් මැවූවත් ස්වල්ප දෙනෙකුගේ වැරදි ක්‍රියා නිසා දිළිඳුකම ඇතිවන බව.
- දිළිඳුන්ට උපකාර කිරීම ප්‍රමාණවත් නොවන අතර යුක්තිගරුක සමාජයක් බිහි කළ යුතු බව. රෝම 15:26, 2 කොරින්ති 8:1-2, ගලාති 2:10
- දිළිඳුන් දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස සළකා ඔවුන්ට උදව් කිරීම හා ධනවතුන් ඔවුන් සමඟ එක්ව හඳුනාගෙන දිළිඳුන්ගේ ජීවිත සඳහා කටයුතු කිරීම වැදගත් බව.
- දේව රාජ්‍යයේ මෙහෙවර තුළ ස්වේච්ඡාවෙන්ම දුක් විඳින අය සිටින බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- "ලෝකයේ සම්පත් මිනිස් අවශ්‍යතාවයන් සඳහා විනා තණ්හාවෙන් යුතු මිනිසුන් සඳහා නොවේ"- මහත්මා ගාන්ධි. මෙම ප්‍රකාශනයට අනුව බොහෝ දෙනෙකුගේ දිළිඳුකමට හේතුව කීපදෙනෙකුගේ තණ්හාව බව අන්‍යයන්ට පැහැදිලි කරයි.
- දිළිඳුන්ට උපකාර කිරීම යහපත් නමුත් එය ප්‍රමාණවත් නොවන බවට දිළිඳුන් සමඟ සාකච්ඡා කොට ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස් ලබා ගනියි.
- ක්‍රිස්තුස්වහන්සේ තුළ සමාජයක් ලෙස ජීවත් වෙමින් විමුක්ති ගමනේ අධ්‍යාත්මික පූර්ණත්වයෙන් යෙදෙන අතර දිළිඳුන් වෙනුවෙන් කළ හැකිදේ අදාළ පුද්ගලයින් සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ අදහස් අන්‍යයන් සමඟ බෙදා ගැනීමට තීරණය කරයි.
- ධනවත් සිසුන් සඳහා පමණක් අධ්‍යාපනය දීමට පාසල් තිබීම වැරදි බව සාකච්ඡා කරයි.

3.5.1 ඇමුණුම :

- දිළිඳුකම, දෙවිඳුන් මැවූ මිනිසාගෙන් තොරවූවක් නොවේ. බෙදා නොගැනීම, මානව අයිතීන් උල්ලංඝනය කිරීම, වංචාව හා සොරකම ආදී ක්‍රියාවල සුළුතරයක් යෙදීම නිසා වැඩි දෙනෙකු දිළිඳු බවට පත්ව ඇත. තමන්ගේ මූලික අයිතීන් සපුරා ගත නොහැකි අයද දිළිඳුන් ලෙස සැලකේ. ප්‍රේමය බෙදා නොගැනීම නිසා දිළිඳු වූ අය අන්ත දිළිඳුන් ලෙස සැලකිය හැකිය.
- දිළිඳුන්ට උපකාර කිරීම යහපත් සමාජ මෙහෙවරකි. එහෙත් ඔවුන්ට පූර්ණ ජීවනය ලැබෙන්නේ යුක්තිගරුක සමාජයක් ඇතිවීමෙන් පමණි.
- ධනවතුන්ට දේව රාජ්‍යයට ළඟාවිය හැක්කේ දිළිඳුන් සමඟ සියල්ල බෙදා ගැනීමෙන් පමණය. ලූක් 12:13-21, ලූක් 16:19-31, ලූක් 18:18-36, ලූක් 19:1-10, ලූක් 6:20 හා මතෙව් 5:3 සඳහන් ලෙස දේව රාජ්‍යය උරුම කරගන්නා නිසා දිළිඳුන් භාග්‍යවන්තය. එහෙත් දිළිඳුන් ද තමන් දේව රාජ්‍යයේ වටිනාකම් වලට අනුව ජීවත් වන්නේදැයි සැක හැර ගැනීමට ප්‍රවේශම් විය යුතුය. මතෙව් 22:1-14

- දිළින්දෝ හැමවිටම දෙවිඳුන් කෙරේ බලා සිටිති. දරුවන් දෙමාපියන් වෙතින් යැපෙන්නාක් මෙන් දිළිඳු අය දෙවිඳුන් කෙරේ බලා සිටිති. "අපගේ දිනපතා භෝජනය අපට අද දුන මැනව." යනුවෙන් අප යාච්ඤා කරන්නේ අප දෙවිඳුන් වෙතින් යැපෙන බැවිනි. මතෙව් 6:11
- දිළිඳුන් තුළ අධ්‍යාත්මික වටිනාකමක් දැකිය හැක්කේ ඔවුන් සම්පූර්ණයෙන්ම දෙවිඳුන්ගෙන් යැපෙන බැවිනි.
- සරලව ජීවත් වෙමින්, දිළිඳුකම ජීවන රටාව ලෙස සැලකූ ඇතැම් දිළිඳු අය, අධ්‍යාත්මිකත්වයෙන් යුතුව ජීවත් වෙති. එබැවින් සම්පූර්ණයෙන් දෙවිඳුන් වෙතින් යැපෙමින්, දේව රාජ්‍යත්වය සඳහා ක්‍රියා කරමු.

ඇමුණුම 3.5.2 : • දෙදෙනා බැගින් කණ්ඩායම් වලට බෙදා විවාදයක් පවත්වන්න.

1 කණ්ඩායම : ✡ "දිළිඳුන් දුක්විඳීමට හේතුව බෙදා නොගැනීම හා ධනවතුන්ගේ පෙළීමට ලක්වීමය."

හා ✡ "දිළිඳුන් දුක් විඳීමට හේතුව අලස භාවය හා සැලසුම් විරහිත භාවයයි."

2 කණ්ඩායම ✡ ධනවත් දරුවන් සඳහා පාසල් ඇතිකිරීම නිවැරදිය/වැරදිය.

3 කණ්ඩායම : ✡ දෙවිඳුන් කෙරේ යැපීමේ දිළිඳුන්ගේ අධ්‍යාත්මිකත්වය අති යහපත්ය/අති යහපත් නොවේ.

හා

4 කණ්ඩායම : ✡ දිළිඳුන්ගේ තත්ත්වය වෙනස් කළ හැකි සුදුසුම මාර්ගය වන්නේ යුක්තිගරුක සමාජයක් සඳහා වන විමුක්ති ගමනය/එසේ නොවේ.

නිපුණතාව 3.0 : ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සබැඳියාවකින් ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.6 : ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වාභාවික ව්‍යසනයන්ට මුහුණ දෙයි.

ක්‍රියාකාරකම 3.6 : "ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වාභාවික ව්‍යසනයන්ට මුහුණ දෙමු."

කාලය : මිනිත්තු 80යි

ගුණාත්මක යෙදවුම් :
- ශ්‍රී ලංකාවේ මෑතදී ඇතිවූ ස්වාභාවික ව්‍යසන පිළිබඳ සවිස්තරාත්මක පුවත් පත් ලිපි
- ඒ පිළිබඳ ඡායාරූප
- ඇමුණුම 3.6.1ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.6.1 :
- පුවත් පත් ලිපි හා ඡායාරූප පන්තියට ඉදිරිපත් කරන්න.
- ස්වභාවික ව්‍යසන වලට මුහුණ පෑම හා මුහුණ පෑ අයට උපකාර වීම පිළිබඳ ඔවුන්ගේ හැඟීම් හා සිතුවිලි විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ව්‍යසනයක් වූවොත් ඊට මුහුණ දීම දුෂ්කර වූවත් ධෛර්යයෙන් යුතුව ඊට මුහුණ දිය යුතු බව.
> - ව්‍යසනයන්ට මුහුණ දුන් අය සමඟ එක්ව ඔවුන්ට උදව් කළ යුතු බව.
> - මුල් කිතුනුවන් ව්‍යසනයන්ට සාර්ථකව මුහුණ දුන් බව. ක්‍රියා 11:27-30
> - ඒ පිළිබඳ දැනුවත් කිරීම මගින් ව්‍යසන හා ඒවායේ ප්‍රතිඵල අවම කිරීමට කටයුතු කළ යුතු බව.

පියවර 3.6.2 :
- පන්තිය කුඩා කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ඇමුණුම 3.6.1 ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.6.3 :
- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.

- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • පාරිසරික සමතුලිතතාවය සහිතව දෙවිඳුන් මැවූ ලෝකයේ මිනිසාගේ වගකීම වන්නේ එම පාරිසරික සමතුලිතතාවය රැකගැනීම බව<br>• මිනිසාගේ වගකීමෙන් තොර ක්‍රියා කලාපයන් නිසා ස්වාභාවික ව්‍යසන හෝ ඊට සමාන ව්‍යසන සිදුවන බව<br>• මිනිස් ක්‍රියාකාරීත්වයන්හී ප්‍රතිඵල හා මිනිසාට පාලනය කළ නොහැකි හේතුන් නිසා ස්වාභාවික ව්‍යසන සිදුවන අතර, දෙවිඳුන් නැවත පරිසරය යථා තත්ත්වයට පත් කරන බව<br>• දේව මැවිල්ල නවීකරණය කිරීම තුළ ව්‍යසනයන්ට ගොදුරු වූවන් ශක්තිමත් කරනු ලැබීම සඳහා මනෝ සමාජයීය සහයෝගිතාවය ලබා දෙමින් දෙවිඳුන් තුළ ඇදහිල්ල හා විශ්වාසය වර්ධනය කළ යුතු බව |

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- දුෂ්ට මිනිසුන් විනාශ කිරීම සඳහා දෙවිඳුන් සුනාමිය වැනි ස්වාභාවික ව්‍යසන ඇති නොකරන බව සාකච්ඡා කරයි.
- සවන්දීම හා බෙදා ගැනීම තුළින් පීඩාවට පත්වූවන් සමඟ යහපත් මිත්‍ර සම්බන්ධතාවයක් ගොඩ නගා ගනී.
- ස්වාභාවික ව්‍යසනයන්ගෙන් ආරක්ෂා වීමට හෝ ඒවා අවම කර ගැනීමට කළ යුතු දෑ අන්‍යයන් සමඟ සාකච්ඡා කරයි.
- දේව රාජ්‍යත්වයේ වටිනාකම් අනුව, ව්‍යසනයන්ට ගොදුරුවූවන්ට නව ජීවිතයක් උදා කරලීම සඳහා යහපත් සමාජයක් ගොඩ නැගීමට තීරණය කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්
ඇමුණුම 3.6.1 :

- සමාජයක හෝ රටක සිදුවන බේදවාචකයන් නිසා මිනිසා දුකට වේදනාවට කරදරයට පත්වේ නම් ඒවා ව්‍යසන ලෙසින් හැඳින්විය හැකිය. මෙම ව්‍යසන වර්ග කිරීමේදී
  ස්වාභාවික ව්‍යසන
  ස්වාභාවික නොවන ව්‍යසන යනුවෙන් වර්ග කළ හැකිය.
- මුල් කිතුනුවන්ට ද ස්වාභාවික ව්‍යසන වලට මුහුණ පෑමට සිදුවිය. ජුදයේ ඇතිවූ සාගතයේදී ආධාර එකතු කොට පාවුල් හා බාර්ණබස් අත ඒවා යවන ලදී.

- මිනිසාගේ වගකීමෙන් තොර ක්‍රියා කලාපයන් ස්වාභාවික ව්‍යසනයන්ට හේතුවන බවට සමීක්ෂණ වලින් කරුණු හෙළිදරව් වෙමින් පවතී. මිනිසුන් වශයෙන් ආරක්ෂාව හා මූලික අවශ්‍යතාවයන් සැපයේ නම් ස්වාභාවික ව්‍යසනයන් ගෙන් ආරක්ෂා වීමට හෝ ඒවායේ ප්‍රතිඵල අවම කරගැනීමට හැකිවනු ඇත. සුනාමිය පැමිණෙන විටම ඒ පිළිබඳ අනතුරු සංඥා ලැබුනේ නම් අනතුරු අවම කරගැනීමට හැකියාව තිබුනි.
- ස්වාභාවික ව්‍යසනයන්ට මුහුණ පෑ අය රැකබලාගත යුත්තේ උදාර මනුෂ්‍යත්වය රැකෙන පරිදිය. පුනරුත්ථාපන කඳවුරු වල හා සුබසාධන මධ්‍යස්ථාන වල මිනිස් වටිනාකම් නොසැලකීම හා ඉඩ පහසුකම් පිළිබඳ ප්‍රශ්නද, නොමිනිස් ගති මතුවීම ද නිසා ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය. ව්‍යසනයන්ට මුහුණ පෑ අයගේ අභ්‍යන්තර කැළඹිලි තත්ත්වයන් ගෙන් ප්‍රයෝජන ගනිමින් ඇතැමෙක් ඔවුන් ආගම් වලට හරවා ගැනීමටද, විවාහ කර ගැනීමටද කාන්තාවන්ට හා දරුවන්ට අතවර කිරීමටද, ඉඩකඩම් හා දේපළ ලියවා ගැනීමට ද කටයුතු කරති. එහෙත් එය නොකළ යුතුය.
- පීඩාවට පත්වූවන්ට උපකාර කිරීම හා මානසික සහනයක් ලබාදීම ඉතා වැදගත්ය. ඔවුන් තුළ ජීවිතයට මුහුණ දීමේ ශක්තිය ගොඩ නැගිය යුතුය. ඔවුන්ට ජීවිතය ජය ගැනීම සඳහාත්, දෙපයින් නැගී සිටීමටත් උදව් කළ යුතුය. ඒ සඳහා ඇදහිල්ල හා විශ්වාසය තහවුරු කළ යුතුය. මිනිසකු නිවැරදි මගට යොමු කිරීම සඳහා, දෙවිඳුන් ස්වාභාවික ව්‍යසන යොදා ගන්නා බව පැවසීම වැරදිය. ඒවායේදී අහිංසක දරුවන් මරණයට පත් වන බැවිනි. එය දෙවිඳුන් පිළිබඳ සැබෑ අනන්‍යතාවය නොවේ. මන්ද දෙවිඳුන් ප්‍රේමයේ දෙවිඳුන් වන බැවිනි.

ඇමුණුම 3.6.2 :

- ස්වාභාවික ව්‍යසන වලට අදාළව අප රටේ සිදුවන ඛේදවාචකයන් වර්ග කොට, සාකච්ඡා කොට, ඒ පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- ව්‍යසනයන්ට ගොදුරු වූවන්ට නව ජීවිතයක් ලබාදීමට කළ යුතු දෑ පෙළ ගස්වන්න. (සුනාමි)
- සුනාමියෙන් පීඩිත වූවන් වැරදි ලෙස යොදවා ගත් අයගේ ක්‍රියා කලාපයන් නතර කිරීමට කළ යුතු දෑ පැහැදිලි කරන්න.
- ස්වාභාවික ව්‍යසන අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳව අදාළ බලධාරීන් හා සාකච්ඡා කොට, සිදුවන විනාශය වැළැක්වීමට හෝ ඉන් මිදීමට ඒවා අදාළ කරගත හැකි ආකාරය අන්‍යයන් සමඟ බෙදා ගන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලන් හා යහපත් සබැඳියාවකින් ජීවත් වෙයි. |
| නිපුණතා මට්ටම 3.7 | : | ක්‍රිස්තුස්වහන්සේ තුළ හිංසනයට හා පීඩා කරනු ලැබීමට මුහුණ දෙයි. |
| ක්‍රියාකාරකම 3.7 | : | "ක්‍රිස්තුස්වහන්සේ තුළ හිංසනයට හා පීඩා කරනු ලැබීමට මුහුණ දෙමු." |
| කාලය | : | මිනිත්තු 80යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 3.7.1ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්<br>• ඩිමයි කඩදාසි හා මාකර් පෑන්<br>• වීඩියෝ පටයක් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.7.1 :

- හිංසනය හා පීඩා කිරීම ඇතුළත් වූ වීඩියෝ පටයක් පංතියට ඉදිරිපත් කරන්න.
- ඒ තුළින් පැණ නැගෙන කරුණු මතු කරමින්, කළින් කරන ලද පාඩමේ නිර්වචනයන් තුළින් ප්‍රවේශ වීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - පීඩා කිරීමට ලක්වීම නිසා මිනිසා දුක් වේදනාවන්ට මුහුණ දෙමින් අප්‍රාණික ලෙස ජීවත් වන බව.
> - යාච්ඤා වලට සවන් දීම මගින් දෙවිඳුන් එවැනි ජනයාට උදව් කළ බව.
> - පීඩා කරනු ලැබීම අවසන් කළ යුතු බව.
> - එසේ කිරීමෙන් පීඩා කරනු ලැබීමට ලක්වන්නන් ඉන් බේරා ගත හැකි බව.

පියවර 3.7.2 :

- පන්තිය කුඩා කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ඇමුණුම 3.7.1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, සිද්ධි අධ්‍යයන හෝ පෝස්ටර් ද ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.7.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.

- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

> - මිනිසාට උදාර මනුෂ්‍යත්වයෙන් යුතුව දෙවිඳුන් මවනු ලැබූ නිසා, පීඩනයට පත්කිරීම දේව සැලැස්මට විරුද්ධ බැවින් පීඩනයට පත් වූවන්ට උදව් කරමින් ඔවුන්ගේ විමුක්තිය සඳහා කටයුතු කළ යුතු බව. - නික්මයාම 1,3, පරිච්ඡේද
> - පීඩනයට පත් කිරීමට හේතූන් සොයා බලා පීඩනයට විරුද්ධව කටයුතු කළ යුතු බව.
> - නීතිය ක්‍රියාවේ යෙදවීම වැනි ප්‍රචණ්ඩත්වයෙන් තොර ක්‍රියා මාර්ග මගින් පීඩනයට පත් කිරීමට පිළිතුරු දිය යුතු බවට ජනතාව දැනුවත් කළ යුතු බව.
> - වර්තමාන සංදර්භයට ගැළපෙන පරිදි පීඩනයට පත් කිරීමට විරුද්ධව ක්‍රියා කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පීඩනයට පත්වීම හේතුවෙන් මුහුණ පාන ගැටළු කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරයි.
- පීඩනයට මුහුණ පෑ අය හා එක්ව දෙවිඳුන් හඳුනාගෙන, විමුක්ති අරගලයේ යෙදුණු අය ගැන සඳහන් බයිබල් පාඨ ලියා දක්වයි.
- මාර්ටින් ලූතර් කිං මහත්මා ගාන්ධි අවිහිංසාවෙන් පීඩනයට විරුද්ධ වූවාක් මෙන් අපට ද ඒ සඳහා කටයුතු කළ හැකි බවට අන්‍යයන් ගෙන් අදහස් ලබාගනියි.
- ආයුධ සංස්කෘතියක අවිහිංසාවෙන් සටනේ යෙදෙන විට මුහුණ පාන අභියෝග හා හිංසාවට විරුද්ධව සටනේ යෙදෙන විට මතුවන අභියෝග අතර වෙනස දේව රාජ්‍යත්වයේ වටිනාකම් අනුව පැහැදිලි කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 3.7.1 :

- වර්තමාන ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් හිංසනයට හා පීඩා කිරීම් වලට ලක්වෙති. ජාති, වර්ණ, ආගම් හා කුල භේද වැනි විවිධාකාර බෙදීම් මීට හේතුවේ.
- දේශපාලන හෝ පෞද්ගලික පළිගැනීම් නිසාද, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය හා වෛරය නිසාද, යුක්තිය හා සාධාරණත්වය ඉටුවීමේ හේතුවෙන්, තම අදහස් මුදුන් පත් කරගත නොහැකි වන නිසාද හිංසනය හා පීඩනය ඇතිවේ.
- ක්‍රිස්තුස්වහන්සේ හා ගෝලයින් පීඩනයට ලක්වූයේ දේව රාජ්‍යත්වය ස්ථාපනය කිරීමට කටයුතු කිරීමේ හේතුවෙනි. එසේම පොලිකාෆ් තුමා, පර්පෙචුවා නෙල්සන් මැන්ඩෙලා, ඔස්කා රොමේරු, පෙලිස්ටාස් වැනි අය හිංසනයට හා පීඩනයට මුහුණ පෑහ.

- වර්තමාන ශ්‍රී ලාංකේය සංදර්භය තුළ හිංසනයට හා පීඩනයට විරුද්ධව හඬක් නැගිය යුතුය. පීඩනයට පත් කිරීම නවතා දැමීමට ක්‍රියා කිරීමද අපේක්ෂිතය. ඒ තුළින් මිනිසාට නිදහසේ ජීවත්විය හැකි වාතාවරණයක් සලසා දිය යුතුය.
- හිංසනයට හා පීඩනයට ලක් වූවන් ඉන් මුදා ගත හැක්කේ හිංසාව තුළින් නොව අවිහිංසාව තුළිනි.

ඇමුණුම 3.7.2 : විවාදයක් පවත්වන්න

මාතෘකාව -

හිංසනය හා පීඩනයට පත් කිරීම නැති කළ හැක්කේ හිංසාවෙනි/අවිහිංසාවෙනි.

| | | |
|---|---|---|
| නිපුණතාව 4.0 | : | බහුවාර්ගික බහු ආගමික සමාජයක් තුළ සාමකාමී සහජීවනය වර්ධනය කරයි. |
| නිපුණතා මට්ටම 4.1 | : | ජුදෙව් සමාජයේ වටිනාකම් උකහාගෙන ජීවිතයට අනුගත කරගනී. |
| ක්‍රියාකාරකම 4.1 | : | "ජුදෙව් සමාජයේ පැවති අගයයන් හා වටිනාකම් අප ජීවිතයට උකහා ගනිමු". |
| කාලය | : | විනාඩි 120 යි |
| ගුණාත්මක යෙදවුම් | : | ශුද්ධවූ බයිබලය :-<br>ගීතාවලිය 117<br>උත්පත්ති 18<br>ආමොස් 3:7<br>යෙසායා 44:28, 45:1-4, 19:23-25<br>1 රාජාවලිය 21<br>යෙරමියා 29:5-7<br>කණ්ඩායම් සඳහා ඩිමයි කඩදාසි හා මාකර් පෑන් |

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 4.1.1 :

- ජුදෙව් සමාජයේ යහපත් වටිනාකම් පැවති බවට කරුණු විමසන්න.
- ජුදෙව් සමාජයේ අයහපත් වටිනාකම්ද පැවති බව කථා කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ජුදෙව් සමාජයේ යහපත් මෙන්ම අයහපත් වටිනාකම් පැවති බව.
> - ජුදෙව් සමාජයේ යහපත් වටිනාකම් සඳහා නිදසුන් සැපයිය හැකි බව.
>   උදා : ගැඹුරු ඇදහිල්ල
>   ආගන්තුක සත්කාරය - උත්පත්ති 18
>   භූමිය පරම්පරාවෙන් පරම්පරාවට බෙදාගත්තා මිස විකිණිය නොහැකි බව. - 1 රාජාවලිය 21
>   ජුබිලි වර්ෂය හා විමුක්තිය - ලෙවී 25:39-45
> - ජුදෙව් සමාජයේ අයහපත් වටිනාකම්ද පැවති බව
>   1. ජුදෙව් වර්ගවාදය - ගීතාවලිය 117
>   2. ජුදෙව් වර්ගවාදය ඉස්මතු කරමින් කරන යාච්ඤාව "ස්වාමීනී ඔබවහන්සේ මාව අන්‍ය ජාතිකයෙකු හෝ කාන්තාවක් ලෙස නොමැවූ නිසා ඔබවහන්සේට ස්තුතිකරමි. "
> - ජුදෙව් සමාජය තුළ තිබූ යහපත් වටිනාකම් උකහා ගෙන ඒවා අදාළ කරගත යුතු බව.

පියවර 4.1.2 :

- ඉහත සඳහන් කරුණු අවධානය කරමින්, කණ්ඩායම් 4කට සිසුන් බෙදා මාතෘකා 4ක් යටතේ කරුණු රැස්කිරීමට සලස්වන්න.
- කණ්ඩායම් ගවේෂණ උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- 4.1.1 හා 4.1.2 ඇමුණුම ලබාදෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදන්න.
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.
- (ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණය මේ පාඩම තුළ ඇගයීමක් ලෙස අවශ්‍ය ලෙස සකස්කර හෝ නොකර යොදාගත හැකිය).

පියවර 4.1.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- පළමු කණ්ඩායම් වලට පළමු අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- යුදෙව් සමාජයේ යහපත් වටිනාකම් හඳුනාගත යුතු බව යුදෙව් සමාජය තුළද බහුවිධ ස්වභාවයක් පැවති බව.

1. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ව තෝරා ගනු ලැබුවේ අන්‍යයන්ට යහපත් ගුණධර්ම ප්‍රදානය කිරීම සඳහාය. උත්පත්ති 12:3, ද්වීතීය කථාව 7:6-7

2. දෙවියන්වහන්සේ තෝරාගත් ඊශ්‍රායෙල්වරු යහපත් වටිනාකම් බෙදා නොගත් විට දිවැසිවරු ඔවුන්ව හෙළා දුටුවෝය.
   ආමොස් 3:7, 9:7, යෙසායා 19:23-25

3. පර්සියාවේ සයිරස් රජුව කැපකරනු ලැබුවේ දෙවියන්ව හන්සේ විසිනී.
   යෙසායා 44:28, 45:1-4,

4. දෙවියන්වහන්සේ බබිලෝනිවරු සමහ ප්‍රසිද්ධියේ ජීවිතය හා මිශ්‍රවීමට ඊශ්‍රායෙල්වරු කැඳවූ සේක.
   යෙරමියා 29:5-7

5. යුදෙව් වර්ගවාදයෙන් වෙනස්වීම පිළිබඳ දෙවියන්වහන්සේ වැදගත් තැනක් දුන් බව ජෝනා හා රූත්ගේ කථාව තුළින් හෙළිවේ.

- ජේසුස්වහන්සේ යුදෙව් වටිනාකම් යොදා ගනිමින්, යුදෙව් සමාජය ප්‍රතිසංස්කරණය කළාක් මෙන් අපද ශ්‍රී ලාංකික සමාජය වෙනස් කළ යුතු බව.
  උදා: සබත් දින නිවාඩු ගැනීමට වඩා මනුෂ්‍යයාගේ ය හපත උදෙසා කැප කළ යුතු බව පෙන්වා දුන්සේක.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ජුදෙව් සමාජය තුළ යහපත් හා අයහපත් චරිතාකම් අතර පවතින ආතතිය විස්තර කරයි
- ජුදෙව් චරිතාකම් මිනිස් චරිතාකම් ලෙස පැහැදිලි කොට සැහීමට පත්ව ඒ බව ප්‍රකාශ කරයි.
- ජුදෙව් සමාජයේ චරිතාකම් වලින් අපගේ එදිනෙදා ජීවිතයට අදාළ කර ගත හැකි බව අන්‍යයන්ට පවසයි.
- චරිතාකම් පොදු යහපත සඳහා පාවිච්චි කරන විට පමණක් ඒවා යහපත් චරිතාකම් බවට පත්වන බව අනාවරණය කර ස්ථිර කරයි.

ඇමුණුම 4.1.2 :

- ජුදෙව් සමාජ චරිතාකම් යහපත් අයහපත් ලෙස වර්ග කළ හැකිය. යහපත් චරිතාකම් -

  උදා: යහපත් ගැඹුරු ඇදහිල්ල
  ආගන්තුක සත්කාරය
  උදාර මනුෂ්‍යත්වයෙන් අන්‍යයන්ට සැලකීම
  පොලියක් ලබා නොගැනීම
  දිළිඳුන්ට සැලකීම

  අයහපත් චරිතාකම් උදා: පුරුෂාධිපත්‍යය හා වර්ගවාදය

- දිවැසිවරු, ජුදෙව් සමාජයේ පැවති චරිතාකම් ස්ථිර කිරීම සඳහා කටයුතු කළහ. ආමොස් 9:7, යෙරමියා 19:5-7
- ජුදෙව් වර්ගවාදය වෙනස් කිරීමෙන් බහුවිධ සමාජයක් බිහි කළ හැකිය. උදා: ජෝනා, රූත්
- මෙසේ බහුවිධ සමාජය තුළ සියලුදෙනා සමඟ ජීවත්වීමේදී අර්ථවත්, සාමාන්‍ය ජීවිතයක් ගත කළ යුතුය.

ඇමුණුම 4.1.2 : කණ්ඩායම් ඇගයීම

1 කණ්ඩායම - ජුදෙව් සමාජයේ පැවති යහපත් චරිතාකම් වර්ග කොට පැහැදිලි කරන්න
2 කණ්ඩායම - බයිබලයේ දිවැසිවරු ශ්‍රී ලංකාවට ආවොත් ඔවුන් ඉදිරිපත් කරතැයි බලාපොරොත්තු වන චරිතාකම් කවරේද?
3 කණ්ඩායම - බහුවිධ සන්දර්භය තුළ යහපත් චරිතාකම් කුමක්දැයි පැහැදිලි කොට ඒවා අනුගමනය කිරීමට තීරණය කරන්න
4 කණ්ඩායම - වර්ගවාදයෙන් ඔබ්බට ජීවත්වීම සඳහා ජුදෙව් සමාජයෙන් උකහා ගන්නා දෑ පැහැදිලි කරන්න. (ශ්‍රී ලංකාව ඇසුරෙන්)

| | | |
|---|---|---|
| නිපුණතාව 4.0 | : | බහුවාර්ගික සමාජයක එකමුතුව ජීවත්වෙයි. |
| නිපුණතා මට්ටම 4.2 | : | මුල් කිතුනු සභාවේ වටිනාකම් උකහාගෙන ජීවිතයට අනුගත කරයි. |
| ක්‍රියාකාරකම 4.2 | : | "මුල් කිතුනු සභාවේ වටිනාකම් උකහාගෙන අපගේ ජීවිතයට අනුගත කරමු". |
| කාලය | : | විනාඩි 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | ඇමුණුම 4.2.1<br>ඇමුණුම 4.2.2<br>බයිබලය හා බයිබල් පාඨ සහිත පත්‍රිකා<br>ක්‍රියා 2:42, 4:32, 10:34-35, 14:12-17, 17:22-30, 4:12, 4:32-37, 5:1-11, රෝම 2:14-15, එළිදරව් 21:1-3, 24, 1 කොරින්ති 12:12-31 |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය | : | |

පියවර 4.2.1 :

- ප්‍රකාශන සහිත පත්‍රිකාවේ විශාල කරන ලද පිටපතක් පන්තියට ඉදිරිපත් කරන්න.
- ප්‍රකාශන පිළිබඳ සිසු අදහස් විමසන්න.
- ඉහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

- මුල් කිතුනු සභාවේ වටිනාකම් පැවතුන බව. උදා: ජොහන් 20:17 ජේසුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරිය යුතු බව. ක්‍රියා 2:42, ක්‍රියා 4:32 - අවශ්‍යතා අනුව සියල්ල පොදුවේ තබා ගත් බව
- පාවුල් හා පේදුරුගෙන්ද, මුල් සභාවෙන්ද අදට අනුගත කළ හැකි ප්‍රධානතම වටිනාකම වන්නේ අන්‍යයන් පිළිගැනීමයි. උදා: ක්‍රියා 10:34-35, 14:12-17, 17:22-30
- ක්‍රියා 4:12 ක්‍රිස්තුස්වහන්සේගෙන් පමණක් ගැළවීම පිළිබඳ අදහසක් ලැබෙන නිසා අන් සියල්ල ප්‍රතික්ෂේප කළ යුතු යැයි මුල් සභාවේ අදහසක් පැවති බව.
- මුල් කිතුනු සභාවේ සමානාත්මතාව පදනම් කරගත් ජීවිත පැවැත්ම අප අනුගමනය කළ යුතු බව. (ක්‍රියා 2:42-47)

පියවර 4.2.2 :

- පන්තිය කුඩා කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ඇමුණුම 4.2.1 හා ඇමුණුම 4.2.2 ගවේෂණ උපදෙස්, ඩිමයි කඩදාසි, මාකර් පෑන්, කණ්ඩායම් වලට ලබාදෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් නිර්මාණකරනයේ යොදවන්න.
- නිර්මාණ හා අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 4.2.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම් වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- මුල් කිතුනු සභාවේ වටිනාකම් යහපත් හා අයහපත් ගුණාංග ලෙස අද සභාව තුළද ක්‍රියාත්මක වන බව. උදා: ක්‍රියා 4:32-37/5:1-11
- මුල් කිතුනු සභාවේ ප්‍රධාන පරමාර්ථය වූයේ ධර්මදූත මෙහෙවර නිසා බහුවිධ සමාජය ප්‍රතික්ෂේප කිරීමෙහි අද හස් ඔවුන් සතුවූ බව.
- බහුවිධ සමාජ ක්‍රමයෙන් තොරව අපට ජීවත්විය නොහැකි බව.
- ධර්මදූත චාරිකාව තුළ ගෝලයන් යහපත් දේ යහපත් ලෙස සැලකීම යහපත් ගුණාංගයක් ලෙස අගය කළ යුතු බව.
- ටෝරාව ජුදෙව්වන්ට යම් සේද, හෘද සාක්ෂිය එසේම කිතුනුවන්ට වැදගත් බව (රෝම 2:14-15)
- නව අහස හා නව පොළව තුළ විවිධ ආගම් සඳහා "ආගම" ට තැනක් නොමැති බව (එළිදරව් 21:1-3, 24)
- බහුවිධ වාතාවරණය තුළ විවිධත්වය තුළ ඒකත්වය පිළිගැනීම තුළ පමණක් අපට ජීවත් විය හැකි බව. (1 කොරින්ති 12:12-31)

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- යහපත් සාරධර්ම පදනම් කරගත් මුල් සභාව බිඳ වැටීමට හේතු පැහැදිලි කරයි.
- 1 කොරින්ති 12:12-31 සඳහන් ලෙස බහුවිධවාදය පාවුල්තුමා ස්ථිර කළ බව අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කර ස්ථිර කරමින් අන් අය සමඟ බෙදා ගනියි.
- විවේචනාත්මක දැක්මකින් මුල් කිතුනු සභාවේ ගුණාංග දකිමින් ඒ පිළිබඳව අදහස් එක් රැස් කරයි.
- ආගමික අන්තවාදී අදහස් පදනම් කරගත් ප්‍රකාශන, අයහපත් ආකල්පයක් හා සාරධර්මයන් නිසා එළිදකින බව ප්‍රකාශ කරයි.

කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස් :

- ඔබට දී ඇති ඇමුණුම හොඳින් කියවා ප්‍රශ්න වලට පිළිතුරු සාකච්ඡා කරන්න.
- එය පන්තිය ඉදිරිපිට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 4.2.1

ජුදෙව් වර්ගයා තුළ ජීවත් වූ ජේසුස්වහන්සේ අන්‍යජාතීන්ගේ හා වර්ගයාගේ යහපත් ක්‍රියාවන් ඔවුන්ගේ ඇදහිල්ල ලෙස දුටු සේක. (මතෙව් 8:5-13/15:21-28, ලූක් 21:10). සමාරිතයාගේ යහපත් වටිනාකම් ජුදෙව් සමාජය ඉවතට දැමුවද ජේසුස්වහන්සේ එය අගය කළ සේක. ජොහන් 4, ලූක් 10:25-27, 17:11-19 මුල් කිතුනු සභාව ජේසුස්වහන්සේව පිළිගත්තේ සීමිත රාමුවක් තුළය. මෙහිදී දෙවියන්වහන්සේ (කොරනේලියස්) තුළ ගරුබියෙන් හා යුක්තිගරුකව ජීවත්වූ අය දෙවියන්වහන්සේට ළං වූවන් ලෙස පේදුරු විසින් සැලකීය. (ක්‍රියා 10:34-35) දෙවිඳුන් විසින් නිර්මාණය කරන ලද මිනිසුන්, මිනිස් නිර්මාණයන්ට වන්දනාමාන නොකර ඒ සියල්ල මැව්වාවූ දෙවිඳුන්ට පමණක් නමස්කාර කළ යුතු බවට පාවුල් තුමා අවවාද කළේය. (ක්‍රියා 14:12-17)

මුල් කිතුනු සභාවේ ජීවිත රටාවේ පදනම ප්‍රේමයයි. ඔවුහු අපෝස්තුළුවරුන්ගේ සහෝදරත්වය තුළ නිර්භීතව පැවතුනහ. වත්කම් පොදුවේ තබා ගත්හ. ඉඩකඩම් විකුණා ලත් දේ එකිනෙකාගේ අවශ්‍යතා ඇති ආකාරය අනුව බෙදා ගත්හ. සරල ජීවිත රටාව ගෙවීය. ඔවුහු නිවෙස් වල රොටි කඩා අනුභව කරමින් ආහාර බෙදා ගත්හ. ගැටළුවක් සිදුවූ විට ඊට මුහුණ දුන් අයවලුන් අතරින්ම පත්කර ගත් නායකයින් ඩීකන්වරුන් ලෙස හැඳින්වීය. ගැටළු විසඳීම හා එක්සත් කම සඳහා ජෙරුසලම් මන්ත්‍රණ සභාවද කටයුතු කෙරිණි. ක්‍රියා 15. ඔවුහු බල අධිකාරියට අභියෝග කරමින්ද, ජේසුස්වහන්සේට කීකරුවෙමින්ද ජීවත් වූහ. ක්‍රියා 4:1-22. මේ ජීවිත රටාව දිගින් දිගටම ක්‍රියාත්මක නොවූ නිසා සභාව "ආයතන" ගත විය.

මනුෂ්‍යත්වය බහිෂ්කාරවාදය, අඩංගුතාවාදය හා බහුවිධවාදය ලෙස වර්ග කළ හැකිය. (Exclusivism, Inclusivism and Pluralism)
"මා පමණක් නිවැරදිය. ඔබ වැරදිය" යන්න බහිෂ්කාරවාදයයි.
"ඔබේ අදහස ටිකක් හරි. එහෙත් මම සම්පූර්ණයෙන්ම නිවැරදිය. ඔබ ඔබේ අදහස සම්පූර්ණ කරයි" යන්න අඩංගුතාවාදයයි. බහුවිධවාදය යනු "ඔබත් නිවැරදිය. මාත් නිවැරදිය. අපි එක්ව වැඩ කරමු. නැත්නම් ඔබත් වැරදිය, මාත් වැරදිය. අපි එක්ව නිවැරදි වෙමු. නැත්නම් මම වැරදිය ඔබ නිවැරදිය. එමනිසා මම ඔබ අනුගමනය කරමි. නැත්නම් මා නිවැරදිය, ඔබ වැරදියැයි සිතමි. ඔබද එසේ සිතන්නේ නම් මා අනුගමනය කරන්න" යනුයි.


පාවුල් "ශරීරය හා ශරීර අංග" ගැන සඳහන් බයිබල් පාඨය තුළින් (1 කොරින්ති 12:12-31) විවිධ පුද්ගලයන් විවිධ වුවද ඔවුන්ගේ පැවැත්ම හා ඔවුන්ගේ සිතුවිලි හා ක්‍රියා එකතුව වැඩ කළ යුතු බවත්, සැමකෙනෙකුම ඉතා වැදගත් බවත් පෙන්වා දුන්නේය.

බහුවිධ සමාජ ක්‍රමය පිළිගෙන ජීවිතයට අදාළ කර ගනිමින් ජීවත්වීම පශ්චාත් නූතන සමාජයේ ප්‍රධාන අවශ්‍යතාවයකි. සමාජය යථාර්ථය සමඟ යයි.

ඇමුණුම 4.2.2

- මුල් කිතුනු සභාව තුළ පැවති යහපත් ගුණාංග වර්ග කර දක්වන්න.
- ඔවුන්ගේ ධර්මදූත සේවයේදී බහුවිධ සමාජය තුළ එකට එකතු වී ජීවත්වීම පාවුල් හා පේදුරු සීමාවක් සහිතව පිළිගත් බව සාකච්ඡා කර පැහැදිලි කරන්න.
- මුල් කිතුනු සභාවේ පැවති යහපත් ගුණාංග අද දවසේ නොපැවතීමට හේතුව අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කොට ඒ සඳහා කරුණු එකතු කරන්න.
- මුල් කිතුනු සභාවේ ගුණාංග, ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් වල ගුණාංග සමඟ සංසන්දනය කරමින් ජේසුස්වහන්සේ කීයා දුන් ගුණාංග අනුගමනය කරන්න තීරණය කළ බව ප්‍රකාශ කරන්න.

ප්‍රකාශන පත්‍රිකාව



නිපුණතාව 4.0 : බහුවිධ සමාජයක එක්ව ජීවත්වෙයි.

නිපුණතා මට්ටම 4.3 : සාමකාමී සහජීවනය වැනි යහපත් වටිනාකම් මත ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 4.3 : "සාමකාමී සහජීවනය වැනි යහපත් වටිනාකම් මත ජීවත් වෙමු."

කාලය : මිනිත්තු 80 යි

ගුණාත්මක යෙදවුම් :

- ශු බයිබලයේ ශු මාර්ක් 15:38, ක්‍රියා 8:4-40
- ඇමුණුම 4.3.1 ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 4.3.1 :

- ඇමුණුම බෙදා දෙන්න.
- ශු බයිබලය තුළින් සාමකාමී සහජීවනය පිළිබඳව ලැබෙන තොරතුරු වාර්තාවක ලියන්න.
- ඒ තුළින් සාකච්ඡාව අරඹන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - සාමාන්‍ය චින්තනය හා බයිබලීය චින්තනය අනුව සාමකාමී සහජීවනය යහපත් වටිනාකම් බව.
> - සීමොන්ගේ නිවසේදී පේදුරු දර්ශනයක් දුටු අතර එහි අදහස වූයේ සියලු දෙනා දෙවියන්වහන්සේගේ දරුවන් වන බව බව. ක්‍රියා 10:1-23
> - බහුවිධ සමාජයක වුවත් ක්‍රිස්තුස්වහන්සේ තම මෙහෙවර මගින් සාමකාමී සහජීවනය සඳහා මිනිසුන් අතරින් ක්‍රියා කළ බව.
> - සියලුම මිනිසුන් මිනිසුන් සේ සැලකීමේ උදාර මනුෂ්‍යත්වයට ගරු කිරීම මත පමණක් සාමකාමී සහජීවනය ඇති කිරීම අදාළ වන බව.
> - උදාර මනුෂ්‍යත්වය නමැති කුසුම පීදෙන ලෙස කටයුතු කළ යුතු බව.

පියවර 4.3.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් පහකට වෙන් කරන්න.
- ඇමුණුම 1.1.1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්, ශුද්ධ බයිබල් පාඨ, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 4.3.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම්වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- සාම සංහිඳියාව බෙදීම් ඉක්මවා යමින් සැබෑ සහෝදරත්වයක් මත පවතින බව. ග්‍රීක් ජුදෙව්, ස්ත්‍රී-පුරුෂ, වහල්-ස්වාමි (1 කොරින්ති 12-13) ගලාති 3:28, කොලොස්සි 3:11
- සාම සංහිඳියාව නව අනන්‍යතාවයක් ලබාදෙන බව.
  තෝරාගත් ජනතාව
  රාජකීය පූජකයින්
  ජාතියක ශුද්ධ ජනතාව
  දෙවිඳුන්ගේ ජනතාව
  දෙවිඳුන්ගේ දරුවන් (1 පේදුරු 2:9/රෝම 8:14-17)
- (සාම සංහිඳියාව) දෙවිඳුන් හා මිනිසුන් වෙතින් වන සංහිඳියාව පාපයෙන් හා විමුක්තියෙන් ගැළවීම ලබාදෙන්නක් බව. ගලාති 5:1-13, රෝම 6:7-14, 18-22, රෝම 7:6, 18-25, 8:2/ කොලොස්සි 1:13
- දෙවිඳුන් තුළ සම්පූර්ණ මැවිල්ල සංහිඳියාවට පත්වන බව. රෝම 8:20-22
- ආගම් අතර පවතින සීමාවන් ඉක්මවමින් යන නොබිඳුනු සම්බන්ධතාවයන් මගින් ලබාගන්නා සාම සංහිඳියාව තුළින් උදාර මනුෂ්‍යත්වය ජනිත වන බව.
  - මිනිසා තුළ, මිනිසා හා මිනිසා අතර, දෙවිඳුන් හා මිනිසා අතර, මිනිසා හා මුළු මැවිල්ල අතර

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- බහුවිධ සමාජ තත්ත්වයක එකමුතුව ජීවත්වීම සඳහා සාමය හා සංහිඳියාව වැදගත් වන බව පැහැදිලි කරයි.
- සාමය හා සහජීවනය අර්ථවත් වන්නේ උදාර මනුෂ්‍යත්වය ඇතිවූ පසු පමණක් බව පැහැදිලි කොට සෑහීමකට පත් වෙයි.
- සියලු මට්ටමේ නොබිඳුනු සබඳතාවයක් සඳහා සාම සංහිඳියාව නීතිය හා පාපය වැනි සීමා අභිභවා යන බව ස්ථිර කොට ප්‍රකාශ කරයි.
- බහුවිධ සමාජ තත්ත්වය තුළ එක්ව ජීවත්වීම අප රටට අදාළ බව තීරණය කොට පැහැදිලි කරයි.

ඇමුණුම 4.3.1

ජීවිතය හුදකලා දිවයිනක් නොවේ. එය අප එක්ව ජීවත් වන විශ්ව ගම්මානයකි. කිසිවකු හුදකලා කොට තනි කළ යුතු නොවේ.
බහුවිධ සංදර්භය තුළ විවිධ ජනයා ඉතා වැදගත්ය. ග්‍රීක, ජුදෙව්, පුරුෂ, ස්ත්‍රී ස්වාමි වහල් ආදී ජනයා සමඟ 1 කොරින්ති 12, 13/ගලාති 3:28, කොලොස්සි 3:11. මේ සියළු දෙනා නව අනන්‍යතාවක් ලබති. 1 පේදුරු 2-9/රෝම 8:14-17. මෙය මනුෂ්‍යත්වය නොව සමස්ත මැවිල්ලට පොදු වූවකි. නීතිය හා පාපය වහල්කමින් විමුක්තිය ලබාගත හැකිය. ගලාති 5:1-13, රෝම 6:7-14, 18-22, රෝම 7:6, 18-25, 8:2, කොලොස්සි 1:13. තමා තුළද, තමා හා දෙවිඳුන් තුළද අන්‍යයන් සමඟද යහපත් සම්බන්ධතාවය තබා ගන්නා අය එකමුතුව ජීවත් වෙති.

මේ ජීවිතය උදාර මනුෂ්‍යත්වයක් ලබාදී මිනිස් බෙදීම් මුලින් උපුටා දමයි. එපීස 2:11-23. උදාර මනුෂ්‍යත්වය සඳහා වන ගෞරවය තුළින් සාමය හා සංහිඳියාව යහපත් වටිනාකම් ලෙස අවබෝධ කරගනියි.

අපගේ තත්ත්වය තුළ පවා වෙනස්කම් පිළිගෙන, පොදු ගෞරවයෙන් එකමුතුව උදාර මනුෂ්‍යයන් ජීවත් වෙමු.

ඇමුණුම 4.3.2

- එපීස 2:22 ට අනුව වර්ගවාදයෙන් ඔබ්බට ශ්‍රී ලංකාවේ ජීවිතය යන මැයෙන් පුවත්පතකට ලිපියක් ලියන්න.
- සාමය හා සංහිඳියාව පීඩනය සඳහා උදව් නොකරන බව උදාහරණ සහිතව පැහැදිලි කරන්න
- බහුවිධවාදී තත්ත්වය මනුෂ්‍යත්වයේ පැවැත්ම සඳහා අදාළ වන සාර්ථකම දේ ලෙස සැහීමකට පත්ව අදහස් ප්‍රකාශ කරන්න.
- උදාර මනුෂ්‍යත්වය ක්‍රියාත්මක කිරීම හා බහුවිධ තත්ත්වය පෝෂණය කිරීමට අප කළ යුත්තේ කුමක්දැයි අදහස් එක් රැස් කරන්න.

නිපුණතාව 5.0 : කිතුනු වටිනාකම් අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 5.1 : ක්‍රියාත්මක ප්‍රේමය මත ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 5.1 : "ක්‍රියාත්මක ප්‍රේමය මත ජීවත් වෙමු."

කාලය : විනාඩි 80 යි

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 5:1:1
ඇමුණුම 5:1:2
ඩිමයි කඩදාසි, මාකර් පෑන්
බයිබලය - මාර්ක් 12:32-34, මතෙව් 22:34-40, පිලිප්පි 2:1, එපීස 3:17-19, 1 කොරින්ති 13, රෝම 12:9-14, මතෙව් 25:31-40, ජාකොබ් 1:13, 1 ජොහන් 3:11-24, 4:6, ජොහන් 13:35, ලූක් 10:25-37, මතෙව් 19:16-25

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 5.1.1 :

- ක්‍රියාත්මක ප්‍රේමය පිළිබඳ ශිෂ්‍යයන්ගේ අදහස් දක්වන්නට ඉඩ හරින්න.

> - දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාට ප්‍රේම කළ බව. එතුමාගේ මාංශවත් වීම තුළින් පෙනෙන බව.
> - ගැළවීම සඳහා වන ප්‍රේමය සඳහා දෙවිඳුන්ට ප්‍රතිචාර දැක්විය යුත්තේ මිනිසාගේ ප්‍රේමය තුළින් බව. (මාර්ක් 12:32-34, මතෙව් 22:34-40)
> - දෙවියන්වහන්සේට අප ප්‍රේම කරන බව පෙන්විය හැක්කේ උන්වහන්සේ තුළ රඳා සිටීම තුළින් බව.
> - අපිටත්, අන් අයටත්, සමාජයටත් ප්‍රේම කළ හැකි බව.

පියවර 5.1.2 :

- පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව හා ඇමුණුම 5.1.1, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් වලට පිළිතුරු ගොනු කිරීමට සලස්වන්න.
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 5.1.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.
- විස්තාරණය සඳහා සූදානම ප්‍රථම කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත කරුණු යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- සෑමවිටම ආචාර ධර්ම මත හා ක්‍රියාකාරීත්වය මත ප්‍රේමය පදනම් වන බව (පිලිප්පි 2:1/එපීස 3:17-19/1 කොරින්ති 13/රෝම 12:9-14)
- සේවය තුළින් ප්‍රේමය ප්‍රකාශ වන බව (මතෙව් 25:31-40/ජාකොබ් 1:13)
- ප්‍රේමය කිතුනු පැවැත්ම සඳහා අවශ්‍ය බව (1 ජොහන් 3:11-24)
- ගෝලත්වය ප්‍රකාශ වන්නේ ජීවන රටාව තුළින් බව (ජොහන් 13:35/1 ජොහන් 4:16)
- අපට ඇති දේ අන් අය සමඟ බෙදා ගැනීම ප්‍රේමය තුළින් සිදුවිය යුත්තක් බව (ලූක් 10:25-37/මතෙව් 19:16-25)

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

1. 1 කොරින්ති 13 පරිච්ඡේදය වර්තමාන සමාජ සංදර්භයට අනුකූල වන සේ නැවත ලියා දක්වයි
2. "ප්‍රේමයේ සේවය සඳහා පදනම් වන්නේ අන් අයය" යන්න පිළිබඳ සැහීමකට පත්ව ප්‍රකාශ කරයි"
3. "ගෝලත්වය ප්‍රකාශ වන්නේ ප්‍රේමය තුළිනි. " මේ ප්‍රකාශය සාකච්ඡා කර ප්‍රකාශ කරයි
4. "අද සමාජයේ අවශ්‍යතාවය වන්නේ දෙවියන්වහන්සේ තුළ යැපෙමින් සේවය කිරීමය." මේ සඳහා කරුණු එක්රැස් කරයි.

ඇමුණුම 5.1.1

මිනිසාගේ ජීවන පැවැත්ම රඳා පවතින්නේ ප්‍රේමය මතය. යම් ජීවිතයක් පරිපූර්ණ වන්නේ තමාටම, අන්‍යයන්ට, දෙවිඳුන්ට හා පරිසරයට දක්වන ප්‍රේමය මතය. අළුත් ගිවිසුමේ ප්‍රේමය සඳහා ග්‍රීක වචන හතරක් යොදා ගනියි.

1. Epithumia ආශාව (ලූක් 22:15/මතෙව් 5:28
2. Eros ප්‍රේමයෙන් පිරුණු හදවතින් යුතුව බලා සිටීම
3. Philia අඹුසැමි හා මිතුරන් අතර ඇති ප්‍රේමය
   Philein පියා හා පුතු/දියණිය හා පුතු අතර ඇති ප්‍රේමය (ජොහන් 11:3-36/ජොහන් 22)
4. Agape ප්‍රේමයේ අග්‍රම තත්ත්වයයි. දෙවියන්වහන්සේ තම පුත්‍රයා මෙලොවට එවා මනුෂ්‍යත්වය හා බෙදා ගැනීමයි. (1 ජොහන් 4:8/මතෙව් 5:43-48)

මේ අනුව දෙවියන්වහන්සේ හා අප අතරත්, මනුෂ්‍යයන් හා මනුෂ්‍යයන් අතරත් ක්‍රියාකාරීත්වය සඳහා මේ ප්‍රේමය අවශ්‍ය වේ. ගැළවීම තුළ දෙවියන්වහන්සේ පෙන්වූ ප්‍රේමයට අපි ප්‍රේමය තුළින් ප්‍රතිචාරය දක්වමු. පොදු යහපත සඳහා ප්‍රේමයේ ක්‍රියාකාරීත්වය වැදගත් වේ. යහපත් සමාරිතයාගේ කථාවෙහි චරිත වර්ග තුන මේ සඳහා සලකා බැලිය හැකිය. ඔබට යමක් අයිති වුවත් එය මට ලබාගත හැකිනම් එය මාගේය යන්න සොරාගේ අදහසයි. ඔබේ ප්‍රශ්න ඔබේය. මගේ ප්‍රශ්න මගේය යනු ලෙවියා හා පූජකයාගේ ආකල්පයයි. මට අයිති දෙයක් වුවත් එය ඔබට අවශ්‍ය නම් එය ඔබට අයිතිය යනු සමාරිතයාගේ ආකල්පයයි. පළමු අවස්ථා දෙකෙහි දක්නට ලැබුණු ආත්මාර්ථකාමී ප්‍රේමය අභිභවා යන සමාරිතයාගේ ප්‍රේමය අගය කළ හැකිය. සැබෑ ප්‍රේමය තුළ අවශ්‍යතා ඇති අයට ප්‍රේම කළ යුතු වේ.

මතෙව් 25:31-41 ආචාර ධර්ම තුළින් අප ප්‍රේමය ප්‍රකාශ කළ යුතු වන්නේය. (පිලිප්පි 2:1/එපීස 3:17-19/1 කොරින්ති 13/ රෝම 12:9-14) බෙදා ගැනීම තුළින් ප්‍රජාව මූලිකවූ ප්‍රේමය ඇතිවේ.

ප්‍රේමය අදහසක් නොව ක්‍රියාවකි. ක්‍රියාව තුළින් අද සමාජය යහපත් සමාජයකට පරිවර්තනය කළ හැකිය. උදාර මනුෂ්‍යත්වය හා මනුෂ්‍ය ගුණධර්ම ඇති රටක් මේ තුළින් ඇතිවිය යුතුය.

ඇමුණුම 5.1.2
කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

- ඔබට සපයා ඇති රචනාව හොඳින් කියවන්න.
- ඒ අනුව පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ප්‍රේමය ක්‍රියා කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.
2. බයිබලය තුළ ඇති ප්‍රේමය පිළිබඳ අදහස් ලැයිස්තු ගත කරන්න.
3. "අප දෙවියන්වහන්සේගේ ප්‍රේමයට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? " මෙම ප්‍රකාශනය සාකච්ඡා කොට තීරණයක් ගෙන එය ප්‍රකාශ කරන්න.
4. ශ්‍රී ලංකාව තුළ වර්ගවාදය අභිභවා යන ප්‍රේමය දැක්වීමට කටයුතු කරන්නේ කෙසේද? සාකච්ඡා කොට කරුණු දක්වන්න.

නිපුණතාව 5.0 : කිතුනු වටිනාකම් අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 5.2 : යුක්තිය පදනම් කරගත් සාමයෙන් ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 5.2 : "යුක්තිය පදනම් කරගත් සාමයෙන් යුතුව ජීවත් වෙමු".

කාලය : විනාඩි 80 යි

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 5.2.1
ඇමුණුම 5.2.2
පරෙවියාගේ පිංතූරය
බයිබලයේ - මීකා 4:1-4, යෙසායා 1:1-4, 11:6-7, සාමුවෙල් 18:29, 1 රාජාවලිය 5:12, සෙකරියා 9:9-10

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 5.2.1 :

- පරෙවියාගේ බෙල්ල දම්වැලකින් බැඳ ඇති පිංතූරයක් ශිෂ්‍යයන්ට නැරඹීමට දෙන්න.
- මෙහි සංකේතවත් වන්නේ කුමක්දැයි සිසුන්ගෙන් විමසන්න. යුක්තිය මත පදනම් වූ සාමය යන්න පිළිබඳව ශිෂ්‍යයන්ගේ අදහස් ලබා ගන්න.

| |
|---|
| • සාමය දෙන්නේ දෙවිඳුන් බව.<br>• අප සාමය උදෙසා යාච්ඤා කළ යුතු බව.<br>• අපට යුක්තිය පදනම් වූ සාමයක් අවශ්‍ය බව.<br>• අප ප්‍රේමය ඇති කරන්නන් ලෙස ක්‍රියා කළ යුතු බව. (මතෙව් 5:9) |

පියවර 5.2.2 :

- පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- කණ්ඩායම් ගවේෂණ උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කුඩා කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කාර්‍ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 5.2.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලටම ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- යහපත් ජීවිතයක් තුළින් සාමය ලබා දෙන බව. මීකා 4:1-4, යෙසායා 1:1-4, යෙසායා 11:6-7)
- යුද්ධයට ප්‍රිය වන්නන් හා ප්‍රේමය ප්‍රිය කරන්නන් අතර බෙදීමක් ඇති නිසා පමණක් ප්‍රේමයේ අවශ්‍යතාවය මතුවන බව. (මතෙව් 10:24)
- පෞද්ගලික හා සාමුහික තත්ත්වය විශ්ලේෂණය කර වර්තමානයේදී සාමය උදෙසා කටයුතු කරමින් දෙවිඳුන්ට යාච්ඤා කළ යුතු බව.
- අප රටට අවශ්‍යව ඇත්තේ යුක්තිය පදනම් කරගත් සාමයක් වන අතර ප්‍රචණ්ඩත්වය තුළින් සාමය ලබා ගත නොහැකි බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ශාන්ත ෆැන්සිස්තුමාගේ යාච්ඤාව ලියා දක්වයි.
- සාමය බිහිකරන්නන් ලෙස අන් අයගේ සිතුවිලි වෙනස් කරන්නට ඔවුනට පවසමින් ඔවුන් තමන්ගේ අදහසට නම්මා ගනියි.
- ශ්‍රී ලංකාවේ සාමය යුක්තිය පදනම් කරගෙන සීමාවන්ගෙන් ඔබ්බට අඛණ්ඩව ගමන් කළ යුතු අයුරු සොයා බලයි.
- සාමයට විරුද්ධවන්නන්ගේ චින්තනය මුලින් උපුටා දැමීමට අප කටයුතු කළ යුත්තේ, කෙසේ දැයි සාකච්ඡා කර ලැයිස්තු ගත කරයි.
- මානව ගුණධර්ම මත පදනම් වූ ප්‍රේමය සම්බන්ධ කිරීමේදී මතුවන අභියෝගයන්ට මුහුණ දෙන්නේ කෙසේද යන්න තීරණය කොට ප්‍රකාශ කරයි.

ඇමුණුම 5.2.1

සාමය

ශාලොම් යන හෙබ්‍රෙව් වචනය පරිපූර්ණ ජීවිතයක් යන්න අර්ථවත් කරයි. අයිරේනියා යන ග්‍රීක වචනයෙහි අරුත යුද්ධයෙන් තොර වීමයි. මේ වචන දෙකම සාමය උදෙසා බයිබලයේ දැක්වේ. එසේම පරිපූර්ණ සෞඛ්‍ය (2 සාමුවෙල් 18:29), දෙපාර්ශවය අතර සහභාගිත්වය, උපකාර පදනම් වූ යහපත් සම්බන්ධතාවය, එක්සත්කම (1 රාජාවලිය 5:12) දෙවියන්වහන්සේ හා මනුෂ්‍යයන් අතර යහපත් සම්බන්ධතාවය (යෙසායා 54:10) දේව රාජ්‍යත්වය හා (සෙකරියස් 9:9-10), යුද්ධයෙන් තොර සාමයක් (ක්‍රියා 12:20) යන්නද සාමය සඳහා භාවිතා කරනු ලබන නිර්වචන වේ.

යෙසායා හා මීකා සදාකාල සාමය ගැන තමන්ගේ අදහස් දැක්වූහ. (යෙසායා 2:1-4, මීකා 4:1-4) යුද්ධයට සූදානම් වීම නවතා ආර්ථික වර්ධනය සඳහා සැලසුම් කළ යුතු බව ඔවුන් මූලික කරගත් අදහසයි. මීකා 4:3. ආර්ථික වර්ධනය හා සංවර්ධනය යහපත් ජීවිතයක් ලබාදෙයි. ආගමික අන්තවාදය මුලින් උපුටා දැමීම තුළින් ආගමික නිදහස ලබාදිය හැකිය. මීකා 4:5 එසේම, යුද්ධයෙන් තොර වීම, ආර්ථික හා සමාජීය සංවර්ධනය වර්තමාන ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. බහුවිධතාවය අනුමත කරන විට නිම නොවන (සදාකාලික) සාමය උදා වේ.

බයිබලීය සම්ප්‍රදාය අනුව සාම ප්‍රාර්ථනය වැදගත්ය. සාමය සඳහා යාච්ඤාව පමණක් ප්‍රමාණවත් නොවේ. සාමය සඳහා ක්‍රියාත්මක විය යුතුය. මතෙව් 5:9. එසේම යුක්තිය මත පදනම් වූ සාමයක් ඇති විය යුතුය. මළවුන් අතර ඇතිවන සාමයෙන් ප්‍රයෝජනයක් නැත. එය අපගේ බලාපොරොත්තුව නොවේ. සාමය අප අතර විය යුතුය. රෝම හමුදාව සාමයට ආමන්ත්‍රණය කරන්නා සේ අපට සාමයට ආමන්ත්‍රණ කළ නොහැකිය.

Paxromana රෝම හමුදාව කඩුවෙන් සාමයට ආමන්ත්‍රණය කරනු ලබයි. ජේසුස්වහන්සේ ප්‍රේමයට පෙර බෙදීම් ඇති කලේ එබැවිනි. මතෙව් 10:34. ප්‍රේමය සඳහා ප්‍රේමයට හිතැති අය එක්ව කටයුතු කිරීම සාමය ඇති කිරීමට මග පාදන්නකි.

ශ්‍රී ලංකාවේ සාමයක් ඇති විය යුතු බව සැම දෙනා පිළිගනිති. නමුත් වර්ගවාදීන් ආගමික අන්තවාදීන්, ආත්මාර්තකාමීන්, හිංසාවාදීන් සාමය සඳහා ක්‍රියාකාරීම වීම වලකති. වර්ගවාදය, ආගම, භාෂාව යන සීමාවන්ගෙන් ඔබ්බට ඉක්මවා ගොස් වැඩ කටයුතු කිරීමෙන් සාමය ළගා කරගත හැකිය.

යුද්ධය හා යුද්ධය පිළිබඳ පුවත් අපගේ දිනපතා අත්දැකීමයි. මෙය ජේසුස්වහන්සේගේ දෙවන ආගමනයේ සලකුණක් බව සමහරු සිතති. (මාර්ක් 13:7) අද ශ්‍රී ලංකාවේ ජේසුස්වහන්සේ ජීවත් වුවහොත් මේ දේවල් එතුමා සනාථ කරාවිද? නැතිනම් මේ යුද්ධය නතර කිරීමට හා දේව රාජ්‍යත්ව වටිනාකම් තුළින් හා හෘද සාක්ෂිය තුළින් උන්වහන්සේ මෙම යුද්ධය නතර කිරීමට කටයුතු කරයිද? කුඩා දරුවකුගෙන් වුවද අප ඇසුවොත් ඔබ මේ යුද්ධය අනුමත කරන්නේද කියා ඔහුගේ පිළිතුර වන්නේ නැත යන්නයි. එහෙයින් යුද්ධය අවශ්‍ය නැත. සාමය අවශ්‍යය යන්න අප ප්‍රකාශ කළ යුතුය. අපට වර්ගවාදය අවශ්‍ය නොවේ. මානව අයිතීන් බෙදා ගැනීමට අවශ්‍ය වේ. මෙය මනුෂ්‍යත්වයේ ප්‍රකාශනයයි.

ඇමුණුම 5.2.2

ෆැන්සිස් තුමාගේ යාච්ඤාව ඇතුළත් කරන්න.

ඇමුණුම 5.2.3

කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

- ඔබට දී ඇති සටහන හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ශ්‍රී ලංකාවේ යුද්ධය ඇති වීමට හේතු අන් අයගෙන් විමසා සටහන් කරන්න.
2. ශ්‍රී ලංකාවට සාමය උදාකර දීමට කළ හැක්කේ කුමක්දැයි ලැයිස්තුගත කරන්න.
3. ශ්‍රී ලංකාවට හා ලෝකයට සාමය උදාකිරීම සඳහා යාච්ඤා කරන්න.
4. පාසැල් සංදර්භය තුළ සාමයට හිතැති අය බිහිකිරීමට කළ හැකි දේ සාකච්ඡා කර ප්‍රකාශ කරන්න.

නිපුණතාව 5.0 : කිතුනු වටිනාකම් අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 5.3 : විවිධත්වය තුළින් ඒකීයත්වයේ ජීවිත ගත කරයි.

ක්‍රියාකාරකම 5.3 : "විවිධත්වය තුළ ඒකීයත්වයෙන් ජීවත්වෙමු".

කාලය : මිනිත්තු 80 යි

ගුණාත්මක යෙදවුම් : ශුද්ධවූ බයිබලය - රෝම 12:1-8, 1 කොරින්ති 12:27-30, එපීස 4:1-40, පෑන්, ඩිමයි කඩදාසි, වර්ණවත් දේදුන්නක පින්තූරයක්, විවිධ මල් සහිත මල් පෝච්චියක්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 5.3.1 :

- දේදුන්නක රූපයක් සිසුන්ට පෙන්වා සිසුන්ගෙන් අහඹු ලෙස අදහස් විමසන්න.
- විවිධ මල් ඇති මල් බඳුන් ප්‍රදර්ශනය කරමින් සිසුන්ගෙන් අදහස් විමසන්න.
- එම අදහස් අනුව පහත සඳහන් බයිබලීය අවස්ථා තුළින් විවිධත්වය හා ඒකීයත්වය විස්තර කිරීමට අවස්ථාව ලබාදෙමින් පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් සාකච්ඡාව අරඹන්න.

> - විවිධ අවස්ථා හා විවිධ දේ එකතුව කටයුතු කිරීම ස්වාභාවික බව.
>   උදා: අපගේ අතේ ඇඟිලි 5 විවිධ වුවත් එය එකට බැඳ තබා ඇති අයුරු. යම් වැඩකදී ඇඟිලි 5ම උවමනාය.
>   විවිධ කුළුබඩු යෙදූ ව්‍යංජනයක් අවසානයේ රසවත් ආහාරයක් බවට පත්වේ.
> - බහුවිධ වාදය තුළින් ඉගෙනගත හැකි පාඩම් වන්නේ විවිධත්වය තුළින් ඒකීයත්වය කරා යන බව.
> - පාවුල්තුමාගේ චින්තනයට අනුව ශරීරයේ සියලු අවයව ක්‍රියාකාරී වීම තුළින් විවිධත්වය අගයන බව.

පියවර 5.3.2 : සුදුසු පරිදි කණ්ඩායම් අතර විවාදයක් පැවැත්වීමට අවශ්‍ය උපදෙස් සිසුන්ට දෙන්න.
කඩදාසි හා පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.

පියවර 5.3.3 : සිසුන්ට කරුණු ගොනු කරගැනීම සඳහා පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡා කරන්න.

- දෙවියන්වහන්සේගේ සියලු දරුවන් තුළ තිබිය යුතු වැදගත්ම වටිනාකම ඒකත්වය බව.
- ජේසුස්වහන්සේගේ ගෝලයන් තුළත්, ගෝලයන්ගේ ගෝලයන් තුළත් ඒකත්වය ඇතිවීම ජේසුස්වහන්සේගේ යැදුම බව.
- ක්‍රිස්තු අනුගාමිකයන්ට පාවුල් තුමා පැවසුවේ කිතුනු අනුගාමිකයන් ඒකත්වයෙන් යුතුව ජීවත්විය යුතු බව. එපීස 4:1-16, 1 කොරින්ති 12:12-32
- ගෝලයන් අතර විවිධත්වය තුළ ඒකත්වය පැවතීම සඳ හා යෙරුසලමේ මන්ත්‍රණ සභාව රුකුලක් වූ බව.
- විවිධත්වය තුළ ඒකත්වය පිළිගැනීම අනුව ගැටළු සමඟින් ක්‍රිස්තියානිය මනුෂ්‍යත්වය තුළ පැවතෙන බව හා ජීවත්වන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ඒකත්වය/සාමයිකත්වය පැහැදිලි කරයි.
- විවිධත්වය තුළ ඒකීයත්වය නොපිළිගනිමු නම් මනුෂ්‍යත්වය හෝ ක්‍රිස්තියානිය විනාශය කරා ගමන් කරනු ඇත. අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කොට සනාථ කරයි.
- විවිධත්වය තුළ ඒකීයත්වය සහ එකට බැඳුනු බව සංසන්දනය කොට ඉන් මතුවන යහපත් හා අයහපත් දෑ එක් රැස්කරයි.
- බහුවිධ සමාජය සඳහා විවිධත්වය තුළ ඒකීයත්වය අදාළ වන බව තීරණය කොට එය ප්‍රකාශ කරයි.

ඇමුණුම 5.3.1 :

- ඒකත්වය දේවරාජ්‍යයේ වටිනාකමය. ඒකත්වය තුළින් යහපත ලබාගත හැකි බව ඒකාන්තය. විවිධත්වය තුළ ඒකීයත්වය හා ඒකීයත්වය තුළ එක්ව බැඳීම අපට කොටස් 2කට වර්ග කළ හැකිය. මුල් සභාවේ ගෝලයන් සියලු දේපල පොදුවේ තබා ගත්හ. ක්‍රියා 4:32-35
- ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් විවිධත්වය තුළ ඒකත්වයෙන් යුතුව ජීවත් වූයේ දැයි අප කල්පනා කර බැලිය යුතුය. ඒකත්වය තුළ අපි නව අනන්‍යතාවයක් ලබමු. එපීස 2:15-16, ගලාති 3:29, ජොහන් 17:20-23
- එසේම එකම ස්වභාවයක් හෝ ඉතා සමීපතම එකම පිළිවෙලක් ලැබෙන බව ඇතැමෙක් සිතති. එහෙත් වෙනස්කම් අනුමත කරන විට ඒකත්වය ස්වභාවිකය. අදාළය, යථාර්ථවත් යැයිය යනුවෙන් (රෝම 12:1-8, 1 කොරින්ති 12:12-31, එපීස 4:1-14) ඇතැමෙක් සිතති.
- මනුෂ්‍යත්වය වෙනස්කම් වලින් බැඳ දමනු ලැබ ඇත. උදාහරණ වශයෙන් විවිධ මිනිසුන් විවිධ සංස්කෘතීන් හා සිතිවිලි වලින් යුක්තය.
- අප මෙම වෙනස්කම් අනුමත නොකරන්නේ නම් ඒකත්වයෙන් ජීවත්වීම යථාර්ථයක් නොවනු ඇත.

- ඒකාධිපතිවාදය තුළ, යුද්ධ සංස්කෘතිය තුළ බලධාරීන් බලාපොරොත්තු පෙරදැරි කරගනිමින් බලාපොරොත්තු වන්නේ, සිතන්නේ ඔවුන්ගේම අදහස පමණය.
- ලෝක ඉතිහාසය තුළ මීට ප්‍රතිවාදී හැඟීම් මතුවී ඇත්තේ වෙනත් අදහස්ද ඇතිවූ නිසාය.

ඇමුණුම 5.3.2 :

- විවිධත්වය තුළ ඒකීයත්වය යන්න පැහැදිලි කරන්න.

නිපුණතාව 5.0 : කිතුනු වටිනාකම් අනුව (මිනිසා) ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 5.4 : කමාවේ ජීවිත ගත කරයි.

ක්‍රියාකාරකම 5.4 : "කමාවේ ජීවිතයක් ගත කරමු".

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 5.4.1
ඇමුණුම 5.4.2
ඩිමයි කඩදාසි, මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 5.4.1 : කමාව පිළිබඳ භාවනාවක් සූදානම් කර දරුවන් සමඟ භාවනාවක යෙදෙන්න.

- දේව රාජ්‍යත්වයේ ගුණාංගයක් ලෙස කමාව හඳුනා ගත යුතු බව.
- සමාව දීම දෙවියන්වහන්සේගේ ස්වභාවය නිසා අප ජීවත් වන බව. ලූක් 15:11-32
- දෙවියන්වහන්සේගේ සමාව අයදීමට පෙර අන් අයට සමාව දිය යුතු බව. මතෙව් 6:12
- සමාව දීම තුළින් අපගේ ජීවිතය අළුත් කරගත යුතු බව.

පියවර 5.4.2 :

- ඇමුණුම 5.4.1 හා ඇමුණුම 5.4.2 ලබාදෙන්න
- කණ්ඩායම් දෙකකට බෙදා මේවා භාවිතා කරමින් සාකච්ඡාවක යෙදෙන්න සලස්වන්න.
- කණ්ඩායමට අදාළ මාතෘකාව තෝරා ගන්නට සලස්වන්න.
- ඩිමයි කඩදාසි, මාකර් පෑන් හා බයිබල් ලබා දෙන්න.
- මාතෘකාවට අදාළව කරුණු ගොණු කර සූදානම් වන්න සලස්වන්න.
- කණ්ඩායම් අනාවරණය විවාදය තුළින් සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 5.4.3 :

- කුඩා කණ්ඩායම් දෙක මගින් විවාදය ඇසුරින් අනාවරණය සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- මාරුවෙන් මාරුවට ශිෂ්‍ය අදහස් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සෙසු කණ්ඩායම සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කරවන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- කමාව දේව දීමනාවක් වන අතර එය වැරදි කරන්නෙකුට තවත් එක් අවස්ථාවක් ලබා දෙන බව. ජොහන් 8:1-11
- අන්‍යන්ට සමාව දීමත්, අන්‍යයන්ගෙන් සමාව ලැබීමත් යන දෙකම වැදගත් බව. මතෙව් 6:12/18:23-35/ ලූක් 6:37
- සමාව ලැබූ අය වෙනස් වන බව. ලූක් 7:36-50/15:11-22
- සමාව ලැබීම සඳහා පසුතැවිල්ල (සමාව ලබන පුද්ගලයාගේ) කරුණාව (සමාව දෙන පුද්ගලයාගේ) පැවතීම අවශ්‍ය බව.
- සමාව අසීමිත බව. ලූක් 17:4

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සමාව දීම මෝඩ ක්‍රියාවක් ලෙස සලකන සමාජයක සමාව දීම නව ජීවිතයකට අවස්ථාවක් ලබාදෙයි යන්න පැහැදිලි කරමින් රචනාවක් ලියයි
- සමාව දීම අන්ත අසරණ තත්ත්වයක් ප්‍රකාශ කිරීම නොවේ. එය වගකීමකි. මෙම ප්‍රකාශනය උදාර මනුෂ්‍යත්වය පදනම් කරගෙන සාකච්ඡා කර තීරණයක් ගෙන එය පැහැදිලි කරයි.
- සමාව දීම හා සමාව ලැබීම දේව රාජ්‍යත්වය සඳහා වන ජීවිත රටාව බව සාක්ෂාත් කර පවසයි.
- සමාව දීම තුළින් නැවත වැරදි කිරීමට එය අවස්ථාවක් කර ගනියි නම් එවැන්නක් වෙනස් කිරීමට (ආකල්ප මාරුවකට) ගත හැකි පියවර සාකච්ඡා කර එය ගොනු කරයි.

ඇමුණුම 5.4.1

සමාව දීම

සමාව දීම සමාව ලද පුද්ගලයකුට නැවත වැරදි කිරීමට අනුබල දෙන නිසා සමාව යන වචනය ශබ්ද කෝෂයෙන් ඉවත් කිරීම පිළිබඳව අදහසක් පවතී. එහෙත්, එය ධනාත්මක චින්තනයක් නොවේ.

දෙවියන්වහන්සේගේ හෝ අන්‍යයන්ගේ සමාව යන්නෙන් තොරව කිසිවකුට ජීවත් විය නොහැකිය. මන්ද ජීවිතය යනු සිතුවිලි හා ක්‍රියාවෙන් වැරදි දේ සිට නිවැරදි දේ දක්වා චාරිකාවක් වන බැවිනි. අපගේ ගමන තුළ මින් වැළකිය නොහැක. ජීවිතය කිසිකලක වැටීමක් නිසා නොනැවතී සමාව නිසා නැගී සිටීමේ අවස්ථාවකි. එසේම එය අඛණ්ඩ ක්‍රියාවලියකි. සමාව දෙන තැනැත්තාගේ කරුණාවද, සමාව ලබන්නාගේ පසුතැවිල්ලද සමාව ක්‍රියාත්මක කිරීමට වැදගත්ය. සමාව නව ජීවිතයකට අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. මෙම අවස්ථාව වැරදි ලෙස භාවිතා කරන අයද වෙති. වැරදි කිරීම අවස්ථාවක් කර ගනිමින් වැරදි කිරීමට සැලසුම් කර ගනිමින් මනුෂ්‍යත්වයට විරුද්ධව කටයුතු කරන අය උදාර මනුෂ්‍යත්වයට පටහැනිව කටයුතු කරති. එම නිම කිරීමට දැනුවත් කිරීමේ ව්‍යාපෘති ඉදිරිපත් කළ යුතුය.

සමාව දෙවිඳුන් හා සමඟ යහපත් සබඳතාවයක් පවත්වා ගැනීමටත්, දෙවියන්වහන්සේගෙන් යැපීමටත් වැදගත්ය. ඇතැම් පුද්ගලයෝ නපුරට ඇලුම්ව හැමවිටම යහපත ප්‍රතික්ෂේප කරති. මෙය දෙවිඳුන්ට (ශුද්ධාත්මයාණන්ට) විරුද්ධ වන නපුරය. සමාව දීමට නොහැකි බව පැවසීමෙන් සමාව දීමේ අවශ්‍යතාවය බැහැර වේ. මාර්ක් 3:29

අප තුළින් හෝ අපගේ පක්ෂයට සිටින අය තුළින් ඔවුන් දැඩි ලෙස වැරදි කිරීම් වලට සම්බන්ධ වන විට බොහෝ අහිංසක ජනතාව ඉන් පීඩාවට පත්වෙති. මෙම තත්ත්වය තුළ ඔවුන්ගෙන් සමාව අයැද ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට අප කටයුතු කළ යුතුය.

ඇමුණුම 5.4.2 : ගවේෂණ උපදෙස් පත්‍රිකාව
ඇමුණුම 5.4.1 හොඳින් කියවා තේරුම් ගෙන ඔබගේ පංතියේ අයගේ අදහස් සමඟ සාකච්ඡා කර විවාදයක් පවත්වන්න.

මාතෘකාව - "සමාව මනුෂ්‍යාත්වය විනාශ කිරීමේ මූලික මාර්ගයයි". "මනුෂ්‍යාගේ තත්ත්වය නගා සිටුවීමට මූලික මාර්ගයය".

නිපුණතාව 5.0 : කිතුනු (මිනිස්) වටිනාකම් අනුව ජීවත් වෙයි

නිපුණතා මට්ටම 5.5 : බලාපොරොත්තුවේ ජීවිතයක් ගත කරයි

ක්‍රියාකාරකම 5.5 : "බලාපොරොත්තුවේ ජීවිත ගත කරමු".

කාලය : මිනිත්තු 80 යි

ගුණාත්මක යෙදවුම් :

- ශු බයිබලය
- ඇමුණුම 5.5.1 ට ඇතුළත් කණ්ඩායම් ගවේෂණ උපදෙස්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 5.5.1 :

- කපන ලද ගසක මුලකින් පැලයක් ආ බව පෙන්වන රූපයක් හෝ පැලයක් සහිත කැපූ ගසක් පංතියට පෙන්වන්න.
- ඒ පිළිබඳ සාකච්ඡා කිරීම මගින් පාඩමට ප්‍රවේශ වන්න. ඒ ආශ්‍රිතව බලාපොරොත්තුව ගැන අදහස් විමසන්න.
- ඒ ආශ්‍රයෙන් පහත දැක්වෙන කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ජීවිතයේ පදනම බලාපොරොත්තුව බව.
> - බලාපොරොත්තුව කඩවීමේ සිට බලාපොරොත්තුව ඉටුවීම දක්වා මනුෂ්‍යත්වය ඓතිහාසික ගමනක යෙදෙන බව.
> - දේව කරුණාව හිමිවන නව ජීවිතය බලාපොරොත්තුව බව. ගීතාවලිය 49:15
> - දුක් වේදනා, කළකිරීම් ආදිය.... මැද අනාගතය දක්වා ජීවිතය ඉදිරියට ගලා යන්නේ බලාපොරොත්තු මැද බව.

පියවර 5.5.2 :

- සුදුසු පරිදි පංතිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 5.5.1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්. ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 5.5.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් වන කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ක්‍රිස්තියානි බලාපොරොත්තුවේ පදනම ක්‍රිස්තු උත්ථානය බව. ජොහන් 11:17-27, 1 පේදුරු 1-3, 1 තිමෝති 1:3, 1 වැනි තෙසලෝනික 4:13, රෝම 5:1-2
- දෙවිඳුන් සමඟ ජීවත් වන විට බලාපොරොත්තුවේ ජීවිත ගත කළ හැකි බව. ගීතාවලිය 23:4, 1 තිමෝති 4:10
- ශු. රාත්‍රී භෝජනය, දේව රාජ්‍යත්වයේ භෝජන සංග්‍රහය නම් බලාපොරොත්තු සහගත සිදුවීම සඳහා පූර්ව රස විඳීමක් බව.
- බලාපොරෝතුව දේව රාජ්‍යත්වය තුළ ජීවත් වීම සඳහා දෙවිඳුන් දුන් ත්‍යාගයන් බව. 2 වැනි තෙසලෝනික 2:16, ලූක් 17:6, මාර්ක් 1:15
- බලාපොරොත්තුව දේව වරප්‍රසාදයක් බව. 1 කොරින්ති 15, රෝම 8:21-22

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- වර්තමාන සමාජය තුළ පෞද්ගලිකව හා සමාජයීය වශයෙන් අප තුළ ඇති බලාපොරොත්තු ලැයිස්තු ගත කරයි.
- උත්ථානය අපට බලාපොරොත්තුව දෙන බව පැහැදිලි කරයි.
- දෙවිඳුන් තුළ බලාපොරොත්තුව හා අන්‍යයන් තුළ බලාපොරොත්තුව මිනිසාට ජීවත් වීමට උපකාරී වේ යන මැයෙන් ඇදහිලි ප්‍රකාශනයක් ලියා දක්වයි.
- දෙවිඳුන් තුළ හා දේව රාජ්‍යත්වයේ වටිනාකම් තුළ බලාපොරොත්තුව ඇති විට, ඉතිරි වන සුළු දෙයින් පවා නැගිටිය හැකි බව ස්ථිර කොට අන්‍යයන්ට බලාපොරොත්තුව දෙයි.

ඇමුණුම 5.5.1

බලාපොරොත්තුව ජීවිතයට ඉතා වැදගත්ය. අප තුළ බලාපොරොත්තුවත් නැති නම් ජීවිතය අර්ථ ශූන්‍යය. අප ජීවත්වන සමාජ සංදර්භයට අනුව ජීවිතය ප්‍රශ්නාර්ථයක් වී ඇත. එහෙත් දුක වේදනාව, කළකිරීම තුළ අප පසුබට විය යුතු නොවේ. දෙවියන්වහන්සේ තුළ බලාපොරොත්තුව අන්‍යයන් තුළ බලාපොරොත්තුව, අනාගතය කෙරේ බලාපොරොත්තුව යන දෑ සහිතව අප ජීවිත වැටුණු ස්ථානයේ ඉතිරි වූ දෑ තුළින් නැගී සිටිය යුතුය.

ඉතිහාසය අපට බලාපොරොත්තුව දෙයි. නොමිනිස් ස්වභාවයේ සිට උදාර මනුෂ්‍යත්වය කරා යන ගමනක් ලෙස ජීවිතය සැලකිය යුතුය. පෞද්ගලිකවද සමාජයක් ලෙස ද අපගේ භූමිකාව සම්පූර්ණ කරන විට බලාපොරොත්තුව සහිත සාමජයක් ඇතිවනු ඒකාන්තය.

ඇමුණුම 5.5.2 :

1 කණ්ඩායම - වර්තමානයේ දිවැසිවර මෙහෙය විය යුත්තේ බලාපොරොත්තු රහිතව සිටින අයට බලාපොරොත්තුව ගෙන දීමය. පැහැදිලි කරන්න.

2 කණ්ඩායම - දේව රාජ්‍යත්වයේ වටිනාකම් පිළිබඳ බලාපොරොත්තුවෙන් ක්‍රියා කරමු. මෙය කිරීමට ඉටා ගෙන ප්‍රකාශ කරන්න.
විවාදයක් පවත්වන්න.
මරණින් මතු ජීවිතය පිළිබඳ බලාපොරොත්තුව තබන්න.
මරණයට පෙර අද අපගේ ජීවිතය පිළිබඳ බලාපොරොත්තු තබන්න. වඩා යහපත් කුමක්ද?

# 3 කොටස

## තක්සේරුව හා ඇගයීම

හැඳින්වීම - තක්සේරුව හා ඇගයීම

ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ

මූලාකෘති ප්‍රශ්න

## 11.3.1 තක්සේරුව හා ඇගයීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කරගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබාගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීම ය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරිපෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයන් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත්විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයන් ලබාදීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩ පිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතුවේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂය මාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (Student-Centred), නිපුණතා පාදක (Competence - Based) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (Activity - Oriented) කරගත් ප්‍රවේශයකින් යුක්තවේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (Transformation) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂය මාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම් වල දෙවැනි පියවරේදී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරු කරණයටත් ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේදී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකිවේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණ පා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශි වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්ති කාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේදී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේම චර්යා ගොඩනැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතුවේ.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින් ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන් කර ගැනීමයි. සිසු ඉගෙනීම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කරගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයයි. මේ අනුව ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක්වේ.

- සංකල්ප සිතියම් (Concept Maps)
- බිත්ති පුවත්පත් (Wall News Papers)
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් (Quizzes)
- ප්‍රශ්න සහ පිළිතුරු පොත් (Questions and Answer Books)
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු (Portfolios)
- සිසු නිර්මාණ ප්‍රදර්ශන (Exhibition)
- විවාද (Debates)
- සාකච්ඡා මණ්ඩල (Panel Discussion)
- සම්මන්ත්‍රණ (Seminars)
- ක්ෂණික කථා (Impromptu Speeches)
- භූමිකා රංගන (Role Plays)
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (Presentation of Literature Reviews)
- ක්ෂේත්‍ර පොත්/ස්වභාව අධ්‍යයන දිනපොත්/ හොඳ වැඩ පොත් (Field Books/Nature Diaries)
- ප්‍රායෝගික පරීක්ෂණ (Practical Tests)

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකිවේ.

## 11.3.2 ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ

1. පාසල් වාරය හා උපකරණ අංක : පළමු වාරය උපකරණ 01

2. ආවරණය කරන නිපුණතා මට්ටම : 2.1, 2.2

3. ආවරණය කරන විෂය අන්තර්ගතය :
   - පාවුල්තුමාගේ ක්‍රියාකාරී සේවයේ පසුබිම
   - සැබෑ ජීවිත පරිවර්තනය

4. උපකරණයේ ස්වභාවය :
   - පාවුල්ගේ සේවයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ගැඹුරින් දැනගැනීම සඳහා ක්ෂණික කථා ඉදිරිපත් කිරීම.

උපකරණයේ අරමුණු :
- පාවුල්ගේ පසුබිම හා හැරීම පිළිබඳ කරුණු සොයා බලයි.
- එම කරුණු සේවය සඳහා උපකාර වූ ආකාරය ගැඹුරින් සොයා බලයි.
- රැස්කරගත් තොරතුරු අනුසාරයෙන් ක්ෂණික කථා වලට සූදානම් වෙයි.

උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් :
- ක්‍රියාකාරකම පාඩම ආරම්භ කිරීමට පෙර උපකරණය පන්තියට හඳුන්වා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් තොරතරු එකතු කිරීමෙන් ආරම්භ වී පෞද්ගලිකව ක්ෂණික කථා ඉදිරිපත් කිරීමෙන් මෙය අවසන් වන බව සිසුන්ට දන්වන්න.
- සිසුන් කණ්ඩායම් 2කට වෙන් කරන්න.
- කණ්ඩායමට වෙන්වූ මාතෘකා අතරින් තම කණ්ඩායමට අදාළ මාතෘකා සටහන් පොතේ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- තොරතුරු ලබා ගැනීමට පරිශීලනය කළ යුතු මූලාශ්‍ර සොයා ගැනීමට මෙහෙයවන්න.
- තමා එක්රැස් කරගත් තොරතුරු සමස්ත කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම තුළින් කෂණික කථා ඉදිරිපත් කරන සිසුන් තෝරා ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ක්ෂණික කථා පවත්වන දිනය සිසුන්ට දන්වන්න.

සිසුන්ට උපදෙස් :
- තොරතුරු රැස් කිරීම සඳහා තම කණ්ඩායමට ලැබුණු ආකෘතිය සටහන් කර ගන්න.
- සුදුසු මූලාශ්‍ර පරිශීලනය කරමින් නිවැරදි තොරතුරු ගොණු කරගන්න.
- කණ්ඩායම් වශයෙන් රැස්කරගත් තොරතුරු අනුව ක්ෂණික කථා සූදානම් කරගන්න.
- කණ්ඩායම් තුළින් නායකයන් තෝරා ගෙන ක්ෂණික කථා නියමිත දිනට ඉදිරිපත් කරන්න.

පළමු කණ්ඩායම : • පාවුල්ගේ පවුල් පසුබිම
1. පාවුල්ගේ සේවයට පසුබිම
2. එය පසුකාලීන සේවයට උපකාර කිරීම
3. අපගේ පසුබිම සේවයට උපකාර වන අන්දම

දෙවන කණ්ඩායම : • ජීවිත පරිවර්තනය
1. දමස්කයට යෑමට පෙර පාවුල්ගේ ක්‍රියා පිළිවෙල
2. පාවුල්ගේ හැරීම හා හැරීමට බලපෑ පසුබිම
3. හැරීමෙන් පසු පාවුල්ගේ ක්‍රියා කලාපයෙහි වෙනස්කම

ඇගයීම් ක්‍රමය :

| නිර්ණායක / කණ්ඩායම් අංක හා නම | අරමුණු පැහැදිලිව නිවැරදිව සාක්ෂාත් කිරීම | කාර්යයේ නියැලීම හා වගකීම ඉටුකිරීම | තර්කානුකූල බව හා අර්ථවත් වීම | කණ්ඩායම් මෙහෙයවීම හා නායකත්ව ලක්ෂණ | සිත්ගන්නා සුළු බව | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |

ලකුණු පරාසය : ඉතා හොඳයි 4
හොඳයි 3
මධ්‍යස්ථයි 2
සංවර්ධනය විය යුතුයි 1

1. පාසල් වාරය හා උපකරණ අංක : දෙවන වාරය - උපකරණ 02

2. ආවරණය කරන නිපුණතා : මට්ටම : 3.6, 3.7

3. ආවරණය කරන විෂය අන්තර්ගතය :
- ස්වාභාවික ව්‍යසනයන්ට මුහුණ දීම.
- හිංසනයට හා පීඩනයට මුහුණ දීම.

4. උපකරණ ස්වභාවය :
- ස්වාභාවික ව්‍යසන හා හිංසන තත්ත්වයෙන් නැගී සිටීම පිළිබඳව ගැඹුරින් දැන ගැනීමට ගවේෂණාත්මක ව්‍යාපෘතියක් සකස් කිරීම.

5. උපකරණයේ අරමුණු :
- ස්වාභාවික ව්‍යසනයෙන්, හිංසනයෙන් ගැලවීමට කිතුනුවකු ලෙස දැනට ගෙන ඇති පියවර හඳුනා ගනියි.
- ස්වභාවික හානි හා හිංසනය තුළ කිතුනුවකු ලෙස අපහට කළ හැකි දේ තේරුම් ගනියි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් :
- ක්‍රියාකාරකම ක්‍රියාත්මක කිරීමට පෙර උපකරණය පන්තියට හඳුන්වා දෙන්න.
- අවශ්‍ය පත්‍රිකා ලබාදී ක්‍රියාකාරකමට යොමු කරන්න.
- කණ්ඩායම් වශයෙන් තොරතුරු එම ස්ථානයක් නරඹා ලබා ගැනීමට ඉඩ සලසන්න.
- ව්‍යාපෘතිය සකස් කළ පසු මෙය අවසන් බව දැන්වීම.
- කණ්ඩායම් බෙදා ව්‍යාපෘතියේ යෙදීමට යොමු කරන්න.
- තම කණ්ඩායමට අදාළ විශේෂ කරුණු ක්ෂේත්‍ර අධ්‍යයන පොතේ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- අවශ්‍ය තොරතුරු ලබාගන්නා අන්දම, ප්‍රශ්නාවලිය සකස් කර පිළිතුරු ගන්නා ආකාරය, සම්මුඛ සාකච්ඡා ලබා ගන්නා ආකාරය විස්තර කරන්න.
- සොයාගත් තොරතුරු කණ්ඩායම තුළ සාරාංශ කර තම යෝජනා ඇතුළුකොට පොත් පිංච සකස් කරන්න.
- ව්‍යාපෘතිය ලබා දිය යුතු අවසාන දිනය දන්වන්න

7. සිසුන්ට උපදෙස් :
- තොරතුරු සොයා ගැනීමේදී ලැබී ඇති ආකෘතිය ගැන සැලකිලිමත් වන්න.
- සෑම කෙනෙකු ළඟම ආකෘතිය සටහන් කරගන්න.
- පුද්ගලයන් සොයා ඔවුන්ගෙන් ආකෘතිමය සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබාගන්න.
- එය පොතෙහි සටහන් කරගන්න.

- ප්‍රශ්නාවලියට පිළිතුරු ලබාගෙන එහි සාරාංශය පොතෙහි තබාගන්න.
- කණ්ඩායම සමඟ සාකච්ඡා කර සාරාංශ කර සටහන් කරන්න.
- යෝජනා කණ්ඩායම සමඟ සාකච්ඡා කර ගොණු කරන්න.
- එය ව්‍යාපෘතියක් සේ සකසා ගුරුවරයාට භාර දෙන්න.

8. පළමු කණ්ඩායම :
- ස්වාභාවික ව්‍යසන තත්ත්වය අභිභවා නැගී සිටිමු. ව්‍යසනයෙන් සිදුවූ හානි
- එවැනි ව්‍යසන තත්ත්වයන්ට බයිබලය තුළ ගෙන ඇති පියවර
- දැනට එම තත්ත්වයෙන් ගොඩ ඒමට ඔවුනට ලැබී ඇති ආධාර
- එම ආධාරවල සාර්ථකත්වය
- ඔවුන් එම තත්ත්වයෙන් ගොඩ ගෙන ඒමට ගත හැකි පියවර ඉදිරිපත් කරයි.

9. දෙවන කණ්ඩායම :
- හිංසනය හා පීඩනයෙන් වැළකෙමු.
- හිංසාවට පත්වූ අයකු මුණ ගැසී හිංසාව හඳුනා ගනියි
- එවැනි තත්ත්වයකට බයිබලයේ ඇති අවවාද සලකා බලයි.
- දැනට එම තත්ත්වයෙන් ගොඩ ඒමට කර ඇති ක්‍රියාවලිය හඳුනා ගනියි.
- එහි සාර්ථකත්වය විමසයි.
- ඔවුන්ට එම තත්ත්වයෙන් ගොඩ ඒමට කළ යුතු යෝජනා දක්වයි.

10. ඇගයීම් ක්‍රමය :

| නිර්ණායක / කණ්ඩායම් අංක හා නම | අරමුණු හඳුනාගෙන ළඟාවීම | තොරතුරු ලබා ගැනීම හා තර්කානුකූල බව | නායකත්වය හා මෙහයවීම | පිරිසිඳු හා පිළිවෙළට ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීම | යෝජනා වල දැකිය හැකි යථාර්ථවාදී බව | |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |

11. ලකුණු පරාසය :

ඉතා හොඳයි 04
හොඳයි 03
මධ්‍යස්ථයි 02
සංවර්ධනය විය යුතුයි 01

1. පාසල් වාරය හා උපකරණ අංක : තුන්වන වාරය - උපකරණ 03

2. ආවරණය කරන නිපුණතා මට්ටම : 4.1

3. ආවරණය කරන විෂය අන්තර්ගතය :
- ප්‍රුදෙව් සමාජයේ අගයන් ජීවිතයට අනුගත කරගැනීම

4. උපකරණයේ ස්වභාවය :
- ප්‍රුදෙව් සමාජයේ අගයයන් හඳුනාගෙන අද සමාජයට එය ගැලපෙන ලෙස අදාළ කරගැනීම සඳහා නාට්‍ය ඉදිරිපත් කිරීම

5. උපකරණයේ අරමුණු :
- ප්‍රුදෙව් සමාජයේ යහපත් වටිනාකම් හඳුනා ගනියි.
- අද ශ්‍රී ලංකාවට ඒ ගුණාංග අනුගත කරගත හැකි විලාසය පෙන්වා දෙයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් :
- ක්‍රියාකාරකම් 2.1 ආරම්භ කිරීමට පෙර උපකරණය පන්තියට හඳුන්වා දෙන්න.
- තොරතුරු රැස්කර නාට්‍ය ඉදිරිපත් කිරීමෙන් පසු මෙය අවසන් වන බව සිසුන්ට දන්වන්න.
- සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- තේමාව හා මග පෙන්වීම් කරුණු, සටහන් පොතේ සටහන් කරගැනීමට උපදෙස් දෙන්න.
- මෙය ඉගැන්වීම් අතරතුර සිදුවන ඇගයීමක් බව සිසුන්ට දන්වන්න.
- තොරතුරු ලබාගැනීම සඳහා පරිශීලනය කළ යුතු මූලාශ්‍ර සොයා ගැනීමට මෙහෙයවන්න.
- තමා එක් රැස්කර ගත් තොරතුරු සමස්ත කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.
- චරිත තෝරා බේරා ගැනීමට හා නාට්‍ය සූදානම් වීමට කාලය ලබා දෙන්න.
- නාට්‍ය ඉදිරිපත් කරන දිනය දන්වන්න.

7. සිසුන්ට උපදෙස් :
- තොරතුරු රැස්කිරීම සඳහා තම කණ්ඩායමට අදාළ මාතෘකාව හා මගපෙන්වීම් සටහන් කරගන්න.
- සුදුසු මූලාශ්‍ර භාවිතා කර නිවැරදි තොරතුරු ගොණු කරන්න.
- කණ්ඩායම් වශයෙන් රැස්කරගත් තොරතුරු අනුව නාට්‍ය ඉදිරිපත් කරන්න.
- නායකත්වය තුළ සම්පත් තිබෙන ලෙස භාවිතා කරමින් නාට්‍ය පෙන්වන්න.

නාට්‍ය මාතෘකා

| | | | |
|---|---|---|---|
| පළමු කණ්ඩායම | : | • | ජුදෙව් සමාජයේ යහපත් පවුල |
| දෙවන කණ්ඩායම | : | • | බයිබලයේ දිවැසිවරයෙක් ලංකාවට පැමිණේ |
| තුන්වන කණ්ඩායම | : | • | බහුවිධ සංදර්භයේ අනුගමනය කළ හැකි යහපත් ගුණාංග |
| හතරවන කණ්ඩායම | : | • | වර්ගවාදයෙන් ඔබ්බට යැමට ජේසුස්වහන්සේගේ මග පෙන්වීම |

ඇගයීම් ක්‍රමය

| නිර්ණායක කණ්ඩායම් අංක/නම | අරමුණු සාක්ෂාත් කිරීම | ප්‍රායෝගික ත්වය හා ඉටුකරගැනී මේ හැකියාව | නායකත්ව හා ඉදිරිපත් කිරීම් | කාර්ය නියැලීම හා වගකීම | කරුණු ගොණු කර ඉදිරිපත් කිරීම | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |

| | | | |
|---|---|---|---|
| ලකුණු පරාසය | : | ඉතා හොඳයි | 04 |
| | | හොඳයි | 03 |
| | | මධ්‍යස්ථයි | 02 |
| | | සංවර්ධනය විය යුතුයි | 01 |

(ඉගැන්වීම් අතරතුර ඇගයීමක් ලෙස මෙය භාවිතා කළ හැක).

## මූලාකෘති ප්‍රශ්න පත්‍රය - 11 ශ්‍රේණිය

**ක්‍රිස්තු ධර්මය 1 පැය එකයි**

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. අංක 1-40 දක්වා ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගෙන එය සලකුණු කරන්න.

1. යෙසායා දිවැසිවරයා පවසන ලෙස අනාගත සාම රාජ්‍යය තුළ
   1. අන්ධකාරයේ සිටි සෙනඟ දෙවිදූන් දකින්නෝය.
   2. අන්ධකාරයේ සිටි සෙනඟ ජීවිතය දකින්නෝය.
   3. අන්ධකාරයේ සිටි සෙනඟ ආලෝකය දකින්නෝය.
   4. අන්ධකාරයේ සිටි සෙනඟ පාපය අත් දකින්නෝය.

2. යහපත් බැටළු එඬේරා
   1. බැටළුවන්ට පසුපසින් ගමන් ගනී.
   2. බැටළුවන්ට ඉදිරියෙන් ගමන් ගනී.
   3. බැටළුවන්ට මැදිව ගමන් ගනී.
   4. බැටළුවන්ට දෙපසින් ගමන් ගනී.

3. දෙවියන්වහන්සේගේ රාජ්‍යත්වය සඳහා කටයුතු කිරීමේදී
   1. දුක් විඳීම අත්‍යවශ්‍යය.
   2. දුක් විඳීම අවශ්‍ය නොවේ.
   3. වෙනත් විකල්පයක් නොමැති නම් දුක් විඳීමට සිදුවේ.
   4. සිතාමතාම දුක් විඳීමට සිදුවේ.

4. වර්තමාන සංදර්භය තුළ, දුක් විඳින සේවක ආකෘතිය අනුගමනය කිරීමේදී
   1. ජේසුස්වහන්සේගේ ගුණාංග ආදර්ශයට ගත යුතුය.
   2. ජේසුස්වහන්සේගේ දේශනා ප්‍රචාරය කළ යුතුය.
   3. ජේසුස්වහන්සේ මෙන් ප්‍රතික්ෂේපයට ලක්විය යුතුය.
   4. අවශ්‍ය නම් ජේසුස්වහන්සේ මෙන් ජීවිතය පිදීමට පවා සූදානම් විය යුතුය.

5. යහපත් සමාජයක් සඳහා මිනිස් ජීවිත වෙනස්කිරීමේදී
   1. ආර්ථික දියුණුවක් ඇති කළ යුතුය.
   2. තන්හාව නැති කළ යුතුය.
   3. මානව භක්තිය වර්ධනය කළ යුතුය.
   4. පැරණි ශිෂ්ඨාචාරය මතකයට නැංවිය යුතුය.

6. ජුදෙව් මන්ත්‍රණ සභාවේදී සද්දුසි පරිසි ගැටුම තම වාසියට යොදාගත් පාවුල් තුමාගේ එම ක්‍රියා කලාපය කිතුනුවෙකු ලෙස
   1. අනුමත කළ හැකිය.
   2. අනුමත නොකළ හැකිය.
   3. අවස්ථාව අනුව අනුමත කළ හැකිය.
   4. අනුමත කළ යුතුය.

7. මිනිසාගේ ජීවිතයේ සිදුවන ධනාත්මක වෙනස්කම් හා හැරීම් පූර්ණ ජීවිතයක් කරා යාමට බලපාන්නේ
   1. එම වෙනස්කම් ක්ෂණිකව සිදුවුවොත් පමණි.
   2. එම වෙනස්කම් සිතා මතා ඇති කරගතහොත් පමණි.

8. කෝවල නායකත්වයට වඩා හවුල් නායකත්වය ඵලදායි වන්නේ
    1. තනි පුද්ගලයෙකුට වඩා පුද්ගලයින් කීප දෙනෙකු කැපී පෙනෙන නිසාය.
    2. හවුල් නායකත්වය තුළින් ගනු ලබන ඒකමුතු තීරණ ක්‍රියාත්මක කිරීම පහසු නිසාය.
    3. එක් නායකයෙකුගේ හැකියා අනික් නායකයින්ගේ හැකියා මගින් ඔප මට්ටම් වන නිසාය.
    4. හවුල් නායකත්වයේදී සියලුම කරුණු සමාලෝචනය වන නිසාය.

9. නිවැරදි කරුවෙකු වූ පාවුල් තුමා පිලිප්පියේදී මුහුණ පෑ සිදුවීම මගින් වර්තමානයේ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන අයට ගත හැකි පාඩම වන්නේ
    1. නිතරම පාලකයන් සතුටු වන ලෙස ක්‍රියා කළ යුතු බවයි.
    2. දුක මධ්‍යයේ වුවත් දෙවිඳුන් වෙනුවෙන් සාක්ෂි දැරිය යුතු බවයි.
    3. ප්‍රශ්න ඇතිවන ස්ථාන වලදී නිර්භීතව ක්‍රියාත්මක විය යුතු බවයි.
    4. ප්‍රශ්න ඇතිවන ස්ථාන තෝරා බේරා ඒවා මග හරිමින් කටයුතු කළ යුතු බවයි.

10. සාවුල් පාවුල් ලෙස හැඳින්වෙන්නේ
    1. දමස්කට යාමේදී සිදුවූ අභ්‍යන්තර විපර්යාසයෙන් පසුවය.
    2. දමස්කයට යාමෙන් පසු සිදුවූ වෙනස්කම් වලින් පසුවය.
    3. ලූක් තුමා සාවුල් පාවුල් යනුවෙන් වෙනස් ලෙසින් ආමන්ත්‍රණය කළ නිසාය.
    4. පාවුල් ග්‍රීක ප්‍රදේශ වලට ඇතුල් වීමෙන් පසු ග්‍රීක නම භාවිතා කළ නිසාය.

11. තාර්සස් නුවර ඉපදීම නිසා ශු. පාවුල් තුමා ලැබුවාවූ විශේෂම වරප්‍රසාදය වූයේ
    1. රෝම පුරවැසිභාවයයි.
    2. ග්‍රීක භාෂාව දැන ගැනීමයි.
    3. විජාතීන් ආශ්‍රය කිරීමට පුරුදු වීමයි.
    4. පරිසිවරයකු ලෙස ඇති දැඩි වීමට හැකියාවන් ලැබීමයි.

12. නොදැන නමස්කාර කරන දෙවියන් පිළිබඳව පාවුල් තුමා ප්‍රකාශ කළේ
    1. එපීස වැසියන්ටය.
    2. ඇතැන්ස් වැසියන්ටය.
    3. කොරින්තියේ වැසියන්ටය.
    4. පිලිප්පියේ වැසියන්ටය.

13. ක්‍රිස්තු භක්තිකයකු නොවුවත් අවිහිංසාවාදීව විමුක්ති සටන ජය ගනු ලැබුවේ
    1. මාටින් ලූතර් කිං තුමාය.
    2. පොලිකාෆ් තුමාය.
    3. පර්පෙචුවා තුමාය.
    4. මහත්මා ගාන්ධි තුමාය.

14. පැරණි ගිවිසුමේ දුක් විඳින සේවකයා යන වචනය මුල් අවස්ථාවේදී භාවිතා කර ඇත්තේ
    1. දුක් විඳි දිවැසිවරුන් හැඳින්වීමටයි.
    2. මිසරයේ වහල් සේවයේ යෙදුණු ජනතාව හැඳින්වීමටයි.
    3. ඉතිරිවූ ඉශ්‍රායෙල් ජනතාව හැඳින්වීමටයි.
    4. ජේසුස්වහන්සේ හැඳින්වීමටයි.

15. වර්තමාන ශ්‍රී ලාංකික සමාජයේ පවුල් සංස්ථාවට බලවත් තර්ජනයක් වන්නේ
    1. ආර්ථික අපහසුතාවයයි.
    2. පවුලේ සාමාජිකයින් නොයෙක් අපචාරයන්ට ගොදුරු වීමයි.
    3. දෙමාපියන් සිය වගකීම පැහැර හැරීමයි.
    4. ප්‍රේමය මත සබඳතා ගොඩ නගා ගැනීම පිළිබඳව උදාසීන වීමයි.

16. පුරුෂාධිපත්‍යයෙන් යුත් සමාජයකට ක්‍රිස්තුස්වහන්සේගේ දේශනා ඇසුරෙන් දිය හැකි පණිවිඩය නම්
   1. පුරුෂාධිපත්‍යය සියලු දෙනා පිළිගත යුතු බවයි.
   2. කාන්තාවන් ආගන්තුක සත්කාරයෙහි නොයෙදිය යුතු බවයි.
   3. කාන්තාවන්ට විශේෂ වූ සමාජ තහංචි දැමිය නොයුතු බවයි.
   4. කාන්තාවන් සමාජ අභියෝග වලට මුහුණ නො පෑ යුතු බවයි.

17. වර්තමාන කිතුනුවන්ට මුල් කිතුනු සභාවෙන් ගත හැකි මහඟු ආදර්ශය නම්
   1. එකිනෙකාගේ අවශ්‍යතාවයන් සැපයීමට නැඹුරු වීමයි.
   2. විශේෂ දිනයන් නමස්කාරය සඳහා වෙන් කර ගැනීමයි.
   3. උපස්ථානය සඳහා වෙනමම කණ්ඩායමක් යොදා ගැනීමයි.
   4. ජෙරුසලම් දේව මාළිගාවේ නමස්කාර කිරීමයි.

18. ප්‍රේමය හා එඬේර කාර්ය භාරය අත්වැල් බැඳගත යුතු බව හඟවන බයිබල් පාඨය නම්
   1. එඬේරෙකු නැතිව බැටළුවෝ විසිර ගොස් සිටිති.
   2. මම එඬේරුන්ට විරුද්ධව සිට මාගේ බැටළුවන් ඔවුන් අතින් ආපසු ගන්නෙමි.
   3. මම බැටළුවන් උදෙසා මාගේ දිවි පුදමි.
   4. හොඳ බැටළුවන් ගෙන් නරක බැටළුවන් මම වෙන් කරන්නෙමි.

19. වර්තමාන ලෝකය තුළ දක්නට ලැබෙන භේද භින්නතාවන්ට ප්‍රධාන හේතුව නම්
   1. ගෝලීයකරණයේ අයහපත් බලපෑමයි.
   2. ජාතීන් විශාල සංඛ්‍යාවකගෙන් ලෝක සමාජය සෑදී තිබීමයි.
   3. ඇතැම් ජාතීන් අන් අය කෙරේ සැකයෙන් බැලීමයි.
   4. ලෝක ජාතීන් අතර සහෝදරත්වයේ හැඟීම් දක්නට නොලැබීමයි.

20. කිතුනු දරුවකු ලෙස ඔබට පාසල් සමාජය තුළ සාමය ගොඩ නැගීමට දායක විය හැක්කේ
   1. "යුද්ධය ද සාමය ද" යන මාතෘකාව පිළිබඳ විවාදයක් පැවැත්වීමෙනි.
   2. තමාට හෝ තම මිතුරෙකුට අසාධාරණයක් සිදුවූවොත් එය ඉවසිල්ලෙන් විඳ දරා ගැනීමෙනි.
   3. ගුරුවරුන් සමඟත් සිසුන් සමඟත් හැමවිටම මිත්‍රශීලීව හැසිරීමෙනි.
   4. සාමය පිළිබඳ ප්‍රකාශන පාසලේ සුදුසු ස්ථාන වල ප්‍රදර්ශනය කිරීමෙනි.

21. දිළිඳුකමට බලපාන හේතුව වන්නේ
   1. මිනිසාගේ තණ්හාවය.
   2. මිනිසාගේ අලසභාවයය.
   3. දෙවිඳුන්ගේ කැමැත්තය.
   4. ස්වාභාවික ව්‍යසනයන්ය.

22. සුනාමි ව්‍යසනය
   1. මිනිසාගේ පාපය සඳහා දේව දඬුවමකි.
   2. ජේසුස්වහන්සේගේ දෙවැනි ආගමනය පිළිබඳ සංඥාවකි.
   3. ලෝකාන්තිමය පිළිබඳ සංඥාවකි.
   4. භූ චලන නිසා හටගත් උත්ක්ෂිප්ත වීම් හා ගිලා බැසීම් වල ප්‍රතිඵලයකි.

23. දේව රාජ්‍යයේ පුරවැසියන් යනු
   1. දිළින්දන්ය.
   2. පීඩාවට පත්වූවන්ය.
   3. බෙදා නොගන්නන්ය.
   4. පරාර්ථකාමීන්ය.

24. බහුවිධ සමාජයක කිතුනු මෙහෙවර විය යුත්තේ
    1. එකට එක්ව ජීවත්වීමයි.
    2. නපුර දරා ගෙන ජීවත් වීමයි.
    3. විකල්ප දර්ශනයන්ට ගරු නොකිරීමයි.
    4. තම අදහස් වලට අන්‍යයන් නම්මවා ගැනීමයි.

25. ජනවාර්ගික ගැටළුවට පිළියම වන්නේ
    1. සාමය පිළිබඳ කථා කිරීමයි.
    2. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සාකච්ඡාවට ගැනීමයි.
    3. බලය බෙදා ගැනීමයි.
    4. විදේශ ගත වීමයි.

26. කිතුනුවන් අන්‍යාගමිකයන් හා ජීවත් විය යුත්තේ
    1. ඔවුන්ට කිතුනු ආගමේ වටිනාකම් ගැන පැවසීමෙනී.
    2. ඔවුන් කිතුනු ආගමට හරවා ගැනීමේ පරමාර්ථයෙනි.
    3. ඔවුන් සමඟ ආහාර බෙදා ගැනීමෙනී.
    4. ආගමික වෙනස්කම් නොසලකා එකට එක්ව එකමුතු කමිනි.

27. ජීවත්වන වේද සාක්ෂිකයා යන්නෙහි අර්ථය වන්නේ
    1. දේව රාජ්‍යත්වය ස්ථාපනය කිරීම සඳහා වෙහෙසෙන්නන්ය.
    2. දේව රාජ්‍යත්වය සඳහා දිවි පුදන්නන්ය.
    3. දේව රාජ්‍යත්වය සඳහා ධෛර්යයෙන් හා නිර්භීතකමින් ජීවත් වෙන්නන්ය.
    4. දේව රාජ්‍යත්වය පිළිබඳ දේශනා කරන්නන්ය.

28. ජුදෙව් සමාජයේ මෙන්ම අප සමාජයේත් ඇති යහපත් වටිනාකමක් වන්නේ
    1. ආගන්තුක සත්කාරයයි.
    2. පීතෘ මූලිකත්වයයි.
    3. තම ජාතියට ආදරය කිරීමයි.
    4. ණයකරුවන් ණයෙන් නිදහස් කිරීමයි.

29. කිතුනු ප්‍රේමය නියම වශයෙන් ක්‍රියාත්මක වන්නේ
    1. භාර්යාවන් තම ස්වාමිපුරුෂයාට මුළු ජීවිත කාලය තුළම කීකරුව සේවය කිරීමෙනී.
    2. ජේසුස්වහන්සේ මෙන් අප ද කුඩා දරුවන් සුරතල් කිරීමෙනී.
    3. ප්‍රේමය පිළිබඳ ක්‍රිස්තුස්වහන්සේගේ ආඥාව භාවනා කාරීමෙනී.
    4. අන්‍යයින් වෙනුවෙන් කෙනෙකු තම ජීවිත පරිත්‍යාග කිරීමෙනි.

30. දැඩි මත දරණ නිමල්ගේ ක්‍රියා කලාපය ඉදිරියේ කමල්ගේ ක්‍රියා කලාපය විය යුත්තේ
    1. ඔහුට දේශනා කිරීමයි.
    2. ඔහුගේ වැරදි තැන් සොයා බලා ඔහුට ඒවා පෙන්වා දීමයි.
    3. ඔහුගේ අදහස් අවඥාවෙන් බැහැර කිරීමයි.
    4. ඔහුගේ අදහස් වලට ද ඉවසිල්ලෙන් සවන් දීමයි.

31. වර්තමාන සංදර්භය තුළ දේව රාජ්‍ය වටිනාකම් බෙදා ගැනීමේ පරිපූර්ණභාවය අපට දැක ගත හැකි වන්නේ,
    1. සියලු භේද වලින් තොර රටක් බිහිවූ පසුය.
    2. සියලු තාක්ෂණික ක්‍රම උපයෝගි කර ගනිමින් ධර්ම ප්‍රචාරය කිරීමෙන් පසුය.
    3. ශ්‍රී ලාංකික ක්‍රිස්තුස්වහන්සේ අප අනාවරණය කරගත් පසුවය.

32. ඕනෑම පුද්ගලයෙකු පීඩනයට පත්වූ විට අප ඔවුන්ට උපකාර කළ යුත්තේ,
1. ඒ මගින් සදාතන ජීවනය ලබා ගත හැකි නිසාය.
2. උදාර මනුෂ්‍යත්වය තුළ මිනිසා පීඩනයට පත් කිරීම දේව සැලැස්මට විරුද්ධ නිසාය.
3. දුක් විඳින ජනතාවට පිහිට වීමෙන් ස්වර්ග මාර්ගය විවෘත වන නිසාය.
4. සමාජය යහපත් ලෙස ගොඩ නැගීමට නම් සමාජය පීඩනයෙන් තොර විය යුතු නිසාය.

33. සමස්ත මානව වර්ගයා දෙවියන්වහන්සේ විසින් පිළිගනු ලබන බව පැහැදිලි කරන සිද්ධිය වන්නේ
1. උපස්ථායකයින් සත් දෙනා තෝරා ගැනීම පිළිබඳ සිද්ධියයි.
2. පාවුල් තුමා ලුස්ත්‍රාවේදී කොරා සුවපත් කිරීම පිළිබඳ සිද්ධියයි.
3. අනනියස් පාවුල්ට සුවය දීම පිළිබඳ සිද්ධියයි.
4. පේදුරු හා කොර්නේලියස් පිළිබඳ සිද්ධියයි.

34. කිතුනුවන් අත් දකින විමුක්තියේ සුවිශේෂත්වය නම්
1. එය ඔවුන්ගේම උත්සාහයේ ප්‍රතිපලයක් නොවීමයි.
2. එය අරගලයෙන් තොරව ලබාගත හැකිවීමයි.
3. එය ව්‍යවස්ථාවට අනුකූලව ජීවත්වීමෙන් ලබාගත හැකි වීමයි.
4. එය සාමකාමී සාකච්ඡාවක ප්‍රතිඵලයක් වීමයි.

35. ස්වාභාවික ව්‍යසනයන්ගෙන් අවතැන් වූවන්ට සහනාධාර බෙදීමේදී ජේසුස්වහන්සේ විනයධරයන්ට කළ චෝදනා මතකයට නංවන්නේ
1. ආධාර සමහරුන්ට නොලැබීම පිළිබඳවය.
2. ආධාර බෙදීමේදී දායකවූවන්ගේ නම් අනවශ්‍ය ලෙස ප්‍රසිද්ධ කරගැනීම පිළිබඳවය.
3. ආධාර හිමි නොවිය යුතු අය ඒවා ලබාගැනීම පිළිබඳවය.
4. ඇතැමුන් ආධාර ඔවුන්ගේ ප්‍රයෝජනයට ගැනීම පිළිබඳවය.

36. කිතුනුවන් වන අපි විවිධත්වය හා ඒකීයත්වය අගය කරමු. මේ අනුව
ජුදෙව් හා විජාතික කිතුනුවෝ එක්සත් සහෝදරත්වයකට ඇතුල් වූහ.
එක එක අවයවය සන්ධි කොට ඒකාබද්ධ කරනු ලැබේ.
වර්තමාන සමාජයෙන් ඒකත්වය අපේක්ෂා කළ නොහැකිය.
කිතුනුවා විවිධත්වය තුළින් ඒකත්වයට පැමිණිය යුතුය.
මිනිසුන්ගේ සමාජමය තරාතිරම් සලකා බැලිය යුතුය.
මින් වඩාත් නිවැරදි වන්නේ
1. A හා C පමණි
2. C හා D පමණි
3. A හා D පමණි
4. B හා E පමණි

37. කිතුනු සාමුහිකත්වය පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ
කිතුනු සාමුහිකත්වයේ පදනම ජේසුස්වහන්සේ හා දෙවියන්වහන්සේ අතර පවතින සම්බන්ධතාවයයි.
කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීමේදී සාමුහිකත්වයක් ඇතිවේ.
සාමුහිකත්වය තහවුරු කරන්නේ පෞද්ගලික යාච්ඤාව මගිනි.
කිතුනු සාමුහිකත්වය සඳහා එකමුතු කමට ඇති සියලු බාධක ඉවත් කළ යුතුය.
මින් වඩාත් නිවැරදි වන්නේ
1. A හා C
2. B හා D
3. A හා D
4. C හා D

38. ශ්‍රී ලංකාවේ කිතුනු නිකායයන් ක්‍රිස්තුස්වහන්සේ තුළ එකම සභාවක් බවට පත් කිරීම සඳහා,

A. "ඇත්තේ එකම සමිදාණන් වහන්සේත්, එකම බව්තීස්මයත්" බව අවධාරණය කළ යුතුය.

B. "ක්‍රිස්තුස්වහන්සේ භේදයේ මැද බිත්ති බිම දමා" එකම ජනතාවක් ලෙස ජීවත්වීමට කළ මග පෙන්වීම ආදර්ශයට ගත යුතුය.

C. "මිනිසුන්ගේ තරාතිරම් බැලීමෙන් වැළකීමට" සිතා ගත යුතුය.

D. එක් එක් අවයවයන් මෙන් ඒ ඒ නිකායයන් යහපත් අන්දමින් ක්‍රියා කිරීම සෑහේ යයි පිළිගත යුතුය.

මින් වඩාත් නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ

1. A හා B
2. B හා C
3. C හා D
4. A හා D

39. කිතුනු බලාපොරොත්තුව පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ

A. ශු සහභාගිකමේ මෙහෙය දේව රාජ්‍යත්වයේ භෝජන සංග්‍රහය නම් බලාපොරොත්තු සහගත සිදුවීම සඳහා පූර්ව රස විඳීමකි.

B. බලාපොරොත්තුව දේව රාජ්‍යත්වය තුළ ජීවත්වීම සඳහා දෙවිඳුන් දුන් ත්‍යාගයකි.

C. කිතුනු බලාපොරොත්තුව පෞද්ගලිකත්වය මත ගොඩ නගා ගත හැකිය.

D. බලාපොරොත්තුව, දුක, වේදනාව, කළකිරීම සහිතය.

මින් වඩාත් නිවැරදි ප්‍රකාශ දෙක වන්නේ

A හා B
B හා C
C හා D
A හා D

40. බහුවිධතාවය සඳහා නිවැරදි පිළිතුර වන්නේ

1. "ඔබ වැරදිය. එහෙයින් මා අනුගමනය කරන්න".
2. "ඔබත් වැරදිය. මාත් වැරදිය. අපි එක්ව නිවැරදි වෙමු".
3. "ඔබේ අදහස තරමක් නිවැරදිය. එහෙත් මා සම්පූර්ණයෙන් නිවැරදිය. එබැවින් මම ඔබේ අදහස සම්පූර්න කරමී".
4. "ඔබ නිවැරදිය. එහෙත් මම ඔබ අනුගමනය නොකරමි".

## ක්‍රිස්තු ධර්මය 11 පැය 2යි

1 වන හා 2වන ප්‍රශ්න වලටත් තවත් ප්‍රශ්න 3කටත් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් ප්‍රකාශ අතුරින් 3ක් තෝරා ඒවා කවුරුන් විසින්, කා හට කුමන අවස්ථාවක පවසනු ලැබුවේදැයි දක්වා එම අවස්ථාවට වදන් වල වැදගත් කමත්, එයින් අපට උගත හැකි පාඩමත් ලියන්න.
    1. "නාඳුනන දෙවියන්ට්ය" යන පූජාසනයක් මම දිටිමි. ඔබ නොදැන නමස්කාර කරන ඒ දෙවියන් මම ඔබට ප්‍රකාශ කරමි.
    2. "මම නැතිවූ බැටළුවා සොයන්නෙමි. මුළාව ගිය බැටළුවා ආපසු ගෙනෙන්නෙමි".
    3. "ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වන්නාහුය".
    4. "ඔව්හු තමන්ගේ කඩුවලින් නගුල් තල ද, හෙල්ල වලින් දෑකැති ද තළා ගන්නෝය".

3 x 5 ලකුණු 15

2. පහත සඳහන් මාතෘකා අතරින් 3ක් තෝරා ලුහුඩු සටහන් ලියන්න. සපයා ඇති සැකිල්ල අනුව පිළිතුර ගොඩ නගන්න.
    1. පාවුල් තුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාව
        - මෙතුමා ධර්මදූත සේවයට යැවීමට තීරණය කළ අන්දම
        - පාවුල් තුමාට සහාය වූ දෙදෙනා
        - ලූස්ත්‍රාවේදී වූ සිදුවීම
        - ජනතාව හා පාවුල් ඊට දැක්වූ ප්‍රතිචාරය
        - ඉන් අපට ලැබෙන පණිවිඩය
    2. යුක්තිය පදනම් කරගත් සාමය
        - සාමය පිළිබඳ විවිධ නිර්වචන
        - ප්‍රචණ්ඩත්වය තුළින් සාමය ලබාගත නොහැකි බව
        - දිව්‍යසිවරු සාමය පිළිබඳව පැවසූ දේ
        - වර්තමාන ශ්‍රී ලංකාවේ සාම ප්‍රයත්න
        - සාමය සඳහා කළ යුතු දෑ
    3. මුල් කිතුනු සභාව
        - ආරම්භ වූ අයුරු
        - ප්‍රේරිතයන්ගේ මෙහෙවර
        - මුල් කිතුනු සභාවේ පැවති යහපත් වටිනාකම්
        - ඇතැම් වටිනාකම් අද දක්නට නොලැබීමට හේතු
        - අද සභාවට මෙම වටිනාකම් අනුගත කරගත යුතු ආකාරය
    4. සමාජයක් ලෙස ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වීම
        - වර්තමාන සමාජය ආකල්පමය වශයෙන් පරිහානිය කරා ළඟාවන බව
        - සාධාරණ යුක්තිගරුක සමාජයක පැවතිය යුතු ලක්ෂණ
        - සමාජය පරිවර්තනය විය යුතු බව
        - වර්තමානයේ ඔබගේ සමාජ මෙහෙවර
        - එහිදී මුහුණු දීමට සිදුවන අභියෝග

3 x 5 ලකුණු 15

3. 1. ඉශ්‍රායෙල්වරුන්ගේ මෙසියානික බලාපොරොත්තුව හා පූර්ණ විමුක්තිය යන්න පැහැදිලි කරන්න.
ලකුණු 3

2. වර්තමාන සමාජයේ දක්නට ලැබෙන දේශපාලන, ආර්ථික හා සමාජයීය වහල් භාවයන් කවරේද? ලකුණු 3

3. ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් තුළින් වහල් භාවයන් පිටු දැක පූර්ණ විමුක්තිය ලබාගන්නේ කෙසේදැයි සවිස්තරාත්මකව විග්‍රහ කරන්න.
ලකුණු 4

4. 1. කිතුනු මෑත ඉතිහාසයේ පීඩනයට ලක්වූවන් 3 දෙනෙකු හඳුනාගෙන, ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ජීවත්වූ අන්දම ඉදිරිපත් කරන්න.
ලකුණු 3

2. වර්තමාන ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් හිංසාවට හා පීඩාවට පත් කිරීමට ලක්වෙති. ඔබ මේ අදහස පිළිගන්නෙහි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
ලකුණු 3

3. ඔබගේ පාසලේ හෝ පංතියේ සිටින හිංසනයට හා පීඩාවට පත් වූ ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවකගේ ජීවිතය ගොඩ නගා ගැනීමට ඔබ උදව් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
ලකුණු 4

5. 1. සාමකාමී සහජීවනය යන්න නිර්වචනය කරන්න. ලකුණු 3

2. ජේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයින් සාමකාමී සහජීවනය සඳහා ක්‍රියා කළේ කෙසේදැයි නිදසුන් ආශ්‍රයෙන් දක්වන්න. ලකුණු 3

3. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන ඔබ වර්තමාන බහුවිධ සමාජය තුළ අන්‍යයන් හා සහයෝගයෙන් ජීවත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. ලකුණු 4

6. 1. සමාව දීමටත්, සමාව ඉල්ලීමටත් අප සතු විය යුතු යහපත් සාරධර්ම කවරේද?
ලකුණු 3

2. සමාව පිළිබඳ ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් හා ජීවිතාදර්ශය අතර පවතින සම්බන්ධතාවය කෙබඳුද? ලකුණු 3

3. ඔබගේ අදහස අනුව ශ්‍රී ලංකාවේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සුදුසුද? නුසුදුසුද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. ලකුණු 4